ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2023 මාර්තු 01 වන බදාදා
3 කාණ්ඩය 13 කලාපය
මිල රු. 80 යි



පිං වැඩෙන විදියට
සාංඝික දානයක්
දෙන්නේ කොහොමද?

විශේෂ අතිරේකයක් නොමිලේ

ලැම පමණක් පෙනෙන ලය නොපෙනෙන පියුමි හංසමාලි

ධරණීට කී කතාව

ඇමතිගේ පෙම්වතිය ඝාතනය කර ඇමති බිරිඳ පෝරකයට ගිය හැටි

දහය වසරේ දුවෙක්ට බබෙක් හම්බවෙන්න ගිහින් පාසලේ විදුහල්පතිනියට දිවි අහිමි වෙලාවෙලා

පත්තිනි මෑණියනේ.. නවගමුව දේවාලේ කපුවන්ට පන්තියක් පවත්වනු මැනේ

සංජනා ගමගේ

ඡායාරූප - මධුසංඛ සිරිවර්ධන
පසුතලය - අම්බලන්තොට ඩිපෝව

දැන්වීමකි

ඔබේ දරු සිහිනය සැබෑ කරවන ලොව පිළිගත් ප්‍රතිකර්ම පහසු මිල ගනන් යටතේ, දැන් WISH FERTILITY ප්‍රතිකාර මධ්‍යස්ථානයෙන්...!

දරුවන් කියන්නේ අපගේ ප්‍රාණයයි. අපගේ ජීවිතේ අපේක්ෂාවයි. අපේ අනාගතයයි. නමුත් එම ජීවිත අපේක්ෂාව භුක්ති විඳීමට නොහැකි බහුතරයක පිරිසක් අප සමාජය තුළ සිටින බව අප සැවොම දන්නා කරුණක්. ජීවිතයේ අනේක වූ කැපකිරීම් කරමින්, ආදරය දිනා ගනිමින් අපේක්ෂාවන් පොදිබැඳ ගනිමින් විවාහ ජීවිතයට පිවිසෙන ඇතැම් පෙම්වතුන් මෙම ගැටලුව හේතුවෙන් පීඩාවට පත්වන අයුරු වගේම ඉතා ඛේදනීය අයුරින් සිය විවාහ ජීවිතයට සමුදෙන ආකාරය අප සැවොම අත්විඳ ඇත.
මෙවැනි පිරිස් සඳහා සුභ පණිවිඩයක් ගෙන එමින්, ඔවුනගේ අපේක්ෂාවන් නැවත දැල්වීම අපගේ මූලික අරමුණයි.

රෝහලක් නොවන රෝහලක අත්දැකීම ඔබට දැන් Wish Fertility Hospital වෙතින්...

මඳසරුභව කියන්නේ කුමක්ද?

මෙම ප්‍රශ්නය අසද්දීම බොහෝ දෙනකුට මඳසරුබව කියන්නේ ලෙඩක්? මේක උප්පත්තියෙන්ම ඇතිවන තත්ත්වයක්?

ආදී වශයෙන් සෘණාත්මක අදහසක් තමයි ඇතිවෙන්නෙ. නමුත් මෙම තත්වය සම්බන්ධයෙන් අදහස් දක්වමින් මහරගම විෂ් මඳසරු රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය හෙළරුවන් පහන් කුමාර මහතා ප්‍රකාශ කර සිටියේ මඳසරුභාවය කියන්නේ රෝගී තත්ත්වයක් නොවන බවයි. එහෙනම් මේ තත්ත්වය කුමක්ද? බොහෝ විට අපේ මානසික ක්‍රියාකාරිත්වය නිසා ඇතිවන තත්ත්වයක් විදිහට තමයි මේ මඳසරුබව කියන තත්ත්වයට අපව පත්වන්නේ.

මඳසරුභව කියන්නේ අපේ ජීවිත කාලය තුළ පවතින්නක්ද?

සාමාන්‍යයෙන් පසක් වුණත් නිසරු වන කාලයක් එනවා. ඒක විවිධ හේතූන් නිසා සිදුවෙන්න පුළුවන්. නමුත් ඒ සඳහා අවශ්‍ය පොහොර ආදිය යෙදීමෙන් අපිට නැවතත් එම පසෙන්ම සරු ඵලදාවක් නිර්මාණය කර ගැනීමට හැකිවෙන බව අපි අත්දැකීමෙන්ම දන්නා දෙයක්. ඒ වගේ තමයි මඳසරුබව කියන්නේ. විවිධ

හේතූන් නිසා අපේ ශරීරයේ සිදුවන වෙනස්වීම් නිසා ඇතිවන මෙම තත්ත්වය නිවැරදි උපදේශනය, මගපෙන්වීම සහ ක්‍රමවේද ඔස්සේ නැවත ප්‍රකෘති තත්ත්වයට ගෙනඒමේ හැකියාව පවතිනවා. මේ සඳහා මූලික වශයෙන් අවශ්‍ය වන්නේ ඔබ නැවරදි ස්ථානය කරා යොමුවීම පමණි.

Wish Fertility Hospital කියන්නේ කුමක්ද?

ලංකාවේ පමණක් නොවේ ආසියාවේම මඳසරුභාවය සඳහා ප්‍රතිකාර කිරීමට ඉදිකර ඇති විශාලතම රෝහල නැත්නම් ප්‍රතිකාර මධ්‍යස්ථානය තමයි Wish Fertility Hospital කියන්නෙ. වර්ග අඩි 65,000ක භූමියක ඉදිකර ඇති මේ රෝහල තට්ටු හතකින් සමන්විත වෙනවා වගේම මඳසරුභාවය සඳහා වන දැනට ලෝකයේ ක්‍රියාත්මක වන ප්‍රතිකාර ක්‍රම සියල්ලක්ම මෙම මධ්‍යස්ථානයේ සිදුකිරීමත් සුවිශේෂී කරුණකි. මෙයට අමතරව වර්ග අඩි 18,000ක විශාලත්වයකින් යුතු ශල්‍යාගාර සංකීර්ණයකින්ද සමන්විත මෙය ආසියාවේ ඇති විශාල IVF ශල්‍යාගාර සංකීර්ණය වන අතර අතර මෙහි පළපුරුදු මෙන්ම පුහුණුව ලත් කලල විශේෂඥයන් රැසකගෙන් සමන්විත වීමද තවත් සුවිශේෂ කරුණකි.

''අද වෙනකොට දරුවන් නොමැති කමින් විශාල පිරිසක් වේදනාවට පත්වෙනවා මම අත්දැකලා තිබෙනවා. වගේම ඒ ගැටලු නිසා තමන්ගේ ජීවිතය පවා විනාශ කර ගැනීමට ඔවුන් යොමුවෙනවා. මේ තත්ත්වය ඇත්තටම ඇති නොවිය යුතු තත්ත්වයක්. මොකද මම එහෙම කියන්නේ මේක ඉතා පහසුවෙන් විසඳාගැනීමේ හැකියාව ලෝකයේ පවතින නිසා. නමුත් අවාසනාවකට අපේ සමාජයේ බොහෝ දෙනකුට මේ සම්බන්ධයෙන් අවබෝධයක් ඇත්තේ නැහැ. මේ නිසා මේ තත්ත්වය පවුල සහ සමාජය තුළ බැරෑරුම් තත්වයක් ඇතිකර තිබෙනවා. මේ තත්ත්වය වෙනස් කිරීමේ අවශ්‍යතාවය මට දීර්ඝ කාලයක් පුරා තිබුනා. ඒ වෙනුවෙන් මම විවිධ කාර්යයන් කළා. එහි තවත් එක ප්‍රතිඵලයක් විදිහට තමයි මම මඳසරුභාවය වෙනුවෙන් ප්‍රතිකාර කිරීම සඳහා Wish Fertility Hospital එක නිර්මාණය කිරීමට යොමුවුණේ ''යනුවෙන් රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය හෙළරුවන් පහන් කුමාර මහතා මෙම විශ්මිත ප්‍රතිකාර මධ්‍යස්ථානය නිර්මාණය කිරීමේ අරමුණ අප සමග ප්‍රකාශ කළේය.

Wish ප්‍රතිකාර මධ්‍යස්ථානයේ විශේෂත්වය



Wish Fertility Hospital (PVT)Ltd

රෝහලකට එහා ගිය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් විදිහට තමයි අපට මෙම Wish ප්‍රතිකාර මධ්‍යස්ථානය දැක්විය හැකිය. මෙහිදී මූලික වශයෙන් පැමිණෙන අයගේ මානසික තත්ත්වය සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරමින් මෙම මධ්‍යස්ථානය පවා ඉදිකර තිබීම විශේෂත්වයකි. මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් වෛද්‍ය හෙළරුවන් පහන් කුමාර මහතා ප්‍රකාශ කර සිටියේ, ''අපේ ආයතනයට පැමිණෙන හැමදෙනාම වගේ මානසික පීඩනයකට ලක්වෙලා තමයි එන්නේ. එතනදී මට අවශ්‍ය වුණේ අපේ ආයතනයට ඇතුළුවීමේදී ම ඔවුන්ගේ එම මානසික තත්ත්වය වෙනස් කිරීමටයි. එතනදී මම Wish ප්‍රතිකාර මධ්‍යස්ථානයට ඇතුළු වීමේදී තරු පන්තියේ හෝටලයකට ඇතුළුවීමේදී අත්වන අත්දැකීමක් ඔවුන්ට ලබාදෙන්න තීරණය කළා. එතනදී ඇතිවන ආකර්ෂණයක් එක්ක ඔවුනගේ මානසික තත්වය වෙනස් වීමකට වගේම ප්‍රතිකාර මධ්‍යස්ථානයකට

‘තාත්තා කෝල්’ කිය කියා දුව තාමත් ගේ පුරා තාත්තාව හොයනවා

හෙල්මට් ප්‍රහාරයෙන් මියගිය රංග විරාජ්ගේ බිරිඳ කියන කතාව

ජූසුගියද තරුණයන් තිදෙනෙකු විසින් හෙල්මට්වලින් ගසා මරා දැමූ රංග විරාජ් ජයසිංහ ලස්සන හදවතක් හිමි තරුණයෙකු බව ඔහු ළඟින් ඇසුරු කළ බොහෝදෙනා දැන සිටියෝය. කිසිවකුගේ වරදක් දකින්නට මෙන්ම කිසිවකුට නරකක්, නපුරක් වනවාට අකමැති වූ ඔහුට ආදරවන්තයින්ගේ දිනයදම අවාසනාවන්ත ලෙස ජීවිතයට සමුදෙන්නට සිදුවිය. ඒ මෝටර් බයික් පදිනවිට හෙල්මට් පැළඳ පාරේ හෙමින් යන්නැයි ඔහු කළ අවවාදය නොරිස්සූ පාසල් සිසුන් තිදෙනෙක් නිසාය. වේගයෙන් යතුරුපැදිවලින් යමින්, තමාටද වෙට්ටුවක් දමමින් ඉගිල්ලුණ කොල්ලන්ට දුන් අවවාදය මෙසේ විසවනු ඇතැයි ඔහු කිසිසේත් සිතන්නට නැතුවා විය හැකිය. ඒ ඔවුන් තමාද දන්නා හඳුනන තම බිරිඳ සංගීත විෂය උගන්වන පාසලේම දරුවන් වූ නිසාය.

හොඳක් කරන්නට ගියත් ඒවා නුහුරට පෙරළෙන අවස්ථා තිබේ. දරුවන්ගේ තිබිය යුතු මෘදු මොළොක් බව, අවවාදයකට ඇහුම්කම් දීමේ නිහතමානීබව, ගැටලුවක් සාකච්ඡාකොට නිරාකරණය කරගැනීමේ හැකියාව ඒ දරුවන්ට තිබුණානම් මාස එකොළහක් වන සුරතල් දූ සිඟිත්තියකට තම ආදරණීය ‘තාත්තා’ අහිමි නොවන්නට ඉඩ තිබිණි. ආදරණීය බිරිඳ දිල්කි පහන්තිහගේටද තම ආදරණීය සැමියා අහිමි නොවන්නට තිබිණි.

“එදා දවසේ කවදාවත් නොවෙන දේවල් කිහිපයක් සිද්ධවුණා. එදා මම ඉස්කෝලෙට ගිය නිසා එයා දවල් මාව ගන්න දුව එක්කම ඉස්කෝලේ ළඟට ආවා. තාත්තගේ තුන්මාසේ දනේ යෙදිලා තිබුණේ පෙබරවාරි විසිවෙනිදට නිසා දැනෙට ඕන කරන පිරිකර ඇතුළු බඩු වගයක් ගන්න තිබුණා. ඒ නිසා එයා කාර් එකෙන් ඇවිත් තිබුණේ. ඉන්පස්සේ අපි අලුත්ගම ටවුමට ආවා. ඕන කරන දේවල් අරගෙන එයා රට යන්න බලාපොරොත්තුවෙන් හිටිය නිසා ඊට ඕන කරන ෆොටෝත් අරගෙන ගෙදර ආවා. ඒ ඇවිත් පුරුදු විදියට කාලය ගෙවුණා. ඔය අතරේ මගේ යාළුවෙක් කතා කළා. එයා කිව්වා අයියා අද වැලන්ටයින් දවස නිසා හොඳටම රොමෑන්ටික් වෙලා නේද, එෆ්. බී. පෝස්ට් එකකුත් දාලා තියනවා දැක්කා කියලා. ඇත්තටම මම එහෙම එකක් දැනගෙන හිටියෙ නෑ. පස්සෙ තමයි දැක්කෙ,

‘රෝසමල් නෑ

චොක්ලට් නෑ

Surprise නෑ

වගකීමෙන් කියන්නේ, මේ ගෙවෙන තත්පරෙත් ආදරෙයි’

කියලා එයා ෆේස්බුක් එකේ මං වෙනුවෙන් ලියලා තිබුණා. අපි හමුවෙලා ආදරය කරන්න පටන් අරගෙන අවුරුදු නවයක් වෙනවා. එයාව මට මුණගැහුනේ කැම්පස් කාලේ කොළඹදී. එතකොට ඔහු පෞද්ගලික ආයතනයක රැකියාවක් කරනවා. ආදරේ කරන කාලෙදි මගේ උපන්දිනයකටවත් එයා එහෙම පෝස්ට් එකක් දලා නෑ. ගෙදර ඉන්න කෙනාට ළඟ ඉඳන් ආදරේ කියන්න පුළුවන්කම තියෙද්දී ඕවා ෆේස්බුක් දන්න ඕනද කියලා තමයි ඒ ගැන ඇහුවොත් කියන්නේ. ඇත්තටම ඔහු බොහොම ආදරණීයයි. බොහොම නිවුණු කෙනෙක්. මං වචන සීයක් කතා කළොත් එයා කතා කරන්නේ වචන දෙක තුනයි. ඒත් ඕනම වෙලාවක ඕනම කෙනෙකුගේ දුකකට කරදරයකට ඔහු උදව් කරන්නේ හදවතින්මයි.”

ඒ හදවත හිමි ආදරණීයයා දැන් දිල්කිගෙන් බොහෝ ඈතකය. වැලිපැන්න ගල්මත්ත, කුරුදිප්පිට ගමේ පදිංචි රංග එදා සවස හයට පමණ ගල්මත්ත කඩමණ්ඩියට යාමට පිටත්වුණේ රෑට කන්නට පාන් ගෙනෙන්නටය.

“ගෙදර ඉඳලා කිලෝමීටර් එකහමාරක් වගේ දුරක් තමයි හන්දියට තියෙන්නේ. එයා ගිහින් විනාඩි පහකින් වගේ මං එයාට කෝල් එකක් ගත්තා. ඒ මගේ යාළුවෙක් බඩු වගයක් අරන් හන්දියට එනවා, ඒ ටිකත් අරන් එන්න කියලා කියන්න. දෙවන වතාවට කෝල් කරත් මහත්තයා කෝල් එක ආන්සර් කළේ නෑ. ඒ පාර මං දන්න නංගි කෙනෙක් එක්ක එයාගේ බයික් එකෙන් පාරට ආවා. ඒ ආවේ ගෙදර ඇඳන් හිටපු ඇඳුම පිටින්. වෙනදට මම කවදාවත් එහෙම යන්නේ නැහැ. හරිම ඉක්මනට මම ඒ තීරණේ ගත්තේ. පාරේ ටික දුරක් යද්දි, ඉස්කෝලේ ළමයි කිහිපදෙනෙක් පාරේ තැනක ඉන්නවා දැක්කා. මම මං එක්ක ගිය නංගිට කිව්වා, ගෙදර ඇඳන් හිටි ඇඳුම පිටින් ඉන්නේ, අතන ඉස්කෝලේ ළමයිනුත් ඉන්නවා ආපහු යන් කියලා. ඒ එක්කම මං දැක්කා පාරේ වටවෙලා හිටිය අයගේ කකුල් අතරින් කෙනෙක් පාරේ වැටිලා ඉන්නවා. මාව දැකපු එතන හිටි කෙනෙක් කිව්වා ‘කවුද විස්තරේ කිව්වේ, ඉක්මනින් අයියව හොස්පිට්ල් ගෙනියන්න’ කියලා.”

දිල්කිගේ හදවත නතරවුණා වැනිය. ඒ වැටී සිටින්නේ තම ආදරණීය සැමියා බව ඇය දුටුවේ විවිටය. තමාට ඔහුට අනතුරක් බව කිසිවකු නොකිව්වත්, කුමක්දෝ හේතුවකට ඇය ඒ අසළට පැමිණ සිටියාය.

“ඇත්තටම ඒ තත්පර කිහිපය විස්තර කරන්න හරිම අමාරුයි. එයා අමාරුවෙන් හිටියේ. මම ඉක්මනට එතැන හිටි අයගේ උදව්වෙන් එයාව වාහනේකට දාගෙන අලුත්ගම රෝහලට ගෙනාවා. ඒ අතරමගදි එයා හුස්මගත්තේ අමාරුවෙන්. වෙට්ටුවක් දලා ගිය නිසා ළමයින්ට අවවාද කරා, එයාලා හෙල්මට්වලින් ගැහුවා කියලත් කිව්වා. ඒ ළමයින්ගේ තාත්තලගේ නම් කිව්වා. එහෙම විනාඩියක් දෙකක් කතා කරමින් හිටිය මහත්තයා එකපාරටම කඩා වැටුණා වගේ වුණා. මම හිතුවේ සිහි නැතිවුණා කියලයි. ඒත් එයා ආයෙ ඇස් ඇරියේම නෑ.”

ඔහු හිටියේ රට රැකියාවකට යන්න. ජීවිතයක වටිනාකම නොදන්න අය ඔහුව අපිට අහිමි කළා

ගෙවෙන තත්පරයේත් ආදරේ යැයි කිව් ඔහුට ඒ අවසන් තත්පරයේදීත් දිල්කිගේ ආදරය ලැබිණි. ඔහු දෑස් පියාගත්තේ ඈ අත අල්ලාගෙනය. මිනිසත්කම ගැන, මිනිසුන්ගේ සංවේදීකම ගැන ඇති හිඩැස ගැන ලොවටම හිතන්නට යමක් ඉතිරිකර ඔහු රෝහලට ගෙනයන අතරතුරම දෑස් පියාගත්තේය. නමුත් ඔහුගේ සිඟිති දියණිය තාත්තා එනතුරු තවමත් මඟ බලා හිඳින්නීය. ඇය “තාත්තා කෝල්” කියමින් ගේ පුරා දිවයන්නේ තවමත් මේ කිසිවක් නොදැනය.

“දුවගේ උපන්දිනය ගැනත් එයා නිතරම කතා කළා. දුව ළඟට වෙලා ඉන්න එයා කැමතියි වගේම දුව මටත් වඩා එකතු තාත්තට. දුව ගැන, එයාගේ අනාගතය ගැන ගොඩක් හීන ඒ හිතේ තිබුණා. ඔවුන් මේ විදියට උදුරගත්තේ බොහොම සාමකාමීව හැමදෙනාටම උදව් කරගෙන හිටපු කෙනෙක්. ගුරුවරියක් විදියට මම වගකීම් සහගතව කටයුතු කළා. මළගෙදර කටයුතුත් බොහොම සාමකාමීව සිදුකළා. ඇත්තටම මේ සිද්ධියට සම්බන්ධ දරුවන්ගේ දෙමාපියන් අපිට පොලිසියේදී මුහුණට හමුවුණා. ජීවිතයක් අහිමිවෙලා තියෙද්දිත් ඒ ගැන කම්පනයක් දුකක් එයාලා තුළින් මම දැක්කේ නැහැ. නීතිය කොහොම වුණත් මම සොබාදහම දිහා බලන් ඉන්නවා.”

බයික් අපේ නම්, ළමයිනුත් අපේනම්, අපේ ළමයින්ට අවවාද දෙන්නට පිට මිනිසුන් උවමනා නැතැයි කියා කියන, එසේ සිතන දෙමාපියන් ඒ දරුවන්ට කරන්නේ හොඳක්ද, නරකක්දැයි සිතීම ඔබට බාරය. ගෙදර වාගේම පාසල, දහම්පාසල තුළින් ආයුතු විනය, හික්මීම, කරුණාව, දයාව, සංවේදීකම ආදිය මඟින් පිරිපුන් දරුවෙකු රටට දායාද කරන්නේය.

රංග විරාජ්ගේ ඝාතනයට පොලිස් භාරයට ගත් 16 හැවිරිදි සැකකරුවන් තිදෙනා මතුගම මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පෙබරවාරි 28 වනදා දක්වා මාකොළ රැඳවුම් නිවාසයේ රඳවා තබන්නට නියෝග කෙරිණි.

පියාගේ තුන්මාසේ දානමය පිංකම යෙදුණු පෙබරවාරි මාසයේ විසිවැනිදා රංග විරාජ්ගේ සත් දවසේ දානමය පින්කමත් යෙදිනි. දෙවය එවැන්නකි. එහෙත් හයක් හතරක් නොදන්නා පුංචි දූ සිඟිත්තිය “තාත්තා කෝල්” කියද්දී ඔහුට සිදුවූ දේ ඇයට පහදා දෙන්නට දිල්කි පහන්තිහගේට තවත් බොහෝ කලක් බලා හිඳින්නට සිදුවනු ඇත.

■ දීපා වසන්ති එදිරිසිංහ

අත්තනායක
එම්. හේරත්

රත්නරන් දුවේ

බබෙක් හම්බවෙන්න ගියපු දුවෙක් නිසා පාසලේ විදුහල්පතිනියට ජීවිතයෙන් සමුගන්න වුණා

ලට අද මං කියන්න යන්නේ අපේ දුවක් කරගත්ත විනාශයක් ගැන කතාවක්. මම ඒ සිද්ධිය වුණේ මොන පළාතේද කියන එක නොකියා සිද්ධිය විතරක් කියන්නම්.

එක්තරා විද්‍යාලයක 10 වසරේ ඉගෙනගනිපු දුවක් හිටියා. ඒ දුවගේ දෙමව්පියෝ දරුවව චරිත්‍රෙට ඉස්කෝලේ එව්වා මිසක් අධ්‍යාපනයේ වැදගත්කම ගැන හිතලා ඉස්කෝලේ එව්වේ නැහැ. ආණ්ඩුවෙන් පොතුයි රෙදියි නිකන් දුන්න හින්ද ඇය ඉස්කෝලේ ආවේ විනෝදය පිණිස. ගෙදරින් ඒ දුවට අසීමිත නිදහසක් ලැබිලා තිබුණා. එයා ගැන සොයන්න බලන්න කවුරුවත් හිටියේ නැහැ. ඇගේ අතේ ඉස්තරම්ම වර්ගයේ ස්මාර්ට් ජංගම දුරකතනයකුත් තිබුණා. ඒක ලැබුණේ කොහොමද, කවුද අරන් දුන්නේ කියලා කිසි කෙනෙක් ඇහුවේ නැහැ. දෙමව්පියෝ ඒ ගැන ආඩම්බර වුණා මිසක් ඒ ගැන විපරම් කළේ නැහැ. සමහරවිට ඒ අය හිතාගෙන ඉන්න ඇති රෙදියි, පොතුයි දෙනවා වගේ දුරකතනත් ආණ්ඩුවෙන්ම දෙනවා කියලා. නැත්නම් 'ඕක උඹට කොහෙන්ද ලැබුණේ?' කියලා අහන්න එපැයි. කාමරේ දොර වහගෙන එළිවෙනකල් දුරකතනය අතේ තියාගෙන ඇය කරපු කිසිම දෙයක් දෙමාපියෝ දැනගෙන හිටියේ නැහැ. ඒ ගොල්ල හිතුවේ දුව අධ්‍යාපනයට දැඩිව නැඹුරුව ඒ මත්තෙම නැහෙනවා කියලා.

ඔහොම කාලයක් ගියා. ටිකක් කල් යද්දී ඇය පංතියේ යාළුවෝ එක්ක නිතර කතා කරන්න ගත්තේ අඹුසැමි සම්බන්ධතා ගැන. ඒකටම ගැළපෙන තවත් අයත් මේ පංතියේ හිටියා. ඒ අයගෙනුත් මෙයාගේ වැඩවලට ලොකු දිරිගැන්වීමක් ලැබුණා. ඒ වගේම මේ දුවට පිරිමි යාළුවෝ කිහිපදෙනෙකුත් හිටියා. ඒ අය දැනගෙන හිටියා මේ ළමයා ඕන තැනකට අරගෙන යන්න පුළුවන් කියලා. ඒකෙන් ප්‍රයෝජන ගත්තු මේ පිරිමි ළමයි මේ දැරිව්ව හෝටල් කාමරවලට අරගෙන ගියා. මුලදි අකමැත්තෙන් වගේ ගියත් පහුවෙනකොට මේ ළමයගෙන් බේරෙන්න කොල්ලන්ටත් අමාරු වුණා. ඇයට ජංගම දුරකතනය අරන් දීලා තිබුණෙත් ඒ තරුණයන්ගෙන් එක් කෙනෙක්. ඇය සමඟ රවුමේ යන තරුණයන් සියල්ලම පාහේ මුහුණුපොතෙන් එකතු කරගත් අය නිසා ඒ එක එක්කෙනාට හොරෙන් මේ සෙල්ලම කරගෙන යන්න එයාට පහසු වුණා. සතිඅන්තවල අමතර පන්තිවලට යන බව කියමින් ගෙදරින් ගියපු මේ දුවගේ දින ගෙවුණේ අවට නගරවල තිබුණු ලැගුම්හල්වල.

අඩුතරමේ ඔය යන පංතිවල පංති ගාස්තු ගෙවන්නේ කොහොමද, බස් එකට සල්ලි තියෙනවද කියලවත් මේ දුවගේ අම්මා තාත්තා කවදාවත් ඇහුවේ නෑ. ඒ ළමයා ගෙදරින් ඒවාට සල්ලි ඉල්ලුවෙත් නෑ. ඒ දුවගේ ගෙදර තව නංගිලා දෙන්නෙකුත් මල්ලියෙකුත් හිටියා. තාත්තා කළේ ගොවිතැන් වැඩ. කාලය ඔහොම ගෙවිලා ගියා. ඇගේ මේ අහිරහස් ජීවිතය තවදුරටත් හංගගෙන ඉන්න ඇයට ඕන වුණේ නැහැ. ඇය පංතියේ මිතුරියන් එක්ක ඇගේ හපන්කම් එකින් එක කියන්න ගත්තා. ඒ අයත් ඒවා ආශාවෙන් අහගෙන හිටියා. එක දවසක් එයා යාළු දැරියකට කියනවා මගේ බඩේ බබෙක් හැදෙනවා වගේ දැනෙනවා කියලා. ඒ දැරිය මේ රහස කනෙන් කනට යැව්වා. අන්තිමේ මුළු ඉස්කෝලෙම මේ රහස දැනගත්තා. ගුරුවරුන් අතරටත් ඒක ගියා. විදුහල්පතිනියට මේක ආරංචි වුණා. ඇය මේ දුවව කැඳවලා අම්මට එන්න කියලා පණිවිඩයක් යැව්වා. ඒ වගේම විදුහල්පතිනිය සියලු ගුරුවරු කැඳවලා මේ ගැන එයාලගෙ අදහස මොකක්ද කියලා ඇහුවා. සියලුම ගුරුවරු එකහඬින්ම කියාසිටියේ අම්මටත් දන්වා සතියකට පමණ ඇයට පාසල් ඒමට තහනමක් පනවන ලෙසයි. ළමයින්ගේ ප්‍රශ්න දිහා කරුණාවෙන් බලන විදුහල්පතිනිය ඇගේ අම්මා කැඳවා ඇයට මේ සිදුවීම දන්වලා ටික දවසකට දුව ගෙදර තබාගන්නා ලෙසත් දුව වෛද්‍යවරයෙකුට පෙන්වන ලෙසත් දැනුම් දුන්නා. අම්මා දුවත් රැගෙන ගෙදර ගියා. අම්මා එයාව වෛද්‍යවරයෙකුට පෙන්නුවා. ඇය ගැබිනියක් නොවන බව වෛද්‍යවරයා සහතික කළා. තමන් යාළුවන්ට විහිළුවට කී දෙයක් ඒ අය බොරුවට විදුහල්පතිනියට වාර්තා කළ බවයි ඇය අම්මට කිව්වේ.

තම දුව ගැබිනියක නොවන බව කියා විදුහල්පතිනිය ලවා යළි දුව පාසලට දැන්න අම්මා තීරණය කළා. විදුහල්පතිනිය ඇයට කියලා තිබුණෙත් එහෙමයි. ඊළඟ සඳුදු විදුහල්පතිනිය හමුවී තත්ත්වය වාර්තා කිරීමට අම්මා කල්පනා කළා. හැබැයි ඊට කලින් ප්‍රාදේශීය පුවත්පත් වාර්තාකාර මහත්මයෙකුට මේ පුවත ආරංචි වුණා. ඔහු සිද්ධිය ගැන කිසිවක් නොදැන සිසුවිය තාවකාලිකව පංති තහනමකට ලක්ව ඇති බව තමන්ගේ පුවත්පතට වාර්තා කළා. ඊටපස්සේ ඒක සියලුම රූපවාහිනී නාළිකාවල පළවුණා. මේ ආරංචිය එවකට සිටි අධ්‍යාපන ඇමතිවරයාටත් වාර්තා වුණා. ඔහු වහාම දැරිය එක්තරා ජාතික පාසලකට මාරු කරන්න කටයුතු කළා.

ඒක ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්වුණු අයට යන්න පුළුවන් පාසලක්. ඒ නිසා ශිෂ්‍යත්වයක් නැතිව එවැනි පාසලකට යාමට ලැබීම ඒ දුවට වාසනාවක් වුණා. නමුත් කලින් පාසලේ විදුහල්පතිනිය වැඩ තහනමට ලක්වුණා. මොකද මේ සිදුවීම ගැන තීරණ ගන්න කලින් විදුහල්පතිනිය කලාප කාර්යාලයෙන් අවසර ගත යුතුව තිබුණා. ඇය හිතුවේ නැහැ මේක මේ තරම් බරපතළ ප්‍රශ්නයක් වේවි කියලා. ගුරුතුමිය සතියකට දැරියගේ පංති තහනම් කළේ ඒ දුවගේ යහපතට. අනෙක් සිසුන් ඇයට අපහාස කරන නිසා. කොහොමින් කොහොමහරි විදුහල්පතිනිය ගෙදර නැවතී මාසයක් ගියේ නැහැ ඒ පීඩනය දරාගත නොහැකිව ඇය ජීවිතයෙන් සමුගත්තා.

අර තරම් හොඳ පාසලකට යන්න අවස්ථාව ලැබුණත් දුවේ, කැලය මාරු වුණාට කොටියාගේ පුල්ලි මාරු වුණේ නැහැ. ඒ කියන්නේ පාසැල මාරු වුණාට මේ දුවගේ චර්යාවල වෙනසක් වූයේ නැහැ. ඒ පාසලටත් මේ සිදුවීම ආරංචි වුණා. දුව ගැන දැනගත් ඒ විදුහලේ ළමයින් ඇයව කොන් කළා. මේ දැරිය සුපුරුදු පරිදි තමන් සිදුකළ දේ දිගටම කරගෙන ගියා. අන්තිමට ඇය පාසැල අසල ගැරේජ් එකක වැඩකරපු තරුණයෙක් එක්ක පැනලා ගියා.

ඉතින් දුවේ පාසල් දරුවන් දුරකතන භාවිතා කිරීම නිසා දුවලාට සිදුවෙන විපත ගණනය කිරීමට කිසිම සංඛ්‍යාලේඛනයක් අප ළඟ නැහැ. කාමර නැතිනම් මේ ලැගුම්හල් සංස්කෘතිය අද නගරයෙන් ගම්බදටත් පැතිරිලා. මෙහෙම අයාලේ යන ජීවිතවල අවසානය කුමක්ද? 'ස්පා'ද? තාක්ෂණික ගණිකා වෘත්තියද? ඉතින් දුවේ කල්පනා කරලා මේ ගැන තීරණයක් ගන්න. අවුරුදු 18 වෙනතෙක් මේ දුවලා පුතාලා අයිති රටට. ආණ්ඩුවට. ඒකයි ඊට කලින් විවාහ වුණොත් අත්අඩංගුවට ගන්නේ. දෙමව්පියන්ට ආපසු නොදී පරිවාස භාරයට පත්කරන්නේ.

මම දීපු උදාහරණය ඇරුණම මේ වගේ සිද්ධි මේ රටේ තව ඕනෑතරම් සිද්ධ වෙලා ඇති. බලන්න අර පුවත්පත් වාර්තාකරු දුරදිග නොබලා කරපු ක්‍රියාව නිසා මුළු රටක්ම මේ ඕපදූපය ගැන කතා කරන්න ගත්තා. ඒ ළමයා සියදිවි හානි කරගත්තනම් ඒ වගකීමෙන් මිදෙන්න අම්මට තාත්තාට, පාසලේ ගුරුවරුන්ට විතරක් නෙවෙයි කුණු රසය මතු කරන්න මේ සිද්ධිය මතුකරපු මාධ්‍යයටත් බෑ. ඒ නිසා ජනමාධ්‍ය පෙනී හිටින්න ඕන මේවා ගැන දැනුවත් කරන්න මිසක්, මේ වගේ සිද්ධියක් වුණාම ඒකෙ කුණු රසය මතු කරලා ඕපදූප මවන්න නෙවෙයි. අනික ගෙදරක දෙමව්පියෝ කොච්චර නූගත් වුණත්, කොච්චර ග්‍රාමීය වුණත් දරුවෙකුට දැනමුතුකම් දෙන්න ඒවා බාධක නෙවෙයි. ඒ නිසා දෙමව්පියෝ වගේම ගුරුවරුත් මේ කාරණා හිතට ගන්න. අවස්ථානුකූලව බුද්ධිමත්ව වැඩ කරන්න.

සමහරවිට දහය වසරේ දුවලා ගැන මෙහෙම ලියන එක හොඳ නැහැ කියලා සමහරු කියයි. ගිය සතියේ දහය වසරේ දුවෙකුට බබෙක් හම්බවෙලා තියෙනවා බාත්රූම් එකේදි. අම්මා දැනගෙන ඉඳලා නෑලු බබා හම්බවෙලා ළමයා කෑගහනකල්. අපි ඉන්නේ එහෙම සමාජයක. ඒ නිසයි අපි දිගින් දිගටම කියන්නේ අපේ දුවලා පුතාලට 'ලිංගික අධ්‍යාපනයක්' ලබාදීම ඉක්මන් කරන්න ඕන කියලා.

අත්තනායක එම්. හේරත්

අරලියේ

ඔබටත් වඩා ඔබ ගැන වැඩිපුර

- ඉතිරි කිරීමේ ගිණුම්
- ජංගම ගිණුම්
- ක්‍රෙඩිට් කාඩ් පත්
- ව්‍යාපාරික ණය
- උපදේශන සේවා

*කොන්දේසි සහිතයි

011 744 8888 www.ndbbank.com

A- (lka) Fitch Rating - නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පී.එල්.සී. (PQ. 27), ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයට ලක්වෙන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.
ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන තැන්පතු රක්ෂණ ක්‍රමය යටතේ සෑම තැන්පතුවක්ම රු. 600,000 ක උපරිමයකට යටත්ව රක්ෂණය කර ඇත.

අරලියේ | NDB බැංකුව
අනාගත බැංකුකරණයේ පෙරගමන්කරු

දැවැද්දට බඩු ගොඩක් දෙනවද? භාෂා ගොඩක් දෙනවද?

ඉන්දිකා ප්‍රනාන්දු
මනෝඋපදේශිකා
සමාජ විද්‍යා ග්‍රන්ථ කතුවරි

ඒ කාලෙදි මම හිතින් හිටියේ ජර්මනියේ. ඒ රටට ආදරේ කළා. සංස්කෘතිය ගැන හෙව්වා. ඒ අයගේ සිංදු, ටෙලිඩ්‍රාමා බැලුවා. ඉතින් හිතුවටත් වඩා අඩු කාලෙකින් මම ජර්මානු භාෂාව ඉගෙනගත්තා

අද මාතෘකාවට පූර්විකා කරගන්නේ කාලයක් මාත් එක්ක වැඩ කරපු කාන්තාවකගේ කතාවක්. ඇය අපේ කාර්යාලයට එකතුවුණේ කම්කරු සේවිකාවක් විදියට. රැකියා සම්බන්ධ අපේ මිනිස්සුන්ගේ ආකල්ප බොහොම පටුයිනේ. ඉතින් කම්කරු සේවිකාවක් විදියට ඇය නිතරම ඇනුම්බැනුම්, ගැරහුම්වලට ලක්වුණා.

ඒ කොහොම වෙතත් මේ කාන්තාවට ඉංග්‍රීසි ඉගෙනගන්න ලොකු උනන්දුවක් තිබුණා. වැඩ නැති වෙලාවලට වුණත් ඇය නිකන් හිටියේ නැහැ. අකුරු පාඩම් කරනවා, භාෂාවට ඇහුම්කන් දෙනවා, පොත් බලනවා. ඔය විදියට අවුරුදු පහක් ගතවුණා. මේ කාන්තාව මුහුණදුන්නු විභාගයකට ඇමරිකානු ශිෂ්‍යත්වයක් ලැබිලා පවුල චික්කම අමෙරිකාවේ පදිංචියට ගියා. අද ඇයට නින්ද කළ උදවියට වඩා හොඳ තැනක ඇය ඉන්නවා.

මම දන්න තවත් පුද්ගලයෙක් ඉන්නවා. ඔහු සාමාන්‍ය පෙළ අසමත්. පස්සේ පවුලේ ඇඳුනුම්කමක් මත නැවක අතුපතු ගාන වැඩට ගියා. එතැනදි ඔහු නැවේ යන එන විදේශිකයන් එක්ක කතාබහ කරලා භාෂා දහයක් විතර ඉගෙනගත්තා. දැන් ඔහු විවිධ භාෂා උගන්වන ගුරුවරයෙක් විදියට යුරෝපීය රටක ජීවත්වෙනවා.

තමන්ගේ මව් භාෂාවට අමතරව වෙනත් භාෂාවක් ඉගෙනගත්තොත් ඒක කවදවත් අපතේ යන්නේ නැහැ කියන එකයි ඒ කතා දෙකෙන් මට කියන්න ඕනේ. වෙනත් භාෂා ඉගෙනගන්න එකෙන් අපිට ලැබෙන පල ප්‍රයෝජන වගේම ඉක්මනින් වෙනත් භාෂාවක් ඉගෙනගන්න උදව් වෙන ක්‍රමවේද ටිකක් ගැනත් අද කතා කරමු. රටේ තියෙන ප්‍රශ්න නිසා මේ දවස්වල ගොඩක් අය රට යනවනේ. එහෙම යන්න භාෂා ඉගෙනගන්න උදව්යටත් මේ ලිපිය වැදගත් වෙයි.

පුද්ගලයන් අතර සන්නිවේදනය සිද්ධවෙන්නේ භාෂාවලින්. ගල්යුගයේ මිනිස්සු අදහස් හුවමාරු කරගත්තේ සංඥාවලින්. සංඥා භාෂාවන් විකසන වෙලා පුද්ගල කාණ්ඩවලට අනන්‍ය භාෂා ගොඩනැගුණා. ලෝකයේ මුල්ම භාෂාව ආරම්භ වුණේ මීට අවුරුදු 150,000කට කලින්මූ.

හිපොකැම්පස්, මෙන්ටල්ලෙක්සිකෝන්, බ්‍රොකාස් චීරියා වගේ මොළයේ කොටස් භාෂා කුසලතාවය එක්ක සම්බන්ධයි. අපි ඉගෙනගන්න වචන ගබඩා වෙන්නේ මෙන්ටල් ලෙක්සිකෝන් එකේ. ව්‍යාකරණ නීති තැම්පත් වෙන්නේ බ්‍රොකාස් චීරියා එකේ. මේ කොටස්වලට හානිවුණොත් භාෂා හැකියාව සම්පූර්ණයෙන්ම වුණත් නැතිවෙන්න පුළුවන්.

ඇලෙක්සැන්ඩර් ආර්ගියුලස් කියන අමෙරිකානු විද්‍යාඥයා භාෂා පනහක් ඉගෙනගත් අයෙක්. ඉගෙනගන්න භාෂා ප්‍රමාණය වැඩිවෙන්න වෙන්න රුධිර ගමනාගමනය වැඩිවෙලා මොළයේ ක්‍රියාකාරිත්වයත් චින්තන සහ තර්කන බුද්ධියත් වැඩිවෙනවා කියලා ඔහු විද්‍යාත්මකව ඔප්පු කළා. භාෂා ඉගෙනගනිද්දි මොළයේ ක්‍රියාකාරිත්වය වැඩිවෙන නිසා ඩිමෙන්ෂියාව වගේ සංකීර්ණ රෝගවලට භාෂා චිකිත්සාව යෝග්‍යද කියලා දැන් බටහිර වෛද්‍යවරු පරීක්ෂණ කරනවා.

භාෂාවක් ඉගෙනගන්න එකෙන් අපිට ලැබෙන මූලිකම දේ බුද්ධි වර්ධනය. ඒ නිසා පුංචි කාලේ ඉඳලම දරුවන්ව භාෂා කිහිපයක් ඉගෙනගන්න යොමු කරන්න පුළුවන් නම් හොඳයි.

අනික දැන් ඉස්සර වගේ නෙමෙයි මේ මුළු ලෝකයම ගෝලීය ගම්මානයක්. ඉතින් වෙනත් භාෂාවක් දන්නවා කියන්නේම ලෝකයට දෙරටු ඇරගන්න පහසුයි කියන එක. උපාධි සහතික කිහිපයකට වඩා චතුර භාෂා හැකියාව වටින අවස්ථා තියෙනවා කියලා මම අර මුලින් කිව්ව කතාවලින් වුණත් පැහැදිලිනේ.

භාෂාවකින් මුදල් හොයන්න විදෙස්ගත වෙන්නම ඕනේ නෑ. ඉංග්‍රීසි, ජපන්, කොරියන්, චීන, ජර්මන් වගේ භාෂා උගන්වලත් සල්ලි හොයන්න පුළුවන්. අනික භාෂා චතුරතාවය ඇති අයට ජොබ් මාර්කට් එකේ තියෙන තැනත් වැඩියි.

භාෂාවක් ඉගෙනගත්තහම වෙනත් සංස්කෘතියක් එක්ක ගනුදෙනු කරන්න ලේසියි. දැන් බලන්න අපේ රටේ බහුතරයක් මුස්ලිම් සහ දමිළ අයට සිංහල, දමිළ, ඉංග්‍රීසි භාෂා තුනම පුළුවන්. හැබැයි සිංහල උදවියට බැහැනේ. ඉතින් ඒ අයට අපි එක්ක වැඩ කරන්න පහසුයි. හැබැයි දමිළ පරිසරයකට අපේ කෙනෙක් ගියොත් කරකවලා අතඇරියා වගේ තියෙයි.

ලංකාවට විදේශීය ජාතිකයෝ ආවහම සමහරු ඒ අයට මුදල් වංචා කරනවා, හොඳ වචන කියලා කුණුහරප උගන්වනවා. හැබැයි මේවට අහු නොවන සිංහල දන්න විදේශිකයොත් ඉන්නවා. වෙනත් රටකට ගියාපුවහම ඒ රටේ භාෂාව තේරෙනවා නම් එතැනදි අපි රැවටිලිවලට අහුවෙන්න තියෙන ඉඩ අඩුයි.

ළමා කාලෙදි ඒ කියන්නේ මොළය වර්ධනය වෙන කාලෙදි වෙනත් භාෂාවන් ඉගෙනගන්න ලේසියි. ඒ කිව්වේ වැඩිහිටි කාලෙදි භාෂා ඉගෙනගන්න බැහැ කියන එක නෙමේ, සාපේක්ෂව කුඩා කාලෙදි ඉගෙනගන්න ලේසියි කියන එක. ඉතින් ගෑනු ළමයින්ට දෑවැද්දට රත්තරං හදලා දෙන්න හිතනවා නම් දැන්මම ඒ අදහස අතෑරලා භාෂා කිහිපයක් උගන්වන්න.

වෙනත් භාෂාවක් ලේසියෙන්ම ඉගෙනගන්න ට්‍රික්ස් ටිකක් දැන් බලමු. මුල්ම දේ ආසාවෙන් ඉගෙනගන්න. මම ජර්මානු භාෂාව ඉගෙනගත්තා. ඒ කාලෙදි මම හිතින් හිටියේ ජර්මනියේ. ඒ රටට ආදරේ කළා. සංස්කෘතිය ගැන හෙව්වා. ඒ අයගේ සිංදු, ටෙලිඩ්‍රාමා බැලුවා. ඉතින් හිතුවටත් වඩා අඩු කාලෙකින් මම ජර්මානු භාෂාව ඉගෙනගත්තා.

මුලින්ම භාෂාවක් ඉගෙනගන්න මොළය සූදානම් කරන්න. අපි ඉන්නේ ඒ රටේ කියලා පුළුවන් නම් මොළේ රවට්ටගන්න බලන්න.

අපි භාෂාවක වචන 250ක් දන්නවා නම් අපිට යාන්තමට ඒ භාෂාව කතා කරන්න පුළුවන්. වචන 1000ක් දන්නවා නම් සාමාන්‍ය ප්‍රමාණයට භාෂාව පුළුවන්. වචන 10000-20000ක් දන්නවා නම් මව් භාෂාව වගේ භාෂාව පුළුවන්. ඉතින් නිතරම වචන ඉගෙනගන්න. මුලින්ම බරසාර වචන එපා. මිනිස්සු එදිනෙදා පාවිච්චි කරන සාමාන්‍ය වචන ඉගෙනගන්න. අලුතින් හොයාගන්න වචන පොතක ලියලා ආයේ ආයෙත් බලන්න. ශබ්ද නගා කියවන්න. වචනයක් කියවන්න කියවන්න ඒක මතක හිටිනවා වැඩියි. අර ටීවී එකේ නිතරම යන සිංදු, ඇඩ්වර්ටිස්මන්ට් ඉබේටම වගේ මතක හිටින්නේ ඒකනේ.

ඒ භාෂාවට අදාළ නාට්‍ය, චිත්‍රපට බලන්න. මුලින්ම උපශීර්ෂ එක්ක නරඹලා ඊටපස්සේ උපශීර්ෂ නැතිව කීපපාරක් බලන්න.

ඔස්ට්‍රේලියානු ජාතික බෙන් මැක්මොහන් කියන තරුණයා එකපාරක් දරුණු රිය අනතුරකට මුහුණ දුන්නා. දවස් ගාණක් සිහි නැතිව හිටපු බෙන් සිහිය එනකොට ඔහුට තාවකාලිකව ඔහුගේ මව් භාෂාව වෙන ඉංග්‍රීසි අමතක වෙලා. ඒ වෙනුවට ඔහු කතා කළේ මැන්ඩරීන් භාෂාව. මැන්ඩරීන් පුළුවන් වුණාට කවදවත් ඒ භාෂාව ඉගෙනගෙන නැහැයි කියලයි බෙන් කිව්වේ. හැබැයි බොහොම කෙටි කාලසීමාවක් චීනයේ ජීවත්වෙලා තියෙනවා. ඒ කාලෙදි ඇහුනු දේවල් අවිඥානිකව බෙන්ගේ මොළයේ තැම්පත් වෙලා කියලයි පරීක්ෂණවලින් කිව්වේ. ඉතින් නිතරම ඉගෙනගන්න අවශ්‍ය භාෂාවෙන් සිංදු අහන්න, රේඩියෝ අහන්න. එතකොට මොළය අවිඥානිකව යම් යම් වචන ආදිය මතක තියාගන්නවා.

පුළුවන් නම් ඒ භාෂාවෙන් හිතන්න පටන්ගන්න. පුංචි දේවල්. උදාහරණයක් විදියට 'මම බත් කෑවා' කියන එක ඉංග්‍රීසියෙන් හිතන්න. පිහිනන්න ඕනේ නම් වතුරට බහින්නම වෙනවා කියනවා වගේ වෙනත් භාෂාවක් ඉගෙනගන්න නම් ඒ භාෂාවෙන් කතා කරන්නම වෙනවා. පුළුවන් නම් භාෂාව දන්න යාළුවෝ හොයාගෙන කතා කරන්න. ෆෝන් එකෙන් කෑම ඕඩර් කරනවා නම් කස්ටමර් කෙයා එකකට කතා කරනවා නම් ඉංග්‍රීසි/දමිළ භාෂා තෝරගන්න. කියන දේ වැරදුණත් ඒ අයට ඔයාගේ මූණ පේන්නේ නෑනේ.

පුංචි කාලේ අපි උපුල් ඊළඟ නැවෙන් ගිහින් දම්මි නිදිද බලා වරෙන් කියලා දිශා මතක තියාගත්තා මතකද? අන්න ඒ විදියට ලේසි ක්‍රම හදලා වචන මතක තියාගන්න. උදාහරණයක් විදියට ප්‍රංශ භාෂාවෙන් ගෝවා ගෙඩියට කියන්නේ 'ශූ' කියලා. එතකොට ඔයාට පුළුවන් ගෝවා ගෙඩියට 'ශූ' එකක් නැත්තම් සපත්තුවක් මතක තියාගන්න. ඒ වගේම භාෂා ඉගෙනගන්න දැන් ඕනතරම් ඇප්ස් තියෙනවා, යූ ටියුබ් වීඩියෝ තියෙනවා. ඒවත් බලන්න.

මොළය තුවාලවුණු කෙනෙක්ට, උපතින්ම භාෂා අසක්‍යතාව (ඩිස්ලෙක්ෂියාව) වගේ ආබාධ තියෙන කෙනෙක්ට භාෂාවක් ඉගෙනගන්න අමාරු වෙන්න පුළුවන්. ඒ ඇර මොළය නිරෝගී ඕනම කෙනෙක්ට ඕනම භාෂාවක් ඉගෙනගන්න පුළුවන් කියන එකත් කියන්න ඕනේ.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

හවස තේ මේසයට වෙනසක්

අල ඩ්‍රම්ස්ටික්
Potato Drumstick

අවශ්‍ය ද්‍රව්‍ය

- තරමක් ලොකු අල ගෙඩි 2
- සුදු හාල්පිටි මේස හැඳි 2
- කෝන්ෆ්ලා මේස හැඳි 1
- ලුණු, ගම්මිරිස් අවශ්‍ය පමණට (අවශ්‍යනම් කෑලිමිරිස් ස්වල්පයක් එක්කළ හැක)
- බැදගැනීමට තෙල්

සාදන ක්‍රමය

- අල තම්බාගෙන හොඳින් පොඩිකරගන්න.
- දැන් එයට හාල්පිටි, කෝන්ෆ්ලා, ලුණු, ගම්මිරිස් හා කෑලි මිරිස් එක්කර හොඳින් මිශ්‍රකරගන්න.
- දැන් එම මිශ්‍රණය අතින් ඩ්‍රම්ස්ටික් හැඩයට සාදාගන්න.
- මෙසේ සාදාගත් ඩ්‍රම්ස්ටික් ගැඹුරු තෙලේ බාගෙට බැදගන්න.
- එසේ බාගෙට බැදගත් ඩ්‍රම්ස්ටික් පැය දෙක තුනක් තබා නැවත ගැඹුරු තෙලේ බැදගැනීමෙන් එය ක්‍රිස්පි ගතියට ආහාරයට ගැනීමට හැකියි.

චීස් රොටී
Cheese Roti

අවශ්‍ය ද්‍රව්‍ය

- පාන්පිටි ග්‍රෑම් 250
- නැවුම් කිරි (පොල්කිරි හැර ඕනෑම කිරි වර්ගයක්) මි.ලී.130
- ලුණු කුඩු අවශ්‍ය පමණට • ගාගත් චීස් ග්‍රෑම් 50-75
- බටර් මේස හැඳි 2 • තෙල් තේ හැඳි 1

සාදන ක්‍රමය

- කිරි ටික බඳුනකට දමා ඊට පාන්පිටි, ලුණු එක්කර මෝලියක් ලෙස අනාගන්න.
- දැන් මෙයට තෙල් තේ හැන්ද දමා එය අතේ නොඇලෙන මෘදු පදමට අනාගන්න.
- එය පැය බාගයක් වසා තබන්න.
- අනතුරුව එය මේසයක් මතට දමා ග්‍රෑම් 50 පමණ කැබලිවලට කඩාගන්න.
- දැන් රෝලින් පින් එකකින් රවුම් හැඩයට සාදාගත් රොටිය මතට යන්තමට රත් කරගත් බටර් ආලේප කර ගාගත් චීස්ද ඒ මත විසුරුවා හරින්න.
- දැන් එය රෝල් එකක් ආකාරයෙන් නවා, අනතුරුව පැතලි හැඩයට අතින් තද කරගන්න.
- එය යළි රෝලින් පින් එකකින් තුනී කරගෙන තැටියක් රත්කර දෙපැත්තම රන් පැහැයට පුළුස්සා ගන්න.
- පොල් නොදැම්මද මෙය ඉතා රසවත් රොටියකි.

ආහාර වට්ටෝරු ඉදිරිපත් කිරීම
විධායක සූපවේදී
දුමින්ද අබේසිරිවර්ධන
B.B.Q. on Wheels, කැන්බරා, ඔස්ට්‍රේලියාව

AMDCC
සියලුම මානසික රෝගවලට ලක්වූවන් සහ වැඩිහිටි පුද්ගලයන් සඳහා
වෛද්‍ය ප්‍රතිකාර - පහසුකම් සහිත නේවාසිකාගාර - මානසික වර්ධන ක්‍රියාකාරකම්
අපේක්ෂා මානසික පුනරුත්තාපන හා උපදේශන මධ්‍යස්ථානය - නො.59 ගලබඩයාවත්ත පාර, මතුගම
රජයේ ලි.ප. ආයතනය W.H.M 1696
අපේක්ෂා මානසික පුනරුත්තාපන හා උපදේශන මධ්‍යස්ථානය | විමසීම්: 0756046535 / 0715531404

දැන්වීමකි

සෙලියුලයිටිස් රෝගය ස්ථිර සුවයට හෝමියෝපති ප්‍රතිකාර

අද වත්මන් සමාජයේ බොහෝ දෙනකුට නොසිතූ මොහොතක ඇතිවිය හැකි වේදනාකාරී රෝගී තත්වයක් ලෙස සෙලියුලයිටිස් රෝගය හැඳින්විය හැක. සුලභව පාදවල මේ තත්ත්වය ඇතිවිය හැකි අතර මෙය වළලුකරින් පටන්ගෙන ක්‍රමයෙන් ඉහළට යාමත් දක්නට ලැබෙන අතර මෙය දණහිසෙන් ඉහල දක්වාම පැතිර යාහැක.පුංචි දරුවන්ගේ මුහුණේ හටගත හැක. ක්‍රියාශීලී වයසේ සිටින දරුවාගේ සිට මහල්ලා දක්වාම ආසාදනයට ගොදුරු වීම කවර මොහොතක සිදුවෙනවාද කාටවත් කිව නොහැක.

වෛද්‍යතුමනි, සෙලියුලයිටිස් රෝගය කියන්නේ කුමක්ද?

සෙලියුලයිටිස් තත්ත්වය ලෙස හඳුන්වන්නේ සමට යටින් ඇති මෘදු පටකවල streptococcus fyda straphylococcus බැක්ටීරියා ආසාදනය වී පැතිර යාමයි. බොහෝ විට දියවැඩියා රෝගීන්ගේ රුධිර ගත සීනි පාලනය නොවන අවස්ථාවන්හිදීද, ගල් තැලුම් ඇති විටද, නහර ගැට ගැසීම් ඇතිවිටද, පාද ඇඟිලි කරුවල දිලිර ආසාදන ඇති විටද, සත්ත්ව නියපොතු මෙන්ම තමාගේ කැසීම් වලදී ඇතිවන නියපොතු සිරිම්, කම්බි සිරිම්, වැටීම්, සපා කෑමෙන් විසප්පු වැනි තත්ත්ව, නිතර තුවාල ඇතිවන අයටද, විලුඹ පැළීම් ඇතිවී මෙන්ද, අප නොසිතන ආකාරයකට විසබීජ ශරීරගත විය හැක.

වෛද්‍යතුමනි, සෙලියුලයිටිස් රෝගියකුගේ මූලික ලක්ෂණ මොනවාද ?

සෙලියුලයිටිස් තත්ත්වය ඇතිවුණු රෝගියකු අප හඳුනා ගැනීමේදී මූලික ලක්ෂණ ලෙස එම ස්ථානය ඉදිමීම දක්නට ලැබෙනවා. බොහෝ දෙනකුගේ පාදවල මෙය දැකිය හැක. මෙම ඉදිමුම ඉහළට පැතිර යා හැක. යටි පතුලද ඉදිමුම ගෙනදිය හැක. මතුපිටින් සම රතුවීම, ලප කැලැල් මෙන්ද තුවාල කැලැල් මෙන්ද, දියපට්ටා ලෙස ඇතිවීමද ආසාදනය තත්ත්ව අනුව වෙනස් වී ඇතිවිය හැක. අධික කැසීමක් ඇතිවීම, දැවිල්ලක් ගෙනදීම, පුපුරු ගසනවාක් මෙන් ඉතා වේදනාකාරී තත්ත්ව ගෙනදී ඇවිදීමට, සිටගෙන සිටීමට නොහැකි වීම, මෙහි ප්‍රධාන ලක්ෂණ ලෙස හැඳින්විය හැක. තවද , වෙව්ලා උණ ඇතිවීම, සීතල ගතිය දැනීම, රුධිර ගත ESR, CRP අගය ඉහළ යාම මෙහිදී දැකිය හැක.

මෙම තත්ත්වය නිවැරදිව හඳුනා ප්‍රතිකාරය නිවැරදිව නොවුණහොත් භයානක තත්ත්වයක් කරා යාවි. ඇතැම් විට මරණ තර්ජනීය අවස්ථා උදාවිය හැක. බැක්ටීරියාව ආසාදනය වූ මෘදු පටක දිගේ රුධිරයට ඇතුළු වී, රුධිරය හරහා මුළු ශරීරය පුරාම විෂබීජ පැතිර යාහැක. එවැනි අවස්ථාවන් ජීවිතයට තර්ජනයක් විය හැකිය.

තවත් සංකූලතාවක් වන්නේ මස්කන බැක්ටීරියාව නොහොත් Necrotizing Fascilitis තත්ත්වය, එවිට සමේ සෛල කොටස්, මෘදු කොටස් හා ඊට යටින් ඇති මාංශපේශීන් පවා මෙම බැක්ටීරියාවට විනාශ කළ හැක. එවිට පටක ඉක්මනින් විනාශ වී විශාල තුවාල බවට පත්වනවා. මෙය සමහර විට පාදය කපා ඉවත් කරන තත්ත්වයට පත්වන්නක් වන්නක් වනවා.

මේ සඳහා හෝමියෝපති ප්‍රතිකාර පවතිනවාද ?

බැක්ටීරියා විනාශ කරන ඖෂධ හෝමියෝපති ප්‍රතිකාරවල තිබෙනවා. හෝමියෝපති ප්‍රතිකාර වලදී රෝග ලක්ෂණ අපට ඉතා වැදගත් වෙනවා. පුද්ගලයාගෙන් පුද්ගලයාට පවතින ශරීර ප්‍රතිශක්තිය අනුව ආසාදනය වන ආකාරය වෙනස් වෙනවා. පෙන්වන රෝග ලක්ෂණ ද වෙනසක් හෝ වෙනස්වීමක් දක්නට ලැබෙනවා.

නමුත් මෙහිදී අනිවාර්යයෙන්ම ආසාදන තත්ත්වය ස්ථිර තත්වයෙන් නැතිව යාමට ඇතුලාන්තයෙන් නහර ලිහිල් වී හොඳ රුධිර ගමනාගමනයක් සිදුවිය යුතුයි. එවිට ඉදිමුම නැත්තටම නැතිවී ආසාදන තත්ත්වයන් නැවත නැවතත් ඇති නොවන ලෙස පූර්ණ සුවයක් ගෙන දෙන්නේ එය හෝමියෝපති ඖෂධීය ප්‍රතිකාර මගින් සිදුවීමත් එය ඒ ආකාරයට සිදුවිය යුතු බව නොදැන සිටීමත් ඔවුනොවුන් මෙම රෝගයට ජීවිත කාලය පුරාවට විඳවීමට හේතුවක් වනවා. පාද අවපැහැ ගැන්වීම, වේදනාවන් වරින් වර මතුවීමත්, ආසාදන තත්ත්ව වරින් වර මතුවීම ඉදිමුම වසර ගණනාවක් පැවතීම ඔබ අසහනකාරී තත්වයට පත්වීම රෝගය නිසැක සුවය නොවනු ඇත.

මෙහිදී වෛද්‍යවරයාගේ දක්ෂතාවය, නිවැරදි ඖෂධය රෝග ලක්ෂණවලට අනුව තේරීම වැදගත් වනවා. හෝමියෝපති ප්‍රතිකාර මූලධර්මයට අනුව සුවවීම සිදුවනවා. මෙහිදී දුර්වල වූ ශරීර ප්‍රතිශක්තිකරණය ගොඩනගමින් විසබීජයට එරෙහිව සටන් කරනවා.හොඳ රුධිර ගමනාගමනයක් නහර තුළ ඇති කරනවා. ඒ සමග ඉදිමුම හා කැසීම නැතිව යාම, වේදනාව නැතිව යාම සමග ආසාදිත තත්ත්වය පහව යාමත් සිදුවනවා. එමගින් රෝගියා පූර්ණ වූ විස්මිත සුවයක් ස්ථිර ලෙස අත්දැකීම සෙලියුලයිටිස් රෝගයට ඔබ ලබන පූර්ණ සුවය වනු ඇත.

වෙනත් රෝග වලටත් හෝමියෝපති ප්‍රතිකාර තිබෙනවාද ?

සෙලියුලයිටිස් වගේම සියලුම චර්ම රෝග, ආතරයිටිස්, පාකින්සන්, කොඳු ඇට පෙළේ ආබාධ, ස්නායු රෝග, අත් පාවල හිරිවැටීම, වෙව්ලීම, නහර ගැට ගැසීම, අර්ශස්, හර්නියා, ඉරුවාරදය, අකලට කෙස් සුදුවීම, ගැලවී යාම, දත්මුල් දියවීම, ආමාශගත රෝග, මලබද්ධය, ලිංගික රෝග, හෘද රෝග, අක්මා රෝග, වකුගඩු මුත්‍රාශ්‍රිත රෝග, දියවැඩියාව, අධික ස්ථුලතාවය, කැස්ස, ඇදුම, පිනසය, සියලු කාන්තා රෝග, ආදී සෑම රෝගයකටමද හෝමියෝපති වෛද්‍ය ක්‍රමය තුළ ඖෂධ තුළින් සුවය ලැබිය හැකි වනවා. එය ඔබට නීරෝගීමත් දිවියකට දිව ඔසු අත්වැලක් වනු නොඅනුමානය.

සුවහසක් රෝගීන් හෝමියෝපති වෛද්‍ය ක්‍රමයෙන් සුවපත් කරන එච්.කේ. හෝමියෝපති ආරෝග්‍යශාලාවේ නිර්මාතෘ වෛද්‍ය අනුෂා හේමකුමාර

සටහන පේ. ඒ. සී ශාන්ත කුමාර

විමසීම් :
එච්. කේ. හෝමියෝපති
හෙල්ත් කෙයාර් සෙන්ටර් ප්‍රයිවට් ලිමිටඩ්
නො.12, පී.බී. අල්විස් පෙරේරා මාවත,
කටුබැද්ද, මොරටුව.
0112 637740/ 0112 637741
071 8250716 / 071 8250717

සුරා සාරා

හැඟීම් මරලා දැම්මට පස්සෙත්

ගෑණුන්ට ආදරේ දැනෙන තැනක් එනවා

වැලන්ටයින් සැමරුවද?

ආදරේ සමරන්න අපිටනම් වෙලාවක් කලාවක් නෑ. අනිත් එක ඉතින් ඔය කියන දවසට ආදරේ කරන උන්ට වඩා ඕක සමරන්නේ මීඩියාකාරයොනේ.

මීඩියා කිව්වහම මතක් වුණේ. වැලන්ටයින් දවසේ රේඩියෝ, ටීවී දෙකේම පරමාදර්ශී ආදරවන්තයෝ ගෙන්නලා හරි හරියට ආදර බණ දෙසනවා මම බලාගෙන. මොනවා වුණත් ඔය ආදරේ සම්බන්ධ ගීතවලට එක එක්කෙනා දෙන නිර්වචන අහගෙන ඉන්න එකෙත් පොඩි ජොලියක් නැත්තෙම නෑ.

හැබැයි ඔය ආදරවන්තයින්ගේ දවසෙ සමහර ගීත දර්ශකවල 'මගේ පුංචි රෝස මලේ' කියන සිංදුව උත්කර්ෂයට නගපු එකටනම් මගේ වැඩි කැමැත්තක් නෑ.

ඇයි?

ඇයි කියන්නේ? ඒක මේ අප්පගේ වයසෙ නාකි මනමාලයෝ පොඩි කෙල්ලන්ට බැල්ම දාන්න අටවගත්තු ඇමක් නේ.

නයාගේ වලිගෙන් අල්ලගත්තා වගේ කොයි දේත් වැරදි පැත්තෙන් අල්ලගන්න එපා. වනචරකමට පොඩි කෙල්ලන්ට බැල්ම දාන එවුන්ට ෆෝම් වෙන්න දෙයක් ඒ සින්දුවේ නෑ. 'කළුවර රෑ සඳක් වගේ අහසේ ඔබ ඉන්නවනම් ආසයි මං නොකී කවිය නුඹට කියන්න... තරහක් නෑ නෑවිත් ඉන්න..' ආවෙ නැත්නම් බලාගනින්, රස්සාවෙන් අයින් කරනවා වගේ සම්ප්‍රදායික වියපත් බඹරු දෙන ටෝක්ස් මේ සින්දුවේ කොහෙවත් නෑ.

ඒ කියන්නේ වයසින් වැඩි පිරිමි පොඩි කෙල්ලන්ට ලව් කළාට කමක් නෑ??

ඔව්.. කමක් නෑ... මොකක්ද ඒකෙ තියන වැරැද්ද? එහෙම වෙන්න පුළුවන්. එච්චර විතරක් නෙවෙයි පොඩි කෙල්ලන්ටත් පුළුවන් අප්පගේ වයසෙ මිනිහෙක් එක්ක ආදරෙන් බැඳෙන්න. තර්ජන, ගර්ජන, ලිංගික අල්ලස් ක්‍රමේට යන්නේ නැතුව දෙන්නෙක්ගේ කැමැත්තෙන් එහෙම සම්බන්ධයක් ඇතිවෙනවනම් ඉතින් මොකද?

ඕක කියද්දී මට අර පාකිස්ථාන සිද්ධිය මතක් වුණා...

මොකක්ද?

ඒක සිද්ධ වුණේ මට මතක විදියට 2012. ඒ කෙල්ලගේ නම ෆර්සානා පර්වීන්. කෙල්ලට ඒ වෙනකොට වයස 25යි. ඒ කෙල්ල මොහොමඩ් ඉක්බාල් කියලා මනුස්සයෙක්ට ආදරේ කළා.

ඉතින්?

ඉතින් කාලයක් යද්දී ෆර්සානාට ඉක්බාල්ගෙන් දරුවෙක් ලැබෙන්න හිටියා. හැබැයි පාකිස්ථාන දෙයියන්ගේ නීතිය ආදරේට වඩා බලවත් නිසා බඩේ දරුවෙක් ඉද්දීම ෆර්සානාට ගඩොල් කැටවලින් ගහලා මැරුවා.

මොන වරදක් කළාටද?

තමන්ට වඩා අවුරුදු 20කින් වැඩිමල් පිරිමියෙකුට ආදරේ කරපු වැරැද්දට.

ඒ කියන්නේ ඉක්බාල්ට වයස 45යිද?

ඔව්. ඉක්බාල් එක්ක යාළුවෙද්දී ෆර්සානාට අවුරුදු 20ක්වත් නෑ. ඉක්බාල්ට ඒ වෙද්දී තවත් විවාහයක් තිබුණා. ඒ පවුලේ දරුවෝ පස්දෙනෙක් හිටියා.

ඒ කියන්නේ මේක අසම්මත ප්‍රේමයක්?

ඔව්. සම්මතයේම පිහිටා වැඩ කරන එවුන්ට එහෙමත් කියන්න පුළුවන්.

එතකොට අර කලින් කසාදෙට මොකද වුණේ?

මේ සම්බන්ධය ඇතිවෙලා ටික කාලයක් යද්දී ඉක්බාල්ට හිතුණා ෆර්සානව විවාහ කරගන්න ඕනෙමයි කියලා. ඒකට තිබුණු ලොකුම බාධාව වුණේ විවාහක බිරිඳ. ඒ නිසා ඔහු ඇයව මරලා දැම්මා. හැබැයි ඉක්බාල්ට ඒ මිනීමැරුම් චෝදනාව වෙනුවෙන් ලොකු දඬුවමක් ලැබුණේ නෑ.

ඇයි?

ඉක්බාල්ගේ ලොකු පුතා නීතිය ඉස්සරහට ඇවිල්ලා කිව්වා තාත්තට සමාව දෙන්න ලෑස්තියි කියලා.

අප්පාගෙ නීතියක්නේ ඒක...

ඔව් පාකිස්ථාන නීතියට අනුව අගතියට පත්වෙච්ච පාර්ශවයේ අය වැරදිකරුට සමාව දෙන්න කැමතිනම් එහෙම කෙනෙකුට බරපතළ දඬුවමකට යටත් නොවී නිදහස ලබන්න පුළුවන්.

එතකොට කවුද ෆර්සානා මැරුවේ?

ෆර්සානා මැරුවේ ඇගේ ගෙදර අයමයි. මොකද මේ සම්බන්ධයට ඇගේ තාත්තා දැඩි ලෙස විරුද්ධ වුණා. විවාහයට අනුමැතිය දෙන්නනම් ෆර්සානාගේ තාත්තා ඉක්බාල්ගෙන් ලොකු මුදලක් ඉල්ලුවා. ඒක පාකිස්ථාන රුපියල්වලින් ගත්තොත් ලක්ෂයකට වැඩි මුදලක්. හැබැයි ගොවියෙක් වෙච්ච ඉක්බාල්ට එච්චර මුදලක් ගෙවාගන්න පුළුවන් වුණේ නෑ.

ඊටපස්සේ?

ඊටපස්සේ අපේ ඔය ගමේ ගොඩේ කෙල්ලො පැනලා යනවා වගේ ෆර්සානත් ගෙදරින් පැනලා ගිහින් ඉක්බාල්ව කසාද බැන්ද. එතැනින් එහාට ෆර්සානාට කොහොමටත් ගෙදරින් සමාවක් ලැබුණේ නෑ. අන්තිමට ඔවුන් ලාහෝර් මහාධිකරණයේ ඉක්බාල්ට විරුද්ධව නඩුවක් පැවරුවා. ෆර්සානව බලෙන් අරන් ගිහින් කසාද බැන්ද කියලා. ඒ නඩුව විභාග වෙන අතරෙ දවසක උසාවිය ඉස්සරහදී තමයි ඇගේ පියා ඇතුළු පිරිස ඇවිල්ලා ගඩොල් කැටවලින් ගහලා මාස තුනක ගැබිනියක් වෙච්ච ඇයව මරලා දැම්මේ.

මම කියන්නේ ඔය සිද්ධිය ගත්තාම අපිට විවේචනය කරන්න තැන් නැත්තේම නෑ. හැබැයි වයසින් අඩු ගෑනු දැරිවියෝ සමහරවෙලාවට මැරෙන්න බලාගෙන හරි වැඩිමල් පිරිමින්ට ප්‍රේම කරනවා කියන එකට ඕක එක උදාහරණයක්.

ඒ කියන්නේ මේක අසම්මත ප්‍රේමයක්?
ඔව්. සම්මතයේම පිහිටා වැඩ කරන එවුන්ට එහෙමත් කියන්න පුළුවන්

ඇත්තටම මෙච්චර කොල්ලෝ ඉන්දැද්දී ඇයි කෙල්ලෝ එහෙම පිරිමි එක්ක යාළුවෙන්නේ?

සමහරවිට එවැනි පිරිමියෙක්ගෙන් ගැහැනියක් බලාපොරොත්තු වෙන්නේ ලිංගිකත්වයම නොවෙන්න පුළුවන්. සමහරවිට තාත්තා වගේ තමන්ට ඇහුම්කන් දෙන, රැකබලාගන්න, තමන්ව විනිශ්චය නොකරන පිරිමියෙක් මුණගැහුණු දැට ගැහැනියකටත් වයස කියන එක ඉලක්කමක් විතරක් වගේ දැනෙන්න පුළුවන්.

ඒ නිසා මේ හැම සම්බන්ධයක්ම නිර්වචනය කරන්න ලිංගිකත්වය ඉස්සරහට දගන්න එක හරි අසාධාරණයි කියන එකයි මගේනම් අදහස. මම මේ ළඟදි දවසක සුරත් ද මැල් ලියපු 'ඩුඕ' කියන නවකතාව කියෙව්වා. ඒකෙ ඉන්නවා උමා කියලා ගෑනු ළමයෙක්. අපේ වචනෙන් කියනවනම් සල්ලම් වෙච්ච ගෑනු ළමයෙක්. අන්තිමට එයාගෙ ගමන නතර වෙන්නේ ගණිකා නිවාසයකින්. හැබැයි එතැනදී උමාගෙ ජීවිතේ වෙනස් කරන ජාතියේ කස්ටමර් කෙනෙක් එයාට හම්බවෙනවා.

ඒ කිව්වේ?

ඒ මනුස්සයාගේ නම මහේෂ්. මහේෂ් උමා එක්ක කාමරේට ගිහින් ගලවන්නේ සපත්තු දෙක විතරයි. එතැනින් එහා කිසිම දෙයක් වෙන්නේ නෑ. සමහරක්දාට මහේෂ් උමා එක්ක ලෙස්ටර්ගේ චිත්‍රපට ගැන කතා කරනවා. තවත් සමහරක්දාට ශංකර්ගේ මියුසික් ගැන කතා කරනවා.

ඌ මාර පොරක්නේ...

ඔව්... නිදිවදින්න බලාගෙන ගෙට ගොඩවෙන පිරිමින්ට වඩා එහෙම මාර පොරවල් තමයි ගෑනුන්ට ඕන කරන්නේ. අන්තිමේදී පණ වගේ ආදරේ කරපු පිරිමි නිසා ගණිකාවක් වුණු උමාට, ගණිකා නිවාසෙට ආපු මිනිහෙක් නිසා ආපහු ආදරේ දැනෙන්න පටන් ගන්නවා. තමන්ගෙ ඇඟ විකුණන වෘත්තියට සමුදෙන්න හිතෙනවා. හැබැයි එහෙම වුණේ මහේෂ් ආපු අධිසුඛෝපභෝගී වාහනය දැකලවත්, ඒ මිනිහගේ වෙන යමක් දැකලවත් නෙවෙයි.

තමන්ට ඒ මිනිහා ගාව දැනුණු සැනසීම නිසා. ජීවිතේ කිසිම පිරිමියෙක්ගෙන් තමන්ට නොලැබුණු විදියේ රැකවරණයක් ඒ මිනිහා ගාව දැනුණු නිසා.

ඒ නිසා මමනම් කියන්නේ ගෑනියෙක් වුණත් පිරිමියෙක් වුණත් නවතින්න ඕන සංස්කෘතික රාමුව ගහපු උත්තමයන්ගේ හිත් සනසන්න පුළුවන් තැන්වල නෙවෙයි. මැරෙනකන් තමන්ට සැනසෙන්න පුළුවන් තැන්වල.

ඉබ්බෙකුට ගිලලා දාන්න
පරණ පෙම්වතා දීලා දාන්න

ඇස් දෙක ටිකක් වහගෙන ඔයාගේ හිටපු පෙම්වතාව/පෙම්වතියව මතක් කරගන්න. මොනවද හිතෙන්නේ?

තඩි පොල්ලකින් එක්ස්ගේ ඔලුවට පතබාන්න, ශුද්ධ සිංහලෙන් අමතන්න, නැත්නම් පිහියකින් ඇනලා මරන්න?

කන්දක් උඩ ගෙයක් හදලා, සාරි ඉරලා ජනෙල්වලට දලා, ලුණුයි බතුයි කාකා, කිරියි පැණියි වගේ ජීවත්වෙමු කියලා යාළුවෙලා ඉන්න කාලේදි කිව්වට මොකාක් හරිම අලකලංචියක් වෙලා අතරමගදී සම්බන්දේ නතර වුණොත් කිරි පැණියි දෙන්නා නයි පොළොංගු ගාණට වැටෙන්න ගතවෙන්නේ ස්වල්ප වෙලාවයි.

පහුගිය දවසක කොළඹ තුරඟ තරඟ පිටියේ තරුණ ගෑනු ළමයෙක්ව මරලා තිබුණා, ප්‍රේම සම්බන්ධය නතර කරපු නිසා පෙම්වතා බෙල්ල කපලා. හිටපු පෙම්වතියගෙන් පෙම්වතාගෙන් පළිගන්න කරපු වකම මිනීමැරුම මේක නෙමෙයි. පෙම් සබඳතා නිසා පිහිවලින් අනින, ඇසිඩ් ගහන, වීඩියෝ ලීක් කරනවා කියලා තර්ජනය කරාපු සිදුවීම් පඳුරකට පයින් ගැහුවත් දුසිමක් විතර විසිවෙනවා.

මිලී ඇමරිකාවේ තරුණියක්. ඇය ජෝර්ජ් කියලා තරුණයෙක් එක්ක අවුරුදු කිහිපයක්ම ආදරෙන් හිටියා. පෙම් සබඳතාවක් පැවැත්තුවා. පස්සේ ජෝර්ජ් මිලීව අතඇරලා වෙනත් සම්බන්දෙකට ගිහින්. හැබැයි එහෙමයි කියලා මිලී ජෝර්ජ්ට ඇසිඩ් ගහන්න, බෙල්ල කපන්න ගියේ නෑ. ඒ වෙනුවට මිලී කළේ ජෝර්ජ්ව ඉබ්බෙක්ට කන්න දපු එක.

ඒ මොන හතරබීරි කතාවක්ද?

ඇමරිකාවේ ටෙක්සාස් ප්‍රාන්තයේ සැන් ඇන්ටෝනියෝ සත්ව උද්‍යානයේ උදවිය වැලන්ටයින් දවසට එක්ස්ගෙන් පළිගන්න අලුත්ම ක්‍රමයක් හොයාගෙන. සත්වෝද්‍යානේ සත්තුන්ට කෑමට දෙන කැරපොත්තෙක් නැත්නම් එළවලු ගෙඩියක් එක්ස්ගේ නමින් නම් කරන එක තමයි ඒකෙදි කරන්නේ.

"වැලන්ටයින් එක හැමෝටම සුන්දර නැහැ. හිටපු පෙම්වතාගේ පෙම්වතියගේ මතක අලුත් වෙන නිසා ගොඩක් අය වැලන්ටයින් දවසට හිතින් විඳවනවා. මීට කලින් නම් මාත් එහෙමයි. හැබැයි මේ පාර මම ගෝවා ගෙඩියකට එක්ස්ගේ නම තිබ්බා. පස්සේ එයාලා ඒක ඉබ්බෙක්ට කන්න දුන්නා. ඉබ්බා හිමින් හිමින් එයාව කාලා දැද්දි මගේ හිතට ලොකු සැනසීමක් දැනුණා. එයාව සම්පූර්ණයෙන්ම ගිලලා දැම්මට පස්සෙ මට ආයේ අලුතෙන් ජීවිතේ පටන්ගන්න පුළුවන් කියලා හිතුණා.

ඉතින් ඊට මීට වඩා හොඳ වැලන්ටයින් තෑග්ගක් තියෙනවාද?"

එහෙම කියන්නේ මිලී. විරහ වේදනාවට මුහුණදෙන කෙනෙක් හිටපු එක්ස්ව සංකේතාත්මකව සතෙක්ට කන්න දුන්නහම යම් මානසික සහනයක් ලැබෙනවා කියලයි මිලී වගේම සත්වෝද්‍යානයේ උදවියත් කියන්නේ.

මේ විදියට එක්ස්ගේ නමින් කැරපොත්තෙක් නැත්නම් එළවලු ගෙඩියක් නම් කරන්න සත්වෝද්‍යානයෙන් යම් මුදලක් අය කරනවා. ඒ මුදල් ලොව පුරා වනජීවී සතුන්ගේ සුබසාධනය වෙනුවෙන්ලු වෙන්වෙන්නේ. ඔන්ලයින් හරහා ආරම්භ කරාපු මේ එක්ස්ලාගෙන් පළිගන්න අපූරු වැඩසටහනට රටවල් තිහක අය තමන් අප්‍රිය කරන අතීත පෙම්වතුන්ගේ නම් ලබාදීලා.

ඉතින් මොකද කියන්නේ? එක්ස්ගෙ නමින් කැරපොත්තෙක් නම් කරමුද?

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

දැන්වීමකි

අවු. 10-30 අතර ඉගෙනුම් හැකියාව අඩු එහෙත් කායිකව නිරෝගී දරුවන් සමාජගත කිරීමේ වැඩ පිළිවෙලක් (නේවාසික / අනේවාසික)

අධි ක්‍රියාකාරිත්වය - HYPERACTIVE
වර්තමානයේ ප්‍රබල මනෝ සාමාජීය ගැටළුවකට තුඩු දෙන රෝග ලක්ෂණයකි. සමාජයේ සාපරාධී ක්‍රියා වැඩිවන්නෙ මෙම තත්ත්වය හඳුනා නොගෙන එසේම ළමයින්ගෙ හැටි ඔහොම තමා කියා ගෙන සිටින වැඩිහිටියන් නිසාය. මෙය ඉගෙනුම් දුබලතා සමග සමීප සම්බන්ධතාවයක් දක්වයි. පෞරුෂ ගැටළු ඇතිවෙයි. දඟලන හැම දරුවෙක්ම **HYPERACTIVE** නොවේ.

පහත ලක්ෂණ අටක්වත් හයමාසයක් පෙන්වුවහොත් ඔබ සැලකිලිමත් විය යතුමය.

1. බොහෝවිට නොසන්සුන්ය.
2. එක ඉරියව්වක බොහෝ වෙලා නොසිටී.
3. තමාට අදාල නැති දෙයක් බලා අවධානය නැති කර ගනී.
4. තමන්ගේ වාරය එනතුරු නොසිට මැදින් පනී.
5. ප්‍රශ්නය අසා නොසිට කිමටත් පෙර උත්තර දෙයි.
6. උපදෙස් ගැනීමට, ඇසීමට, අනුගමනය කිරීමට අකමැතිය.
7. අනතුරුදායක දේවල්ම කරයි. ඉන් ලැබෙන පල විපාක වැඩක් නැත.
8. කිසිම වැඩකට අවධානය නොදේ.
9. එක වැඩකින් තව වැඩකට ටක් ගා මාරු වන්නෙ අන් අයගේ ඇස් වසාය.
10. නිශ්ශබ්දව සෙල්ලම් කිරීමට නොහේරේ.
11. නොනවත්වා කතා කරයි.
12. අන්‍යයන්ට බාධා හා අවහිර කරයි.
13. කියන දෙයට ඇහුම්කම් නොදෙයි.
14. අවසාන ප්‍රතිඵලයක් ගැන කිසිසේත්ම නොසිතයි.
15. තමාට එකඟ නොවන අයට කලහකාරීවවක්, තර්ජනාත්මක බවක් පෙන්වා යටත් කර ගැනීමට පටන් ගනියි.
16. භාෂා දෝෂය තදින් ඇති කර ගනියි.
17. කෑමට ඔිදුවන අතර වැඩි ප්‍රමාණයක් අනුභව කරයි.
18. ලොකු කුඩා කාගෙත් දෝෂ දර්ශනයට ලක්වන නිසා මානසික සෞඛ්‍ය පිරිහුණ අයකු ලෙස ජීවත් වෙයි. එතනින් ඔහුගේ/ඇගේ ජීවිත බේදාවාචකය ඇරඹේ.

මේ කරුණුවලින් අවම ලෙස කිහිපයක් හෝ අවු. හතට පෙර පෙන්වන්නේ නම් අධ්‍යාපන උපදේශනය මනෝ වෛද්‍ය ප්‍රතිකාර දෙස යොමු වීම වැදගත්ය.

මාගේ අත්දැකීම් අනුව මේ දරුවන්ව නිසි මඟට ගැනීමට අත්‍යාවශ්‍යය. දරුවෝ අවු.16 දී මිහිමරනවානම්. විවාහ වී අඬ දබර කරනවානම්.

කල්ලිවලට බැඳෙනවානම්. ළමා අපචාර කරනවා නම් රැකියාව විටින් විට මාරු කරනවා නම්, ස්වාමියා සමග නිතර චිල්ලී චිල්ලී රණ්ඩු කරනවා නම්. නිතරම කෙනකුට පහර දෙන්න යනවානම්. රණ්ඩුවෙන්න කැමති නම්. බිරිඳට අඩන්තෙට්ටම් කරනවානම්, කොටින්ම සමාජ අපගාමී දුශ්චරිත පුද්ගලයෙක් නිර්මාණය වන්නේ මේ රෝග ලක්ෂණයන් සහිතව වැඩුන දරුවන්ය.

මම දහස් ගණන් දරුවන් මේ සම්බන්ධව බලා ඇත. නිසි උපදෙස් අනුව ක්‍රියාත්මක විය යුතුය. දරුවන්ගේ උස බර වර්ධනය මන්ද පෝෂණය නේක උපාධි කරවන්න. රට යවන්න උගතකු කරන්න. පොහොසතකු කරන්න. මහන්සිවන රටේ, දරුවන්ගේ අනාගතයේ මානසික තත්ත්වය ගැන අවබෝධය තිබෙන්නේ කාටද?
උපදේශනය ගැන කිසිම පිබිදීමක් නොමැති කාලයේ එනම් 2006 අවුරුද්දේ කුරුණෑගල ප්‍රථම වරට මනෝ සාමාජීය වචනය පාවිච්චි කරල උපදේශන මධ්‍යස්ථානයක් ආරම්භ කලේ මම. එදා මෙදාතුර කාලයේ අත් දැකීමෙන් මෙම ලිපිය ලියන්නෙ මේ ගැන හැම කෙනෙක්ම දැනුවත්විය යුතු නිසාමයි.

පෙර දින මට හොරණ්ණ අවු 12.ක දරුවෙක් පෙන්නුවා ඒ දරුවා මවට පහර දීම, ඇසක් තුවාල කිරීම, පුටු සෙට් ගිනි තැබීම ලක්ෂ දෙකක බඩු දැනට කඩා බිඳ දැමීම කර ඇත. ඉගෙනීම ඉතා පහත් අඩියක බව අනාවරණ පරීක්ෂණයේදී පෙනින. ඉදිරියේ මේ ළමයාගේ අනාගතය කෙබදු වේද?

මේ දරුවා අධි ක්‍රියා කාරී දරුවෙකි.

ලොරි පස්සෙ දුවන දරුවන්. සියඹලා ගස මුදුනේ සරුංගලය ගන්න යන දරුවන් පාසල ඇරී මඩ කඩිතිවල බැස ගඩා ගෙඩි කඩමින් ජරාවාස වී නිවසට පැමිනෙන දරුවන්. රංචු පිටින් එකතු වී තනි ළමයකුට ගසා ආබාධ කරන දරුවන්., උස් තාප්ප මත නැග බිමට පනින දරුවන්, උස් ගස්වලට නගින දරුවන් විශාල වශයෙන් මුණ ගැසේ. මේ තත්ත්වය සහිත දරුවන් හිංසාකාරී වැඩ කරයි ඒ අයට ඉහත දැක්වූ කරුනු වලින් දහයකට වැඩි ප්‍රමාණයක් තිබේනම්ය.

එසේම ජංගම දුර. game ගැසීමට ඇබ්බැහිවීම මේ තත්ත්වය යටතේ වැඩිවේ. කාටුන් බැලීමට ඇබ්බැහිවේ. ඉගෙනීම් කටයුතු වලින් පලා යයි. නිවසින් පැන යාම සිදු කරයි. වයසින් වැඩෙන විට සොරකම් කරයි. බොරු කීම විනෝදයක් කර ගනී.

අවුරුදු 12 පෙර දරුවන්ගේ චර්යාව හදා ගන්න උපදෙස් වැඩක් නැත. උපදෙස් දෙන්න යන තැනැත්තාට මැරුම් කා හැක. සාමාන්‍ය පුද්ගලයන් ප්‍රවේශම් විය යුතුයි. ඒ තරමට සමාජයේ දරුවන් පිරිහී ඇත.

මහළුළු ගෙදරට බත් බඳින්න සුදානම් විය යුතු නැත. දරුවන් හඳුනා ගත හැකි වෘත්තිය සුදුසුකම් ඇති පුද්ගලයන්ට යොමු වන්න. දරුවන්ගේ මානසිකත්වය හඳුනා ගන්න. මගෙ ළඟට එන ගැටළු සහිත පුද්ගලයින්ගෙන් 50% කට වඩා කුඩා කාලයේ අධි ක්‍රියාකාරී අයවලුන්වේ. බහුතරයකගේ ජීවිත අවුල්ය.

බුදු බණ කීවාට ඒවා අසන්න සිහි බුද්ධිය

භද්‍රා පී. කිරින්ගොඩ
MA, BA in Kelaniyauni
Dip in Counselling (NISD)
Family Counseling (SLF)

අවශ්‍යය. බුදු බණ මෙච්චර අච්චර කියන රටේ මිනීමැරුම් අපරාධ. දූෂණ වංචා, හොර, බොරු ගැන වහසි බස්දොඩමින් සිටීම පලක් නැත. කුඩා කල සිට දරුවන්ගේ මනෝ සාමාජීය පැත්ත සලකා බැලුවානම් මෙතරම් අපරාධයක් අප රටට සිදු වන්නේ නැත. එවිටය බුදු බණේ අරුත වැටහෙන්නේ එම දරුවන් වයසින් වැඩෙන විට.

පිපෙනා මලකට - ගලනා ගඟකට
දැනෙනා බුදු ගුණ - නොදැනෙන මිනිසුනි
කොයි ලොව යන්නේ - මරණින් මත්තේ
පින් පව් එනවා - අපි පසු පස්සේ

දරුවන්ගේ රෝග ලක්ෂණ හඳුනාගෙන චර්යාව හැදුවොත් පමණයි මේ දරුවන්ට මෙහි අර්ථය වැටහෙන්නේ.

ලිවීමට, කියවීමට හැකියාව අඩු නිසා සා.පෙළ අසමත් දුර්වල දරුවන්ගේ අනාගතය සාර්ථක කර ගනිමු.

අධ්‍යාපන උපදේශන පුනුරුත්ථාපන කඳවුර භද්‍රා.පී. කිරින්ගොඩ මෙහෙයවයි.

- **විභාග අසමත් / විභාගය නොකළ**
- **විභාග බිය**
- **ලිවීම කියවීම හැකියාව අඩු**
- **අධික කේන්තියන**
- **කිසිම දෙයක් කිරීමට කැමති නැති**
- **ජීවිතය ඔහේ පාවී යාමට ඉඩදෙන දරුවන්**
- **අධි ක්‍රියාකාරී ලක්ෂණ ඇති**

ස්ථානය - කුරුණෑගල (භද්‍රා පී. කිරින්ගොඩ අධ්‍යාපන චර්යා ප්‍රතිකාර උපදේශන මධ්‍යස්ථානය, කුරුණෑගල)

077 5736 446 / 077 352 4962
(කළමණාකරු)
අවුරුදු 43 ක අවල විශ්වාසනීය ගමන් මග.

https://www.facebook.com/profile.php?id=100001548353511&mibextid=ZbWKwL

සැකසුම :
භද්‍රා පී .කිරින්ගොඩ
කුරුණෑගල

රජ්ජුරුවන්ගේ නිධානය රකින්න කැලණියෙන් තව නයෙක් මතුවෙලා

මාධ්‍යවේදී
තිලක් සේනාසිංහ



පුවීණ මාධ්‍යවේදී කුසුම්සිරි විජයවර්ධනයන්ගේ 'කැලණි ගඟ බඩ පුරාවෘත්ත' නම් නවතම කෘතිය පසුගියද දෙමිපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී එළිදැක්විණි. එහිදී එක්වරම මගේ සිහියට නැංවුණේ මීට දශක දෙකකට පමණ ඉහත කැලණි ගඟ දෙපස පිහිටි ගම්පහ දිස්ත්‍රික්කයට අයත් සියනෑ කෝරළයේත් කොළඹ දිස්ත්‍රික්කයට අයත් හේවාගම් කෝරළයේත් මා සිදුකළ සංචාරයන්ය. මා එම සංචාරයන්හි යෙදුණේ අදටත් එම ප්‍රදේශවල ප්‍රධානතම ජන ඇදහීමක් වන 'රන්වල දෙවියන්' පිළිබඳ පුරාවෘත්ත ඒකරාශී කිරීමටය. කැලණි ගඟ දෙපස සිටින ජනතාව විසින් අදහන බැවින් එම රන්වල දෙවියෝ 'දෙගම්බඩ දෙවියෝ' ලෙසද හැඳින්වෙති.

එම සංචාරයේදී කැලණි නදියට තරමක් නුදුරින් පිහිටි ගමක පුංචි තේ කඩයක හිමින් හරිමින් සිටියදී එහි රැස්ව සිටි ගැමියන් සමඟ ප්‍රදේශයේ පැරණි විශ්වාස පිළිබඳව සුහද කතාබහක යෙදීමට මට හැකිවිය.

"මෙහාට එන එක අයියා කෙනෙක් ඉන්නවා. එයා නම් ඔය වගේ පරණ කතන්දර ගොඩක් දන්නවා. මගේ ළඟ ඒ අයියගෙ ෆෝන් නම්බර් එකත් තියෙනවා. ඕනෙනම් දෙන්න පුළුවනි." අපේ කතාවට කනින් කොනින් සවන් දී සිටි එම වෙළඳසැලේ තරුණ කාන්තාව ඒ අතරතුර කීවාය. ඒ අනුව එම ගැමියන් කිහිපදෙනා වෙළඳසැලෙන් නික්ම ගිය පසු මම ඇය දුන් දුරකතන අංකයට එතැන් සිටම ඇමතුමක් ගතිමි.

"ඔව් ඔව් ඔය කඩේ නංගිව මම හොඳට දන්නවා. මම දැන් නම් කැලණියේ පොඩි වැඩකට ඇවිත් ඉන්නේ. ඔබතුමා කොහෙද ඉන්නේ? මට දවසක්, වෙලාවක්, තැනක් කියන්න මම ඇවිත් හම්බුවෙන්නම්." ඔහු පිළිතුරු දෙන ලද්දේ අතිශය උනන්දුවකින් බව මට වැටහිණි.

ඒ අනුව මම ඔහුට එවකට මා සේවයේ යෙදී සිටි මාධ්‍ය ආයතනයේ නම සහ ස්ථානය කියා හැකි නම් කලින් දුරකතන ඇමතුමක් දී පැමිණෙන මෙන් ඉල්ලා සිටියෙමි.

"මම අසවලා, මම දැන් ඉන්නේ ඔබතුමන්ලගේ කන්තෝරුවේ සිකියුරිටි එක ළඟ. ඔබතුමා දැන් කොහේද ඉන්නේ? කන්තෝරුවෙද?" දිනක් හිටිහැටියේ මා වෙත ලැබුණු දුරකතන ඇමතුමකින් එලෙස පැවසුණි.

ඒ මා පෙර කී පුද්ගලයාය. කලින් දන්වා එන ලෙස කියා තිබියදීත් හදිසියේ පැමිණීම ගැන සියුම් අපැහැදීමක්ද මා තුළ ඇතිවිය. ඒ එම මොහොතේ මා තරමක් අවිවේකීව සිටි බැවිනි.

"මම මෙතැනින් යන ගමන් හදිසියේම ඔබතුමාව මතක් වුණා. ඒකයි ගමන ටිකකට නතර කරලා හරි ටිකක් කතා කරලා යන්න හිතුවේ." ඔහු කීය. ඒ අතරේ ඔහුගේ එම දැනුම අතනින් මෙතනින් පිරික්සා බැලිය යුතු යැයි සිතූ මම ඔහු දන්නා කැලණි ගඟ අද්දර ජනප්‍රවාද පිළිබඳව උඩින් පල්ලෙන් කරුණු විමසා සිටියෙමි.

"ඔය කියන කතා සේරම පැත්තක තියෙද්දි මට පහුගිය දවසක අමුතුම කතාවක් අහන්න ලැබුණා. ඒක තමයි මම ඔය පැත්තේ කතා අතරින් අහපු සුපිරිම කතාව." හෙතෙම කීය. ඉඳින් එය පවසන මෙන් මම ඔහුගෙන් ඉල්ලා සිටියෙමි.

ඔහු පැවසූ විස්තරයට අනුව මීට සියවස් එක හමාරකට පමණ පෙර එම ප්‍රදේශයේ 'රජ්ජුරුවෝ' නමින් හැඳින්වෙන වංශවත් ධන කුවේරයෙක් ජීවත් වී තිබේ. අක්කර සිය ගණනක ඉඩකඩම් සේම රන්, රිදී, මුතු, මැණික් ආදී වස්තු සම්භාරයක්ද ඔහු සතුව තිබී ඇත. එහෙත් එම වස්තුව සොර සතුරන් විසින් පැහැර ගනිතැයි යන සැකය මත එම ධන කුවේරයා ඒවා තම ඉඩමේ කිසියම් තැනක වළලා ඒ මත පැලක් තනාගෙන එහි ජීවත්වන ලෙස තම සමීපතම අතවැසියාට දන්වා ඇත්තේ මතු ලබාගන්නා තෙක් ඒවා ඔහුගේ ආරක්ෂාව යටතට පත්කිරීමේ අදහසිනි. පසුව එම ධනවතාත් අතවැසියාත් දෙදෙනාම මියගොස් ඇති අතර එම අතවැසියාගේ දරුවන් එම නිවස වඩාත් හොඳින් අලුත්වැඩියා කොට එහි පදිංචි වී තිබේ. අද වනවිට එහි පදිංචිව සිටිනුයේ එම අතවැසියාගේ තුන්වන දරු පරම්පරාවය. එහෙත් තම ගෙපැලේ නිදන්කොට ඇති රන්, රිදී, මුතු, මැණික් ආදී මහා ධන සම්භාරය ගැන ඔවුහු හාංකවිසියක්වත් නොදනිති.

"ඉතින් කොහොමද ඔය කතාව ඔබතුමාට දැනගන්න ලැබුණේ?" ඔහුගේ එම ප්‍රකාශය අවසානයේ මම ඇසීමි.

"මේක ඉස්සරවෙලාම අත්තනගල්ලේ එල්ලක්කල පත්තිනි දේවාල කපු මහත්තයෙක් ආරූඪයකින් කියපු දෙයක්. ඒක වෙලා තියෙන්නෙත් බොහොම ඉස්සර. ඒ ආරූඪයෙන් කියැවුණු විස්තර අහගෙන ඒ කාලේ ඉඳලම එක එක අය ඔය ගේයි ඉඩමයි සල්ලි දීලා ගන්න බලලා තියෙනවා. ඒත් ඒකේ අයිතිකාරයෝ කීයටවත් ඒකට කැමති වෙලා නැහැ. අනික පුදුමේ කියන්නේ අදටත් ඒ ඉඩම වටේ හැමතිස්සෙම වගේ සුදු නයෙක් කැරකෙනවලුනේ." ඔහු කීයේ ඉමහත් උනන්දුවකිනි. එහෙත් අතිශය අද්භූතජනක වූ ඒ ප්‍රවෘත්තිය කිසිවකු විසින් ප්‍රබන්ධය කළ මනඃකල්පිතයක් බව මගේ වැටහීම විය.

ඉන්පසු දිනෙක මා එම ප්‍රදේශයේ සංචාරය කරන අතරේදී මා හා හිතවත් වූ ප්‍රාචීන පණ්ඩිත උපාධිධාරී පිරිවෙන් ආචාර්ය ස්වාමීන් වහන්සේ නමකට එම 'රජ්ජුරුවෝ' නමින් හැඳින්වෙන පුද්ගලයා පිළිබඳව පවසා ඔහු සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු සපයාදිය හැකිද යන්න විමසා සිටියෙමි. එවිට ඒ හිමියන් කියා සිටියේ එස්. ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායකයන්ගේ පියා වන සොලමන් ඩයස් බණ්ඩාරනායක මුදලිතුමන් හා කිරිඳිවැල සේනාරත්න පරපුරේ අතීත ප්‍රභූවරයෙකු එවක ගැමියන් 'රජ්ජුරුවෝ' යනුවෙන් හඳුන්වා ඇති බවකි. පසුව මම ඒ හිමියන් සමඟ ඉහත කී 'රජ්ජුරුවන්ගේ නිධානය' පිළිබඳව කී විට උන්වහන්සේ ඊට සිනාසී නිහඬ වූ අයුරු මට මතකය.

නමුත් මගේ මිතුරු කුසුම්සිරි විජයවර්ධනගේ 'කැලණි ගඟබඩ පුරාවෘත්ත' කෘතිය එළිදැක්වීමේ පුවත දුටු මට රජ්ජුරුවන්ගේ නිධානය පිළිබඳ පුවත සිහිගැන්වී දිගුකලකට පසු නැවතත් ඒ හිමියන්ට දුරකතනයෙන් ඇමතීමි. මේ වනවිට පිරිවෙන් ආචාර්ය වෘත්තියෙන් විශ්‍රාමගෙන හිඳින හිමියන් වැඩසිටිනුයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ විහාරස්ථානයකය.

"ඔය කියන ගේයි ඉඩමයි පිටින් ආපු කවුරුහරි ඒකේ වටිනාකම වගේ හත් අට ගුණයකට අරගෙන තියෙනවා. ඒ සල්ලිත් අරගෙන අර මිනිස්සු පවුල පිටින් රට ගියාලු. කොහොමහරි ඔය නිදන් කතාව ඔය ඉඩම විකුණගන්න බ්‍රෝකර්ලා ගොතාපු කතාවක් කියලා පස්සේ දැනගන්න ලැබිලා. ඔන්න දැන් ඒ ගේයි ඉඩමයි පාලුවට ගිහින්ලු." ඒ හිමියෝ සිනාසෙමින් කීහ.

ඔය කඩේ නංගිව මම හොඳට දන්නවා. මට දවසක්, වෙලාවක්, තැනක් කියන්න මම ඇවිත් හම්බුවෙන්නම්



දළඳ මාලිගාවේදී ඇත්ගොව්වෙකුට අංගුලිමාල වැහිලා

තොරතුරු
මහාචාර්ය
අශෝක දංගොල්ල
(පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

අඩුව තියෙද්දී අත පුළුස්සා ගන්නා අය ඕනෑතරම්ය. තමන් ගැන අධිතක්සේරුවෙන් අවදානම් ගැනීමට යෑමේ පල විපාක ඔවුන් තේරුම්ගන්නා විට බොහෝ දේ සිදුවී හමාරය. මේ ද වැනි කතාවකි.

මහනුවර ඇසළ පෙරහර පැවැත්වූ දිනෙක මහාචාර්ය අශෝක දංගොල්ලට කොළඹ පැවැත්වෙන ජාත්‍යන්තර සම්මන්ත්‍රණයකට සහභාගි වීමට සිදුවිණි. එබැවින් රාත්‍රී ඇසළ පෙරහරේ නිර්වින්දන රාජකාරි හෙතෙම වෙනත් වෛද්‍යවරයකුට පැවරීය. දහවල් වකට පමණ මහාචාර්ය දංගොල්ල මහනුවරින් පිටත්වූයේ කොළඹට පැමිණීමේ අරමුණ ඇතිවයි. කඩුගන්නාව පසුකළා පමණි, මහනුවරින් හදිසි දුරකතන ඇමතුමකි.

"ඇසළ පෙරහරට ආපු පිරිමි අලියෙක් දම්වැල් ගලවගෙන. පත්තිනි දේවාල භූමියේ එහෙ මෙහෙ දුවනවා."

මෙවැනි පණිවිඩයක් ලැබුණු විට මොන සම්මන්ත්‍රණද? ඇසළ පෙරහර කාලයට පත්තිනි දේවාලය පරිශ්‍රයේ ගැවසෙන මහා ජන සංඛ්‍යාව මහාචාර්යවරයාට සිහිපත් විය. බරපතළ ජීවිත අවදානමක් වළකාගැනීමට ප්‍රමුඛතාව ලබාදිය යුතු බව තීරණය කළ මහාචාර්ය දංගොල්ල වහාම ආපසු හැරුණේය. මහනුවරට නැවත පැමිණෙන අතර විශ්වවිද්‍යාල පඟු ශික්ෂණ රෝහලට ගොඩ වූ හෙතෙම ඖෂධ සහ නිර්වින්දන තුවක්කුද සූදානම් කළේය. තවත් වෛද්‍යවරුන් සහ සිසුන්ද රැගෙන කඩිමුඩියේ මහනුවර පත්තිනි දේවාලය කරා පිටත්වූයේ මහා අනතුරක් වළකාගැනීම සඳහාය.

සියලු මානව සහ භෞතික සම්පතින් සන්නද්ධව මහාචාර්ය අශෝක දංගොල්ල අදාළ ස්ථානයට පැමිණියේය. දම්වැල් නොමැතිව ඔබමොබ දුවන මද කිපීමට ආසන්න පිරිමි අලියා ඔහුගේ දර්ශනයට හසු විය. ඒ සමඟ දුටු දෙයින් ඔහුට අනේ අපොයි කියා කියැවිණි. ඔහු දුටුවේ කණා පල්ලම් බැහීමටත් වඩා අවදානම් ක්‍රියාවකි. අලියා සමඟ හරි හරියට දුවන්නේ ඇත්ගොව්වාය. ඔහු මධුවිතින් සප්පායම් වී ඇති සෙයකි. වන පොට හොඳ නැත. මහාචාර්ය දංගොල්ල ඇත්ගොව්වාට අනතුරු ඇඟවීය. අලියා මද කිපීමට ආසන්න බැවින් මෙම ස්ථානයේ ජීවිත තර්ජනයක් ඇති බවත් තත්ත්වය තනිව නිරාකරණය කිරීමට ඇත්ගොව්වාට නොහැකි බවත් හෙතෙම පහදා දුන්නේය. ඇත්ගොව්වාට දෙන උපදෙස් බීරි අලින්ට වීණා වැයීමකි. දෙස්තරගේ උපදෙස් කනට නොගත් ඔහු අලියා මෙල්ල කිරීමේ තනි සටනකය. මහාචාර්ය දංගොල්ල අලි හිමියා සම්බන්ධ කරගැනීමට කිහිපවතාවක් උත්සාහ දැරීය. එයද නිශ්ඵල විය. එනිසා අලියා නිර්වින්දනය කිරීමට සහාය වන්නැයි ඔහු යළිත් හස්තිපාලකවරයාගෙන් ඉල්ලීය. එහෙත් ඔහුට ඒ ඉල්ලීම ගැන වගේ වගක් නැත. මේ කතාව අහද්දී අපිට සිහිවුණේ අංගුලිමාල සහ බුදුන් වහන්සේය. නැවතී සිටි බුදුන් අංගුලිමාල දුවනවිට ඔහුට නවතින ලෙස කීහ. නමුත් බුදුන්ද ඔහු මෙන් දුවනවා මෙන් දුටු අංගුලිමාල බුදුන්ට නවතින ලෙස අණ කළේය. 'අංගුලිමාල මා නැවතී සිටිමි. ඔබද නවතින්න' යැයි බුදුන් වහන්සේ නැවතත් අවධාරණය කළහ. අංගුලිමාලට නැවතීම පිළිබඳ අවබෝධ වෙන්නට පටන්ගත්තේ එතැන් සිටයි.

ජීවමාන බුදුන් හා සමාන දන්ත ධාතූන් වහන්සේ වැඩහිඳින භූමියේ සිට මහාචාර්ය දංගොල්ලද මේ ඇත්ගොව්වාට නවතින ලෙස කීවේය. නමුත් ඔහු "හා... හා මට පුළුවන්" යයි කියමින් දිගටම දිව්වා මිස නැවතුණේ නැත.

මහාචාර්යවරයාට කළ හැකි දෙයක් නැත. හෙතෙම ඇත්ගොව්වාට ඉඩ දී මදක් බලා සිටියේය. ගතවූයේ ස්වල්ප වේලාවකි. මහා කේන්තියකින් ඇත්ගොව්වා වෙත දිව ආ අලියා ඔහුව පයින් පාගා බිම දැමීය. පසුව සිය ඉදිරි පාදය ඇත්ගොව්වාගේ පපුව මත තබා තද කළේය. එම අවස්ථාවේ කාගේවත් උදව් ඉල්ලීමට ඉඩක් නැත. මහාචාර්ය දංගොල්ල වහාම අලියා සිහි නැති කළේය. වටපිටාවේ සිටි ඇත්ගොව්වන් අලියා බැඳ දැම්මේ අනතුරුවයි. අසාධ්‍ය වූ ඇත්ගොව්වා කඩිනමින් මහනුවර මහරෝහලට ඇතුළත් කෙරිණ. ඔහු ශල්‍යකර්මයකට ලක්කිරීමටද වෛද්‍යවරු පියවර ගත්හ. මහනුවර මහරෝහලේ ශල්‍ය වෛද්‍යවරයා මහාචාර්ය දංගොල්ල වෙත දැනුම් දුන්නේ ඇත්ගොව්වාගේ ජීවිතය ඉතා අවදානම් තත්ත්වයක පවතින බවයි. ශල්‍යකර්මයෙන් පසු හෙතෙම ජීවිතක්ෂයට පත්විය. එම පණිවිඩයෙන් මහාචාර්ය දංගොල්ල බොහෝ කම්පනයට පත්වූයේ එය මගහැර ගැනීමට තිබූ මරණයක් බව ඔහු හොඳින්ම දැන සිටි බැවිනි.

රජනිකා ලියනගේ

කෙටි කතාව

කිව්ව නිසා අම්මා අපේ බැන්ද කසාදේ

මම මහා අවාසනාවන්ත ගැහැනියක්. ඒ බව හැමෝම කතා වෙනවා. මගේ ඥාතීන් හිතවතුන් විතරක් නෙවේ, මගේ මව්පියන් පවා දැන් ඒ බව පිළිගෙන අවසන්. මමත් හිටියේ ඒ බව පිළිගන්න ඔන්න මෙන්න. ඒ තරමටම ජීවන ගමනේ මට විඳින්න වුණ දුක් කරදර බොහෝමයි. අවාසනාවන්ත නැතිනම් මේ වගේ දේවල් සිද්ධවෙයිද?

මම විවාහ වුණේ යෝජනාවකින්. සිසිර බොහොම ගුණ යහපත් තරුණයෙක් බව කියමින් ඔහුව මට අඳුන්වලා දුන්නේ අපේ නිවසින්ම තමා. අම්මාටත් තාත්තාටත් ඒ බව සහතික වෙලා තිබුණේ මගේ ලොකු නැන්ද. ඒ වෙද්දි මට විවාහවෙන්න කිසිම අදහසක් තිබුණෙ නැහැ. මොකක්ද මන්ද හේතුවකට මට අවුරුදු විසි ගණන්වලදී ගොඩක්ම වැදගත් වුණේ මගේ නිදහස.

මට හිටියා අපූරු යාළුවෝ කණ්ඩායමක්. ගැහැනු පිරිමි බේදයක් නැතුව මේ අය සහෝදර සහෝදරියන් සේ හිතින් බැඳුණු අය. ඔවුන් එක්ක බණ අහන්න යන්න, විනෝද චාරිකා යන්න මම පුරුදුවෙලා හිටියා. මට ඒ තරුණ වයසේදී මහණ වෙන්න අදහසක් නම් තිබුණේ නැහැ. හැබැයි ලෞකික ජීවිතයේ නිස්සාර බව මට යන්තමට වගේ දැනිලා තිබුණා. ඒ වගේම ඇවිදින්න යන එක, කඳු නගින එකෙන් මම ලොකු සතුටක් ලැබුවා.

මෙන්න මේ කාලෙදි තමයි මගේ මුළු ඥාති පරම්පරාවටම මාව විවාහයකට ඇතුල් කරන්න ඕනේ වුණේ. මම පවුලේ එකම දරුවා නිසා ඔවුන් මට බොහෝ දේ කිව්වා. කවදා හෝ මම වයසට ගියාම මාව රැකබලාගන්න සහෝදරයෙක්වත් නැති නිසා මගේ දෙමව්පියන්ට හිතේ සැනසීමෙන් මැරෙන්නවත් බැරි බව ඔවුන් මට කිව්වා.

"ආගම දහම අදහන එක හොඳයි. හැබැයි ඕනම දෙයක් ඕනෑවට වඩා හොඳ නැහැ." තාත්තගේ මතය වුණේ ඒක.

"ට්‍රිප් යන එක ජොලි වැඩක් තමා. ඒත් අක්කගේ යාළුවෝ කසාද බැන්දට පස්සෙ උන් යන ට්‍රිප්වලට අක්කව එක්කගෙන යන්නෑ. මෝඩ නොවී ට්‍රිප් යන්න ආස කොල්ලෙක් හොයාගෙන ඌ එක්ක ලෝකේ වටේම ට්‍රිප් යනවා." මගේ ඥාති සහෝදරයෙක් දවසක් මට කිව්වා.

"මෙයාගේ යාළුවො ටික තමයි මෙයාගේ ඔලුව වෙනස් කරන්නේ." අම්මා එහෙම කියමින් කම්පා වුණ.

විවාහ යෝජනාව අපේ ගෙදරට ආවේ මේ අතරේ. බොහෝදෙනෙක්ගේ ඉල්ලීම පරිදි මම සිසිරව ඇසුරු කරන්න ගත්තා. ඔහු බොහොම ගුණ යහපත්, පිනට දහමට ලැදි පිරිමියෙක්. ඒ බව මට දැනුණා. ඒ වගේම විනෝදජනක තරුණයෙක්. ඉතින් මටත් හිතුණා ඔහු මගේ සහකරු වෙන්න ගැළපෙන බව. නෑදෑ හිතවතුන්ගේ ආශිර්වාදය මැද අපි විවාහ ජීවිතයට ඇතුළු වුණා.

ජීවිතය ඇත්තටම හරිම ලස්සනයි. විවාහයෙන් පස්සෙ මට එහෙම හිතුණා. ජීවිතේ සතුට අස්ථිර බව බණ අහලා ඔලුවට දගෙන හිටිය මමම එය බොහොම ඉක්මනින්ම අමතක කර දමා සිසිරට හදවතින්ම බැඳුණා. අපේ පවුලට පුංචි පුතෙක් ලැබුණේ මගේ ජීවිතේ සතුට තව තවත් වැඩි කරමින්. ලෝකයේ ඉන්න වාසනාවන්තම ගැහැනිය මම කියලා මට හිතුණා.

"දැන් අර ඉස්සර තිබ්බ මනස්ගාත අදහස් නැතිවෙලා නේද?"

අම්මයි තාත්තයි හිටපු ගමන් මට විහිළු කරන්නත් පටන්ගත්තා. පුතාට අවුරුදු පහක් යනකම් මේ ආදරණීය සතුට පිරුණ ජීවිතයේ කිසිම වෙනසක් සිද්ධ වුණේ නැහැ. හැමදේම වෙනස් වුණේ අවුරුදු පහේ පුංචි පුතුට ලිව්කේමියා රෝගය වැළඳීමත් සමඟයි. සතුට කියන දේ බොහොම ඉක්මනින් අපේ ජීවිතවලින් පලා ගියා. සිසිරයි මමයි පිස්සුවෙන් වගේ මහන්සි වුණා අපේ දරුවාගේ ජීවිතය බේරාගන්න. වියදම් වන්න වන්නම වැඩි වුණා. මම දරුවා ළඟින් හෙලවුණේවත් නැහැ. මේ කාලේ ජීවිතයට ගිනි ඇවිලුණු කාලයක්. අවුරුදු දෙකක් විතර අපි ඒ ගින්නේ දැවෙමින් ඉන්න ඇති. ඒ ගින්නේ දරුණුතම අවස්ථාව උදවෙමින් අපේ පුංචි පුතු මෙලොව හැර ගියා. මටත් සිසිරටත් දැනුණේ ලෝකයම කඩාවැටුණු බවක්.

අපි දෙදෙනා එකතු වෙලා දුක බෙදා ගන්නවා වෙනුවට සිද්ධ වුණේ එන්න එන්නම දුරස් වුණු එක. සිසිර සමහර රාත්‍රීන් ගතකළේ ඔහුගේ කාර්යාලයේ. ඔහු කිව්වේ ඔහුට ගෙදරට එන්න හිත නොදෙන බව. ගෙදරට ආපුවම පුංචි පුතුව මතක් වෙන බව. මටත් ඒ කාලය බොහොම අඳුරු කාලයක්. දවසම පුංචි පුතුගේ මතක පිරුණු ගෙදර ඇතුළේ ඉන්න එක මටත් පහසු වුණේ නැහැ. මම මගේ දෙමවුපියන් ළඟට ආවේ ඒ නිසා. ඒ ආවත් මම කළේ කාමරේට වෙලා වැඩි වෙලාවක් ගත කරන එකයි.

සිසිරයි මමයි අතර දුරකතන ඇමතුම් හුවමාරු වුණේත් බොහොම අඩුවෙන්. දෙමව්පියන් අපිට උපදෙස් දෙන්න උත්සාහ කළත් ඒ උපදෙස් අහන මානසිකත්වයක අප හිටියේ නැහැ. හැබැයි පුංචි කාලයක් ඇතුළත සිසිර වෙනත් විදියකින් සැනසීම හොයාගෙන කියලා මට ආරංචි වුණේ බොහොම ඉක්මනට. ඔහු වෙනත් ආදර සම්බන්ධයක පැටලිලා තිබුණා. ඒ සම්බන්ධය පුංචි පුතුගේ මතකය අමතක කරගන්න ඔහුට උදව්වක් වෙලා තිබුණා.

මට සිසිරවත් නැත්තටම නැතිවුණේ අන්න ඒ විදියටයි. මුලින්ම සිද්ධවුණේ ඥාතීන් අතරින් මාව ක්‍රම ක්‍රමයෙන් කොන්වීම. සුබ කටයුතුවලදී මට ආරාධනා නොකරන්න ඒ අය පරිස්සම් වුණා. ඒ බව මට දැනුණත් මම එය නොදන්නා සේ සිටීමට උත්සාහ කළා.

"මහා අවාසනාවන්ත කෙ...ල්ලෙක්. දරුවත් නැති වුණා. මිනිහත් දලා ගියා." ඒ අය මම ගැන කතා වුණේ ඒ විදියට.

මගේ දෙමව්පියනුත් මගේ අවාසනාවන්තකම ගැන කියමින් බොහොම දුක්වුණා. හැමෝම මම අවාසනාවන්ත බව කියද්දී මමත් එය පිළිගන්න තත්ත්වයට පත්වුණා.

මගේ පැරණි මිතුරිය මට හදිසියේම මුණගැහුනේ මේ අතරෙදි. ඇය තවමත් විවාහ වෙලා නැහැ. මම ඇයත් එක්ක කතාවට වැටුණා.

"මට පුදුම ඔයාගේ ඔය දෙමව්පියොයි නෑදෑයොයි ඔහොම කියන එක ගැන. ඒ කාලේ ඔයා කසාද බඳින්න බැහැ කියද්දි බලෙන්ම ඔයාව කසාදෙකට තල්ලු කළේ ඒ මිනිස්සු. ඔයා එදා විවාහ නොවුණා නම් මේ වගේ ප්‍රශ්නවලට මුහුණදෙන්න වෙන්නේ නැහැනේ." ඇය කියද්දී මට ඒ සත්‍යයක් බව දැනුණා.

"දැන් බණ අහන්න, කඳු නගින්න යන්නේ නැද්ද?" මම ඇයගෙන් ඇහුවා.

"ඉස්සර තරම් නැහැ. මොකද මට වෙලාව නැහැ රස්සාවත් එක්ක. හැබැයි මාසෙකට වතාවක්වත් අනිවාර්යයෙන්ම යනවා සෝලෝ ට්‍රිප් එකක්. අපේ ජීවිතයේ තීරණ ගන්න ඕනේ අපේ කැමැත්තෙන් සෙව්වන්දි. එතකොට ඒක වැරදුණත් හරි ගියත් ඒකෙ වගකීම තියෙන්නේ අපිට. ඔයා ඒ කාලේ ආසාවෙන් හිටියේ විවාහ නොවී ඉන්න. මට මතකයි ඒ කාලේ ඔයා කියනවා අවුරුදු 40 විතර වෙනකම් රස්සාවෙන් සල්ලි හොයාගෙන හිතේ හැටියට ට්‍රිප් යනවා කියලා. 40 පැන්න ගමන් රස්සාවෙන් අයින් වෙලා මෙහෙණි ආරාමයකට යනවා කියලා. ඔයාගේ සිතුවිලි ආශාවන් බලෙන් වෙනස් කළේ ඔයාගේ වටේ හිටපු අය. ඔයා වෙනුවෙන් එයාලම ගත්තු තීරණ තීන්දු දැන් වැරදුණාම ඔයා අවාසනාවන්ත කෙනෙක් කියන එක මොනතරම් නරකද? ලොකුම විහිළුව ඔය තීන්දු තීරණ ගත්තේ ඔයා නෙවෙයි. ඔයා වෙනුවෙන් ඒ අයයි ඔය තීන්දු තීරණ ගත්තේ. ඉතින් ඒවා වැරදුණාම ඒකට වැරදි ඔයාද? අපි ඒ කාලෙ තේරුම්ගත්ත දෙයක් තිබුණා. අපිට දෙයක් නැතිවෙන්නේ අපිට ඒ දේ හිමිවුණොත් විතරයි කියන ඇත්ත. දැන් සිද්ධ වෙලා තියෙන්නේ ඒ දේ. ඔයාට දරුවා අහිමි වුණේ ඇයි? ඔයාට දරුවෙක් ලැබුණ නිසා. ඔයාට සැමියා අහිමි වුණේ ඇයි? ඔයාට සැමියෙක් ලැබුණ නිසා. ඒ දේවල් ඔයාට නොලැබුණා නම් ඒ දේවල් කවදවත් ඔයාට අහිමි වෙන්නෙත් නැහැ. කොටින්ම කියනවා නම් ඔයාගෙ ජීවිතේ තීරණ ඔයාට ඕනෙ විදියට ගන්න ඉඩ දීලා අනිත් අය තමන්ගෙ පාඩුවේ හිටියා නම් මේ කිසිම දෙයක් වෙන්නේ නැහැ. මේ සිද්ධ වුණ කිසිම දේකට හේතුව ඔය හැමෝම කියන විදියට ඔයාගේ අවාසනාවන්තකම නෙවෙයි."

ඇය මගේ හිත හදන්න පැය ගණනාවක් වෙන් කළා.

"ආයෙ කවුරු මට ඇඟිල්ල දික් කළත්, මම අවාසනාවන්ත ගැහැනියක් කියලා හංවඩු ගැහුවත් ඒ කතාව මම පිළිගන්නේ නැහැ. ඒක අවාසනාවක් නම්, ඒ අවාසනාව ඒ අයම මා මත බලෙන් පටවපු අවාසනාවක්. මම අවාසනාවන්ත නැහැ." මම මටම සපථ කරගත්තා.

සමාධි ඛයස්

medicare 2023
ජාතික සුවසේවා ප්‍රදර්ශනය
தேசிய சுகாதாரநல கண்காட்சி
National Healthcare Exhibition
BMICH, COLOMBO
03,04,05 MARCH

ඉන්දියාවේ ජනනාම් ප්‍රධාන රෝහලේ විශේෂඥ වෛද්‍යවරියන් දෙදෙනෙක් වන ප්‍රසව, නාරීවේද හා මදසරුභාවය පිළිබඳ විශේෂඥ වෛද්‍ය වානි මහත්මිය සහ ප්‍රසව, නාරීවේද හා මදසරුභාවය පිළිබඳ විශේෂඥ වෛද්‍ය මංගලම් මහත්මිය ප්‍රදර්ශනය පැවැත්වෙන තෙදින පුරා AP 3 කුටියෙහිදී හමුවිය හැක.

ප්‍රසව හා නාරීවේද වෛද්‍ය විශේෂඥ හා මදසරුභාවය පිළිබඳ විශේෂඥ වෛද්‍ය වානි මහත්මිය
MD, DGO, FRCOG
Master in reproductive medicine

Jananam Indo Lanka Fertility Centre
where life begins...

ප්‍රසව හා නාරීවේද වෛද්‍ය විශේෂඥ හා මදසරුභාවය පිළිබඳ විශේෂඥ වෛද්‍ය මංගලම් මහත්මිය
DGO, DNB, EFOG
Master in reproductive medicine

කොළඹ BMICH හි මාර්තු මස 3, 4, 5 යන දිනයන්හි පැවැත්වෙන Medicare ප්‍රදර්ශනයේ AP3 කුටියෙහි Jananam Indo Lanka Fertility Center හිදි ඉන්දියාවේ නම් දැරූ මදසරුභාවය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන්, පෝෂණවේදිනියන් හා කලල විශේෂඥවරුන් හමුවී නොමිලේ උපදෙස් ලබා ගත හැකි අතර, අනුමත සියළු දෙනා හට නොමිලේ අල්ට්‍රාසවුන්ඩ් ස්කෑන් පරීක්ෂණ සිදු කරවා ගතහැක.

එසේම එදින IVF ප්‍රතිකාර සඳහා නිර්දේශ වන සියල්ලන්ටම රු.50,000ක් වටිනා වට්ටම් තෑගි වවුචර්පතක් හිමි වේ.

Jananam Indo Lanka Fertility Center
වැඩි විස්තර සඳහා 0777443311 අමතන්න | අංක 12, බගතලේ පාර, බම්බලපිටිය

සෙනෙහස වැඩිහිටි හා ආබාධිත නිවාසයට නේවාසික අය බඳවා ගනු ලැබේ.

ආබාධිත, එක්තැන් වූ, රෝගී, නීරෝගී අය සහ මන්ද මානසික ආබාධ සහිත අය නිසි ලෙස ආහාර පාන වෛද්‍ය පහසුකම් සහ කාරුණික සාත්තු සේවය සමඟින් ජීවිතාන්තය දක්වා සෙනෙහසින් රැක බලා ගනු ලැබේ.
රත්නපුර කොළඹ හයිලෙවල් පාරට නුදුරින් පිහිටා ඇත.

177/2, ගල්වලමුල්ල, වටරුක, පාදුක්ක, හෝමාගම.

077 402 4553

ඔබ දෙවයට පිටුපායිද.. ?
දෙවය ඔබට පිටුපායිද.. ?

- ජීවිතයේ අතීත සහ වර්ථමාන සිදුවීම් ඔබ විමතියට පත්වන අයුරින් පැවසුවහොත් ඔබට අනාගතයේ සිදුවන දෑ ගැන විශ්වාස නොකර සිටිය හැකිද ?
- වසර 45 කට වැඩි පර්යේෂණාත්මක අධ්‍යයනයන් සමඟ හස්ත රේඛා ශාස්ත්‍රයෙන් ඔබේ ජීවන ප්‍රශ්න විසඳා ගැනීමට හමුවන්න.

හස්ත රේඛා විශේෂඥ
එස්. කෝරළේගේ
520, වාසනා මාවත, කොට්ටාව, පන්නිපිටිය,

සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි
පෙ.ව 9.00 සිට ප.ව 5.00 දක්වා හමුවිය හැක.
0112 783172 / 0773 775094

හඬන හදවත් සුවපත් කරන දක්ෂිණ නිවන

අලව්වේ ශ්‍රී සුගත වේද ආශ්‍රමය...

ව්‍යාපාරය බිඳ වැටී ද ? පවුල් ආරවුල් ද?
දරුවන් අකීකරු ද? සැර පරුෂ ද ? නොමඟ යනවා ද ?
සැමියා දරුවා මතට ඇබ්බැහිවී ද ?
සැමියා/බිරිඳ අනියම් සම්බන්ධකම් පවත්වයි ද ?
පෙම්වතා/පෙම්වතිය අමනාප ද ? ඔබව මඟහරිනවා ද ?
විවාහ ප්‍රමාදයට මංගල මල් වරම්
ඔබ නඩුවකට පැටලී ද ? සතුරු කරදර ද ?
බලෙන් ඉන්න අය ඵලවා දැමීම ද
එපා අය ඈත් කර ඕනෑ අය ලංකර ගැනීම ද
කනස්සල්ලෙන් නොඉඳ, ප්‍රමා ද නොවී අදම එන්න.
කාන්තාවනි, ගැහැනියකගේ දුක දන්නේ තවත් ගැහැනියක් පමණි.
තම ආත්ම ගෞරවය, රහස්‍යභවය රැකගෙන,
සැකෙන් බියෙන් තොරව සිය මවට, සොයුරියට මෙන් පවසන්න.
නිසැක ජය ලබන්න. පැමිණීම අත්‍යාවශ්‍යයි.

හමුවීම - සෙනසුරාදා, ඉරිදා දිනවල දී

පැමිණීමට පෙර දුරකථනයෙන් අමතන්න. නිකරුණේ ඇමතීමෙන් වළකින්න.

ශ්‍රී සුගත වෙද මැදුර තුල්හිරිය උසාවිය ඉදිරිපිට, අලව්ව.
077 7 722 860 - 075 4 838 300
(කොළඹ හා කුරුණෑගල සිට එන අයට මාර්ග අංක 6 බසයෙන් පැමිණ, තුල්හිරිය, අලව්ව උසාවිය ඉදිරිපිට බසින්න.)

ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න යනු විද්‍යාත්මකව සහ කලාත්මකව පැමිණිල්ල මෙහෙයවීමට නම් දරා ඇති විශිෂ්ටයෙකි. කොබෙයිගනේ රූප සුන්දරී ඝාතනය, ටෝනි මාටින් ඝාතනය, මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඝාතනය සහ හෝකන්දර සය පුද්ගල ඝාතනය ආදී ආන්දෝලනාත්මක නඩු රැසක පැමිණිල්ල මෙහෙයවීමට ඔහු දායක වී ඇත. සිය අත්දැකීම් නිර්මාණශීලීව යොදා ගනිමින් නීතියද පැහැදිලි කරමින් ඔහු විසින් රචිත 'යළි මැවෙන අපරාධයක්' කෘතියේ සංස්කරණය කළ දෙවන මුද්‍රණයද පසුගියදා ජනගත කෙරිණ. ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න නීතිපති දෙපාර්තමේන්තුවෙන් පසුගිය වසරේදී සමුගත්තේ ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයකු ලෙස කටයුතු කරමින් සිටියදීය. මේ, ඔහුගේ අත්දැකීම් අලලා ලියැවෙන ලිපි මාලාවේ පස්වැන්නයි.

අනූව දශකයේ හලාවත මහාධිකරණයේ විභාගයට ගැනුණ මිනීමැරුම් නඩුවකදී චිත්තිකරුවන් සිව්දෙනාම වරදකරුවන් කරමින් ඔවුන්ට මරණ දඬුවම නියම විය. කටුනේරිය ද්විත්ව ඝාතනය ලෙස ප්‍රචලිත වූ ඒ කෙරෙහි එකල වැඩි අවධානයක් යොමුවූයේ පළමු චිත්තිකාරිය වෙවකට සුප්‍රසිද්ධ අමාත්‍යවරයකුගේ බිරිය වීම නිසාය. ඇමති බිරිඳ ඇතුළු පිරිසට මරණ දඬුවම හිමිවූයේ කුමක් නිසාද?

අමාත්‍ය ධුරයක් දැරුවද, විවාහ වී දරුමල්ලන් ලබාසිටියද ප්‍රේමයට සීමා නැත. ඒ අනුව නොසිතූ මොහොතක අමාත්‍යවරයා කාන්තාවක හා පෙමින් බැඳුණේය. අපි එම කාන්තාව 'සාරා' යන අන්වර්ථ නමින් හඳුන්වමු. ඇයද විවාහකය. සැමියා සහ එක් පුතෙකු සිටියේ විදෙස්ගතවයි. අනෙක් පුතා මෙරට වාසය කළේය. සාරා සහ හිටපු අමාත්‍යවරයා අතර පෙම් පළහිලව්ව ගලාගෙන යද්දී එය ඇමති බිරියගෙන් සැඟවීමට හැකියාවක් නොවීය. ඒ සමඟ සියල්ල වෙනස් වන්නට විය. ඇමති බිරිය වේදනාවට පත්වූවාය. ඊටත් වඩා කෝප ගත්තාය. කෝපය පළිගැනීම දක්වා වර්ධනය විය. සාරා පිළිබඳ සියලු කරුණු ඉතා සූක්ෂම ලෙස ඈ සොයාගත්තාය. වෛරය ක්‍රමයෙන් වර්ධනය වෙද්දී ඈ සාරා මරා දමන්නට සැලසුම් කළාය. ඇතැම්විට තමා සතු ධනය, බලය නිසාම සැලැස්ම ක්‍රියාත්මක කරවීම ගැන ඇයට සැකයක්ද නොතිබෙන්නට ඇත. මක්නිසාද තමාගේ එක වචනයකට නතු කරගත හැකි පිරිස්ද ඒ වනවිට ඈ සතුව සිටි බැවිනි.

සම්බන්ධය නතර නොකළහොත් මරා දමන්නේයැයි ඇමති බිරිය සාරාට තර්ජනය කළාය. සිය සැමියා වාසය කරන ඉතාලියට යාමට සාරා තීරණය කළේ ඒ ජීවිත අවදානම නිසාවෙනි. ඒ අනුව 1991 දෙසැම්බරයේ ඈ මෙරටින් පිටත් වූවාය. එහෙත් ඉන්දියාවට පමණක් ගිය ඈ නැවතත් හැරී ලංකාවට පැමිණියේ සිය පෙම්වතාගෙන් වෙන්ව සත් සමුදුරු තරණය කරන්නට සිත් දුන්නේ නැති නිසා විය හැකිය. ඉතාලියට යනවා යැයි කී සාරා හදිසියේ යළි මව් රටට පැමිණියේ ඇයි? යනුවෙන් ප්‍රශ්න කළ සැමට ඇය දැනුම් දුන්නේ ජනවාරි මස මුලදී යළි විදෙස්ගත වන බවයි. මෙරටට පැමිණියද සිය ජීවිතය අනතුරක බව සාරා හොඳටම දැන සිටියාය. එනිසාම තමාගේ නිවසේ නවතිනු වෙනුවට ඈ සිය සැමියාගේ සහෝදරියකගේ වාසස්ථානයේ නවාතැන් ගත්තාය. සාරාගේ සේවිකාවද ඒ සමඟ ගියාය. (ඇය අපි 'ලීනා' ලෙස හඳුන්වමු.)

සාරාගේ හැම ක්‍රියාකාරකමක් කෙරෙහිම ඇමති බිරියගේ උකුසු ඇස යොමුවී තිබිණි. එනිසා විදෙස්ගත වූ සාරා නැවත දිවයිනට පැමිණි බව දින කිහිපයකදීම ඇමති බිරිය දැනගත්තාය. සිය තර්ජන පවා නොසැලකූ සාරා කෙරෙහි ඇගේ කෝපය තවත් උග්‍ර විය. සිය සැලැස්මේ ඊළඟ අදියරට පිවිසීමට ඇය තීරණය කළේ ඒ අනුවයි. 1992 නව වසර ඇරඹී තෙවන දිනයේදී ඇය සිය සැලැස්ම ක්‍රියාත්මක කිරීමට විධිවිධාන යෙදුවාය. සැමියාට සැක නොසිතෙන පරිදි එය කළ යුතුය. ඒ අනුව සිය සැමියා වූ අමාත්‍යවරයාට ඈ දැනුම් දුන්නේ තමාගේ සහෝදරයාගේ නිවසට යාමට අවැසි බවයි. ඒ සඳහා ඔහුගේ ජීප් රථය සහ රියැදුරු ලබා දෙන ලෙස ඇය ඉල්ලුවාය. මෙතැන් සිට රියදුරු 'සාගර' යන අන්වර්ථ නමින් හඳුන්වන්නේ කියැවීමේ පහසුව වෙනුවෙනි. ඇමති බිරිය 1992 ජනවාරි තුන්වනදා සාගර සමඟ නිවසින් පිටත් වූයේ කුමන්ත්‍රණයේ සැලසුමද අතැතිවය. දියණියද ගමනට එක් වූවාය. දියණිය ඇගේ මිතුරියකගේ නිවසට ඇරලවූ ඇමති බිරිය නිදහසේ සිය සැලැස්මේ හවුල්කරුවන් සොයා ගියාය. ඈ ප්‍රථමයෙන් හමුවූයේ තමාට අයත් කොහුමෝලක කළමනාකරුවයි. ඔහු රියට නංවා ගත් අතර කොහුමෝලෙන් හිස් බූලියක්ද වාහනයට පටවා ගැනීමට කළමනාකරු පියවර ගත්තේය. අනතුරුව යුද හමුදා සෙබළකු සහ ඔහුගේ මිතුරකු වන 18 හැවිරිදි තරුණයකුද වාහනයට නංවා ගැනීමට පියවර ගැනිණ. සියලු හවුල්කරුවන් අමාත්‍යවරයාගේ ජීප් රථයට නංවා ගැනීමෙන් පසු ඇමති බිරිය සිය සහෝදරයාගේ නිවසට ගියාය. සෙස්සෝ නැවත ගමනට පිවිසුණහ. රියැදුරු අසුනට යාබදව අසුන්ගත් කොහුමෝලේ කළමනාකරුගේ මෙහෙයවීම මත සියල්ල සිදුවිය. ගමන අතරතුර යම් ඉන්ධන පිරවුම්හලකට වාහනය ඇතුල් කෙරුණේ තෙල් ගසාගැනීමේ අපේක්ෂාවෙනි. බූලියටද ඉන්ධන පුරවාගත් බවක් සාගරගේ මතකයේ ඇත.

සාගරට යම් අමුත්තක් දැනිණ. කුමක් හෝ නරකක් සිදුවන්නට යන බවට ඉව වැටුණද ඔහුට කළ හැකි දෙයක් නොවීය. රාත්‍රී අන්ධකාරය අතරින් ඔහු රිය ඉදිරියට ධාවනය කළේ කිසිවක් සිතාගත නොහැකිවය. ඒ අතරතුර රිය නවතන ලෙස කළමනාකරු සාගරට අණ කළේය. තරමක් උස් ස්ථානයක රථය නතර කෙරුණු අතර ඒ අසළ මාර්ගයක් විය. අනතුරුව කළමනාකරු සහ යුද හමුදා සෙබළා සාගර අසළට පැමිණියහ. ඔවුන් සතුව අත්බෝම්බයක් ඇති බව දුටු සාගරගේ බිය දෙගුණ තෙගුණ විය.

ඇමතිගේ පෙම්
මරා දැමූ වර
ඇමති බිරිඳ පෝ

"අර පහළ ගෙදර සාරා ඉන්නවා. ගිහින් කියනවා ඇමතිතුමා ඇවිත් ඉන්නවා, එන්න කියලා."

වෙනදටත් අමාත්‍යවරයා සමඟ ගොස් සාරා කැඳවාගෙන එන්නේ සාගරය. එය දැන සිටි ඇමති බිරිය උපායශීලීව සාගර සිය මෙහෙයුමට එක්කරගෙන තිබුණි. අකමැත්තෙන් වුවද හෙතෙම වාහනයෙන් බැස්සේය. ඔහු මුහුණදුන්නේ 'ගෙදර ගියොත් අඹු නසී - මග හිටියොත් තෝ නසී' වැනි අවස්ථාවකටය. වාහනයේ සිටි අයෙකුගේ ඔත්තු බැලීම අතරම සාගර සාරා සිටි නිවසට ගියේය. ඔහු දොරට තට්ටු කළ විට පැමිණියේ ලීනාය. ඒ දෙදෙනාද එකිනෙකා හඳුනති. ඒ අනුව ලීනා වහාම සිය ස්වාමි දුවට සාගර පැමිණ ඇති බව දැනුම් දුන්නාය. ඒ බව සාරාගේ නෑනාටද දැන්වීමට ඇය අමතක නොකළාය. සාරා සාගර වෙත ගියේ ඒ අතරය.

"මැඩම්, ඇමතිතුමා ඇවිත් ඉන්නවා. ජීප් එකට එන්න කිව්වා."

වතිය

දට
රකයට යයි

සිය පෙම්වතා පැමිණි බව ඇසුණු විට සාරා උද්දමයට පත්වන්නට ඇත. ඇය සිය නෑනාට ඒ බව දැනුම් දුන්නාය.

"අරයා ඇවිල්ලා ඉන්නවා. මං හම්බවෙලා එන්නං."

මෙහි අග මුල හොඳින්ම දන්නා නෑනා, ඊට දැඩි විරෝධය පළකළාය. ඒ, දැනටමත් සාරාට ඇති මරණ තර්ජන හොඳින්ම දැන සිටි බැවිනි. සාරාට කළ හැකි දෙයක් නැත. එහෙත් ආලය සැබවින්ම අන්ධය. එනිසාමදෝ අනතුරක සේයාවක් හෝ සාරාට දැනුණේ නැත.

"කොහොමටත් පැනඩෝල් ගන්න මට කඩේට යන්න ඕන."

සිය නෑනණ්ඩියට එසේ කියූ සාරා නිදන ඇඳුම පිටින්ම එළියට බැස්සාය. නෑනාට ඇගේ මුසාව වැටහුණා වුවද බලෙන් නවතාලීමට සාරා කුඩා දැරියක නොවේ. සිය ස්වාමිදුවට අනතුරක් වේයැයි සැක සිතූ ලීනාද සාරා පසුපසින් ගමන් කළාය. ජීප් රථය වෙත ගමන් කළ සාරාට එහි සිය පෙම්වතා දැකගත නොහැකි විය.

"මහත්තයා කෝ?"

සාරාගේ පැනයට පිළිතුරු දීමට සාගරට ඉඩක් නොවීය. සැඟව සිටි පිරිමින් තිදෙනෙකු වාහනයට නැගගත්තේ සාරාට හෝ ලීනාට කිසිවක් සිතා ගැනීමට ඉඩ නොතබාය. ඔවුන් දෙදෙනා රථයේ පිටුපස අසුනේ සිරවූයේ යුද හමුදු සෙබළා සහ තරුණයාට මැදිවය. වාහනයේ වීදුරු ඉහළට ඔසවා ගුවන්විදුලියේ හඬ ඉහළ නංවන ලෙස රියැදුරාට අණ ලැබිණ. භීතියෙන් වෙලී ගිය සාගර අණට කීකරුව වේගයෙන් රිය ධාවනය කළේ පසුපස අසුනට ඇස් බැල්මක් හෝ යොමු නොකරමිනි. වැඩි වේලාවක් යන්නට මත්තෙන් කිසිදු පිහිටක් නොවූ කාන්තාවන් දෙදෙනාගේ හුස්ම වාතලයට මුසු විය. ඒ පසුපස අසුනේ සිටි දෙදෙනාගේ ඉන බැඳි බඳපටිවලට සිරවීමෙනි. කාන්තාවන්ගේ ගෙල සිර කරන අයුරු සාගර නොදුටුවද බඳපටි දෙක පසුපස අසුනේ තිබෙන අයුරු ඔහු දැක ඇත. පසුව ඒවා ගඟකට විසි කර තිබේ. කාන්තාවන්ගේ කිසිදු හැලහොල්මනක් නොමැතිව ජීප් රථය තවදුරටත් ධාවනය කෙරිණ. තරමක් ඉදිරියට යාමෙන් පසු වාහනය නවතන්නට නැවත සාගරට අණ ලැබිණ. සාගර හැර අනෙක් සියල්ලෝ වාහනයෙන් බැස ගත්හ. එහෙත් කැළඹිල්ල හේතුවෙන්දෝ ඔහුට කාන්තාවන් ගැන නිනව්වක් නොවීය. ටික වේලාවකින් සාගර සිය පැති කණ්ණාඩියෙන් දුටුවේ මහා ගිනි ජාලාවකි. ටික වේලාවකින් කළමනාකරු, යුද හමුදු සෙබළා සහ තරුණයා නැවත රථයට ගොඩ වූහ.

"දැන් යමු."

සාගරට අණ ලැබිණ. කාන්තාවන් දෙදෙනාට වූ දෙයක් නැත. පිටුපස ඇවිලෙන ගින්න සාගරට ඒ ගැන ඉඟි කරන්නට ඇත. භයානක හැඟීමකින් මනස ව්‍යාකූල වූ සාගර හැකි වේගයෙන් රථය ධාවනය කරවීය. මහා අපරාධයක් කර පළායන අයට ස්වභාව ධර්මය උපකාර කරාවිද? ඒ අපරාධය සදකාලිකව සැඟවීමට හැකිද? එසේ නොවේ. කොතැනින්, කවද හෝ ඒවා අනාවරණය වේ. මෙම සිදුවීමේදී යුක්තිය ඉටු කිරීමට සහාය දැක්වීමට මාර්ගයේ වූ මාර ගසක් සූදානමින් සිටි බව අපරාධකරුවන් දැන සිටියේ නැත. අවුල් වූ මනසින් රිය පැදවූ සාගරගේ පාලනයෙන් ගිලිහුණු ජීප් රථය මාර ගසේ වැදිණ. වාහනයේ සංඥා ලාම්පුවක කැබලි කැඩී නිහඬව බිම ඉතිරි වූයේ එතැනද සාක්ෂියක් ඉතිරි කරමිනි. ජීවිත හානි සිදුනොවූ බැවින් නැවත රිය පණ ගන්වා ධාවනය කරවීමට සාගර සමත් විය. පැය කිහිපයක ඇවෑමෙන් රථය ඇමති බිරියට බාරදීමට හෙතෙම සමත් වූයේය. පසුව සාගර සමඟ සෙසු තිදෙනා ඔවුන්ගේ නිවෙස් වෙත ඇරලවා ඇය සිය නිවසට ආවාය.

"ඔයා බයවෙන්න එපා. ජීප් එක හැප්පුණේ මල්ලි අතින් කියලා මම සර්ට කියන්නං. මාව ගෙදරට දලා ඔයා ආපහු වාහනේ මල්ලිගෙ ගෙදරට දාන්න."

ගමනේදී ඈ සාගරට කීවාය. අමාත්‍යවරයා රිය අනතුර ගැන සිය බිරිය කී දේ විශ්වාස කළද නොබෝ දිනකින්ම සිය පෙම්වතියට සහ ඇගේ සේවිකාවට අත් වූ ඉරණම දැනගත්තේය. සිය ස්වාමියාට දැඩි සේ අවංක වූ සාගරටද තවදුරටත් කිසිවක් සඟවා සිටිය නොහැකි විය. ඔහු අමාත්‍යවරයාට සියල්ල හෙළි කළේය. අමාත්‍යවරයා සිදුවීම යටපත් කිරීමට කිසිදු උත්සාහයක් නොගත්තේය. පසුව සාගර පොලිසියටද ප්‍රකාශයක් ලබා දුන්නේය. අනතුරුව මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේද හෙතෙම පාපොච්චාරණය කළේය. එය නීතිපතිවරයා වෙත යොමු කිරීමෙන් පසු අපරාධ සහායකයකුට හිමිවන සමාව ඔහුට හිමිවිය. අධිකරණය ඉදිරියේද මේ සාක්ෂි ලබාදෙන බව දන්වමින් ඔහු නීතිපතිවරයා සමඟ ගිවිසුමකට එළැඹුණේ ඒ අනුවය. මේ අතර පිළිස්සුණු සිරුරේ දත් දෙකක් අතර වූ හිදැසක් සහ නිය ආලේපන ආදියෙන් එය සාරාගේ මෘත ශරීරය බව නෑනා හඳුනාගෙන තිබිණ. මාර ගස් අසළ වූ වීදුරු කැබලි ජීප් රථයේ සංඥා ලාම්පුව සමඟ සසඳෙන බව රජයේ හිටපු රස පරීක්ෂක මා.අ.ජ.මෙන්ඩිස්ගේ මූට්ටු සාක්ෂිවලින් තහවුරු විය. ඝාතනයට සම්බන්ධ අය ලබා දුන් තොරතුරු අනුව සොයාගත් රත්‍රන් මාලයක් සහ කරාබුද සාරාට අයත් බව තහවුරු විය. මෙම සිදුවීම සම්බන්ධයෙන් හලාවත මහාධිකරණය ඉදිරියේ ප්‍රථමයෙන් නඩු පැවරුණේ ඝාතන කුමන්ත්‍රණය සම්බන්ධයෙන් ඇමති බිරිය පළමු විත්තිකාරිය බවට සහ සෙසු තැනැත්තන් දෙවැනි, තෙවැනි සහ සිව්වැනි විත්තිකරුවන් බවට පත් කරමිනි. සිදුවීමට අදාළ නඩුවක් පැවතීමට ප්‍රධාන අවස්ථාව හිමිවූයේ රියැදුරා පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දීමට ඉදිරිපත් වූ බැවිනි. හලාවත මහාධිකරණය විසින් සියලු විත්තිකරුවන් වරදකරුවන් කරනු ලැබීය. එහෙත් පැමිණිල්ල මෙහෙයවීමේ දුර්වලතා ලෙසින් පශ්චාත් මරණ පරීක්ෂණ ආදිය විධිමත්ව ඉදිරිපත් නොකිරීම වැනි දෝෂ පෙන්වා දෙමින් විත්තිය අභියාචනයක් ඉදිරිපත් කළේය. එහිදී අභියාචනාධිකරණය තීන්දු කළේ නඩුව නැවත මුල සිට ආරම්භ කළ යුතු බවයි.

ඒ අනුව සිදුවීමෙන් වසර දහතුනකට පසු කොළඹ මහාධිකරණයට යොමු කිරීමෙන් අනතුරුව උපාලි අබේරත්න විනිසුරුතුමන් ඉදිරියේ 2005 පෙබරවාරි මාසයේදී නඩුව යළි විභාගයට ගැනිණි. පැමිණිල්ල මෙහෙයවනු ලැබුයේ ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න විසිනි. එවකට ඔහු ජ්‍යේෂ්ඨ රජයේ අධිනීතීඥයෙකි. නඩු විභාගය ආරම්භයේ සිටම හෙතෙම විවිධ අභියෝගවලට මුහුණ දුන්නේය. තමන්ගේ නඩුව විනිසුරු හෝ ජූරි සභාවක් ඉදිරියේ විභාග කරනවාද යන්න තීරණය කිරීම විත්තියේ අයිතියකි. ඒ අනුව ඔවුන් ඉල්ලා සිටියේ ජූරි සභාවක් ඉදිරියේ නඩුව විභාගයට ගත යුතු බවයි. ඒ සඳහා උසාවියට ලැබෙන නම් අතුරින් ජූරි සභාවේ අසුන් ගන්නා හත්දෙනා තෝරා ගැනෙන්නේ අංක භාවිත කර අහඹු ලෙසය. එලෙස තෝරාගත් හත්දෙනාගෙන් හයදෙනෙකුම කාන්තාවන් විය. මෙවැනි සිදුවීමකදී කාන්තාවන්ගේ ප්‍රතිචාරය කෙසේ විය හැකිද? අනාචාරය අපරාධ වරදක් නොවේ. නමුත් මනුෂ්‍ය ඝාතනය අපරාධ වරදකි. එහෙත් සමාජයීය මතවාද කෙරෙහි අවනතව ක්‍රියා කිරීමට එම කාන්තාවන් කටයුතු කළහොත් කුමක් වේවිද? සාරා කෙරෙහි නොපහන් හැඟීමකින් ඔවුන් නඩුවට ප්‍රවිෂ්ට වුවහොත් යුක්තිය ඉටු වීම යට යනු ඇත. එනිසා ඔවුන් මධ්‍යස්ථ මතයක තබා සන්සුන්ව නඩුව ඇසීමට පෙළඹවීම වෙනුවෙන් කරුණු දැක්වීම වඩා වැදගත් බව ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න කල්පනා කළේය. පැමිණිල්ල මෙහෙයවීමට පෙර කෙටි දේශනයක් කිරීමට ලැබෙන විටිනා අවස්ථාව ඔහු ඇරඹුවේ එය සැලකිල්ලට ගනිමිනි.

"කවුද ආදරයේ පැටලෙන්නෙ නැත්තෙ? ලෝකයේ ශ්‍රේෂ්ඨ මිනිසුන්ගේ මහාර්ඝ රාජ්‍යයන් පවා ආදරය නිසා අහිමිවෙලා තියෙනවා. ෂාජහන් - මුම්ටාස්, සාලිය - අශෝකමාලා ආදී ප්‍රේම කතා මතක් කරගන්න. ඒ තමයි ආදරයේ හැටි. කොයි මොහොතේ කවුරු ආදරයේ පැටලෙනවද දන්නෑ. මේ ජූරි සභාවේ ඉන්න ඔබ, අද මේ නඩුව ඉවර වෙලා ගෙදර යනකොට ඔබට මොහොතකට විශ්වාසයෙන් දැන් කියන්න පුළුවන්ද ඔබේ ඇස් තව ඇස් දෙකක පැටලිලා පුලිඟුවක් මෙන් දැවෙන්නෙ නැතිවෙයි කියලා? හිතන්න, මේ මැරිලා ඉන්නෙ ඔබගේම දියණියක් කියලා. ඇයට සාධාරණයක් ඉටු කරන්නට ඔබට නොහැකිද? ඒ නිසා මේ නඩුවෙදි හැඟීම්බර වෙන්න එපා. මේ කියන මමත්, ඔබත් අතීතයේ පෙම් සබඳතාවල ඉන්න ඇති. අනාගතයේ නොඉඳිවී කියලා තහවුරුවක් දෙන්න බෑ. ඒ නිසා මේ දෙස මැදහත් මනසකින් බලලා නිවැරදිව මේ නඩුව විසඳන්න."

පසුව එළැඹුණේ පැමිණිල්ල විභාගයට ගන්නා අවස්ථාවයි. විත්තියේ තර්කය වූයේ සාගර අපරාධ සහායකයකු බවයි. අපරාධ නඩු විධාන සංග්‍රහයේ 256 වගන්තිය අනුව අපරාධය සිදුවන බව දැන දැනම ඊට සම්බන්ධ වන්නන්ද අපරාධ සහායකයින් ලෙස සැලකේ. සාක්ෂි ආඥා පනතේ 114 අනුව අපරාධ සහායකයකුගේ සාක්ෂිය විශ්වාස නොමැති බවට බිඳ හෙළිය හැකි පූර්ව නිගමනයක් පවතී. එබැවින් වෙනත් සාක්ෂි මඟින් තහවුරු නොකළ එවැන්නකුගේ සාක්ෂියකින් විත්තිකරුවකු වරදකාරයකු කිරීම අවදානම් සහගත බව විත්තියේ තර්කය විය. එහෙත් ඔහු එසේ කළේ ස්වේච්ඡාවෙන් නොවන බවත් භීතියට පත්කිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් බවත් පැමිණිල්ල පෙන්වා දුන්නේය. පසුව වෙනත් ස්වාධීන සාක්ෂි මඟින්ද ඒවා තහවුරු කෙරිණ. බිඳුණ සංඥා ලාම්පුවේ කැබලි එහිදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. තවත් සාක්ෂිකරුවන් කිහිපදෙනෙකු අධිකරණයට ඉදිරිපත් කෙරිණ. අවසානයේ 6:1 ක් ලෙස ජූරිය තීන්දු කළේ සියලු විත්තිකරුවන් වරදකරුවන් කිරීමටයි. ඒ අනුව පළමු විත්තිකාරිය මිනීමැරීමට කුමන්ත්‍රණය කිරීමේ චෝදනාවට සහ සෙසු විත්තිකරුවෝ මිනීමැරීම සහ පැහැරගෙන යාමේ චෝදනාවලට වරදකරුවන් වූහ. වසර දෙකකට පසු මෙම තීන්දුවට එරෙහිව අභියාචනයක්ද ගොනු කෙරිණ. එහෙත් පළමු විත්තිකාරිය සිය අභියාචනය ඉල්ලා අස්කර ගනිමින් මරණ දඬුවම් ලැයිස්තුවට එක් වූවාය. ඉන්පසු හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ධුර කාලයේදී ඇය ජනාධිපති සමාවක් ලබා නිදහස් වූයේ ජාත්‍යන්තර කාන්තා දිනයකදී වීම විශේෂත්වයකි. කාගේවත් උවමනාවක් මත අපරාධයට සම්බන්ධ සෙස්සන්ට ගැලවීමක් නොවීය. විජිත් කේ.මලල්ගොඩ සහ එච්.ජී.ඒ.මඩවල අභියාචනාධිකරණ විනිසුරන් විසින් ඔවුන්ට එරෙහි මරණ දඬුවම ස්ථිර කරනු ලැබුවේ බලයට, මුදලට යටත්ව අපරාධවලට සහාය වුවහොත් එහි විපාක විඳීමට සිදුවන බව තහවුරු කරමිනි.

■ **නීතීඥ රෂ්නිකා ලියනගේ**

කේක් හදන්නත් පුළුවන්... ඇඳුම් මහන්නත් පුළුවන්... මේ ඔක්කොම කරන ගමන් ගැරේජ් වැඩත් මට පුළුවන්

"ගෑනුන්ගේ සිනිඳු අත්වලින් බර වැඩ කරන්න බැහැ කියන එක පිරිමින්ගේ වාසියට හදාගත්තු පට්ටපල් බොරුවක්. එතකොට දැලි නාවර පෙරාගෙන ගෑනු කුස්සියේ බර වැඩ කරන්නේ කොහොමද? ළමයි උකුලේ ගහන් බරට බරේ වතුර පනිවිටු උස්සන් හැතැප්ම ගණන් පයින් ගාටන්නේ කොහොමද?"

මේ 2015 තිරගතවෙච්චි 'The lady mechanic' චිත්‍රපටයේ කතානායිකාව කියන දෙබසක්. ඇය තමයි සැන්ඩ්‍රා අගුබර්, නයිජීරියාවේ ප්‍රථම මෝටර් රථ කාර්මික ශිල්පිනිය. ඇගේ ජීවිත කතාව පාදක කරගෙනයි මේ චිත්‍රපටය හදලා තියෙන්නේ.

ගෑනුන්ට බර වැඩ බැහැ කියන මතය දැඩිව විශ්වාස කරපු රටක් නිසා 1994 වෙද්දිත් නයිජීරියාවේ කාන්තා කාර්මික ශිල්පිනියන් ඉඳලා නැහැ. ඒ නිසා ගෑනුන්ට කරන්න බැහැ කියලා කියපු දේවල් කරලා පෙන්වන්න ඉටාගත්තු සැන්ඩ්‍රා සෑහෙන කට්ටක් කාලා ඒ අරමුණ ජය අරන්. නමුත් ඒ තැනට යන්න පිරිමියෙක්ට වඩා විසි තිස් ගුණයක පරිශ්‍රමයක් දරන්න වුණු බවත්, මුලදි පිරිමි සගයන් ඇයව පිළිගන්න අකමැති වුණු බවත් මාධ්‍ය සාකච්ඡාවලදි ඇය පවසා තිබුණා.

සැන්ඩ්‍රා ඇරුණුකොට අද්‍රටත් නයිජීරියාවේ කාර්මික ශිල්පිනියන් අඩුයි. වෙන රටවල් ගැන එහෙම කිව්වට අපේ රටේ තත්ත්වෙත් ඔයිට දෙවැනි නැහැ. ජලනල කාර්මික ශිල්පය, වාහන හදන එක, ඉලෙක්ට්‍රික් වැඩ යුරෝපේ ගෑනුන්ට සාමාන්‍ය රස්සා වුණාට අපේ රටේ එහෙම තත්ත්වයක් නැහැ. සමාජයෙන් එන අභියෝග වැඩියි කියලා හිතන නිසාදෝ කාන්තාවෝ වුණත් ඒ වගේ පැතිවලට යොමුවෙනවා හරි අඩුයි.

අපේ කතානායිකාව සංජනා ගමගේ ඒ අභියෝගයටත් අභියෝග කරපු අවුරුදු විස්සක ළාබාල යුවතියක්. බහුතරයක් ගෑනු ළමයි කේක් හදන හැටි, මැහුම් ගෙතුම්, රූපලාවණ්‍ය විතරක් ඉගෙනගනිද්දි සංජනා ඒ හැමදේමත් එක්ක මෝටර් කාර්මික ශිල්පයත් හදාරලා. 'ධරණී' මුල්පිටුවේ හැමදාම තැනක් දෙන්නේ සුවිශේෂී තාලෙට හිතන විශේෂ කාන්තාවන්ට. හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ග්‍රාමයේ ජීවත්වෙන සංජනාව හොයාගෙන අපි අම්බලන්තොටටම ගියේ ඇගේ කතාවත් ඒ තරම්ම සුවිශේෂී කතාවක් නිසයි.

"හැමදේම ඉගෙනගන්න පුතේ! පිරිමින්ට පුළුවන් හැම වැඩක්ම ගෑනුන්ටත් පුළුවන්."

ගෑනු දරුවෝ ඉන්නේ කුස්සියේ වැඩ කරන්න කියලා පුංචි කාලෙදිම ඒ අයගේ ඔලුවට දැන බහුතරයක් දෙමාපියන් අතරේ සංජනාගේ අම්මයි තාත්තයි ඇයට උපදෙස් දුන්නේ ඔහොමලු.

"අම්මයි තාත්තයි නිතරම එහෙම කිව්ව නිසා හැමදේම ඉගෙනගන්න ඕනේ කියලා මටත් හිතුණා. තාත්තට කැබ් එකක් තියෙනවා. වාහනේ කැඩුණහම ඒක හදන්නේ තාත්තමයි. මොකද එයාට වාහන ගැන හොඳ දැනුමක් තියෙනවා. අවුරුදු දහයේ වගේ ඉඳලා වාහනේ හදන්න මමත් තාත්තට උදව් කළා. වාහනේ හදන ගමන් තාත්තා ඒ වැඩ එකින් එක මට කියලා දුන්නා."

මව පියා ඇරුණුකොට සංජනාගේ පවුලේ තව මල්ලිලා දෙන්නෙක් ඉන්නවලු.

"මම ඉගෙනගත්තේ අම්බලන්තොට ථෙරපුත්ත ජාතික පාසලෙන්. සාමාන්‍ය පෙළ විභාගයෙන් හොඳ ප්‍රතිඵලයක් ලැබුණා. මම මුලින්ම තෝරගත්තේ ගණිත අංශය. කොවිඩ් කාලේදි අපේ ඉස්කෝල වැහුණා. හරියට ක්ලාස් කෙරුණෙත් නැහැ. ඉතින් ගණිත අංශයෙන් විභාගේ කරගන්න අමාරු වෙයි කියලා හිතුණු නිසා මම තාක්ෂණ විෂය ධාරාවට මාරු වුණා. ඉංජිනේරු තාක්ෂණවේදය තමයි එතැනදි මම තෝරගත්තේ. සිවිල් තාක්ෂණවේදය, ඉලෙක්ට්‍රිකල්, ඉලෙක්ට්‍රොනික්, ඔටෝමොබයිල්, ප්‍රඩක්ශන් ඔය හැමදෙයක්ම මේ විෂයට ඇතුළත්.

රසාංග සමරතුංග ගුරුතුමා තමයි ඉංජිනේරු තාක්ෂණවේදය හදාරන්න මාව යොමු කළේ."

සංජනා ඉංජිනේරු තාක්ෂණ විෂයන් තෝරගත්තු එක ගැනත් ඇගේ දෙමාපියන් සෑහෙන සතුටු වුණාලු. "පිරිමි අය අඬුව අතට ගන්න කලින් ඔයා අඬුව ගන්න පුරුදු වෙන්න" කියලා සංජනාගේ පියා ඇයට නිතරම කිව්වලු. හැබැයි මේ වගේ විෂයක් ගෑනු ළමයින්ට ගැළපෙන්නේ නැහැයි කියල කියපු උදව්යත් හිටියලු.

"ගෑනු අයට කරන්න ඕන තරම් සබ්ජෙක්ට්ස් තියෙද්දි ඇයි ඔටෝමොබයිල් තෝරගත්තේ, ඔව්වා ගෑනු ළමයින්ට කරන්න පුළුවන් වැඩද කියලා සමහරු ඇහුවා. මපං ගාගන්න එක ගෑනු අයට ගැළපෙන දෙයක් නෙමෙයි කිව්වා."

මපං ගාගන්න එක මූණේ දැලි ගාගන්න මට්ටමට දාලා කතා කරන උදව්විය කියන කතා වම් කනෙන් අහලා දකුණු කනෙන් පිට කරනවා කියලයි සංජනා අපිත් එක්ක කිව්වේ.

ඒ කතාවලට ඇහුම්කන් නොදුන්නු සංජනා ඉංජිනේරු තාක්ෂණ විෂයේ දිස්ත්‍රික් ශ්‍රේණිගතකිරීම්වල 85 වැනි තැන ලබාගනිමින් විභාගය හොඳින් සමත් වෙලා මොරටුව විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙන්න සුදුසුකම් ලබාගත්තලු.

"විභාගය ඉවර වුණාට පස්සෙ පාසලේ මඟපෙන්වීම යටතේ ජාතික ආධුනිකත්ව මණ්ඩලේ (NAITA) ඔටෝමොබයිල් ඉංජිනේරු පාඨමාලාවකට සම්බන්ධ වුණා. කෝස් එකේ මාත් එක්ක තව ගෑනු ළමයෙක් හිටියා."

පාඨමාලාවේ ප්‍රායෝගික පුහුණුවට සංජනාව සහ ඇගේ මිතුරියව අම්බලන්තොට ලංගම ඩිපෝවට යොමු කරලා.

"ඔටෝමොබයිල් ටෙක්නිෂියන් කෙනෙක් වුණහම පෙට්‍රල් වාහන වගේම ඩීසල් වාහන ගැනත් ඉගෙනගන්න ඕනේ. ඩිපෝ එකේ තියෙන්නේ බස්නේ. ඉතින් අපිව එතැනට දැම්මේ ඩීසල් වාහන ගැන ඉගෙනගන්න. ඩිපෝ ගරාජ් එකෙ වැඩ කරන්නේ පිරිමි අය විතරයි. ඊට කලින් කවදාවත් ඩිපෝ ගරාජ්

"දැන් ඩිපෝවේ ඩීසල් ට්‍රේනින් එක ඉවරයි. කැම්පස් පටන්ගත්තහම කැම්පස් යනවා. මම මේ පැත්ත ඉගෙනගත්තේ සල්ලි හම්බකරන්න බලාගෙනම නෙමෙයි. හැබැයි ගරාජ් යතුරු ටික අරන් එළියට බැස්සොත් මට සල්ලි හම්බකරන්නත් පුළුවන්"

එකේ ගෑනු ළමයි වැඩ කරලත් නැතිලු. ඒ නිසා ඒ අයත් මුලින් ටිකක් පුදුම වුණා. හැබැයි එයාලා අපිට ගොඩක් උදව් කළා.

ඩිපෝ එකට ගිය මුල් කාලේ මට කිසිම ලෙඩක් අඳුරගන්න බැහැ. හැබැයි දැන් නම් ගොඩක් ලෙඩ අඳුනගන්න පුළුවන්. රෝද ගලවලා ටයර් මාරු කරන එකේ ඉඳලා එන්ජින් රෙපෙයාර්, ගියර් බොක්ස් රෙපෙයාර්, ක්ලච් ප්ලේට්, ප්‍රෙශර් ප්ලේට් හයි කරන්න, බ්‍රේක් ලයිනර් ගහන්න, ඕල්ටනේට් රෙපෙයාර්, දුනු ගැසීම ඇතුළු ගොඩක් වැඩ තනියම කරන්න පුළුවන්."

ගෑනුන්ට බර වැඩ බැහැයි කියලා සමහරු කියනවනේ. ඇත්තටම සංජනාට ඔය වැඩ අමාරු නැද්ද?

"මුල් කාලේ අමාරුයි කියලා දැනුණා. ගෙදර ගියාම ඇඟට අමාරුයි. කොන්ද රිදෙනවා. හැබැයි පස්සේ පස්සේ ඒ දේවල්වලට හුරුවුණා. අනික අමාරුයි කියලා කිසිම වෙලාවක අතෑරියෙත් නැහැ. කඹවලින් ගියර් බොක්ස් එහෙම බාද්දි අපිට අමාරු වෙයි කියලා හිතලා පිරිමි අය අපිට අයින් වෙන්න කියනවා. හැබැයි අපි නෙමෙයි අයින් වුණේ. ගොඩක් වෙලාවට අපි බර වැඩ උදුරලා අරන් අපිට පුළුවන් කියලා කරනවා."

බර වැඩ කරනවා කිව්වට සංජනාගේ අතේ නියපොතු ටිකත් හරි ලස්සනට තිබුණා. කොහොමත් ඉතින් ගෑනු ළමයි ලස්සනට ඉන්න ආසයිනේ.

අතේ මජං ගෑවෙනවට සංජනා අකමැති නැද්ද?

"එහෙම අකමැත්තක් තියාගෙන මේ වැඩ කරන්න බැහැ. හැබැයි අපිත් එක්ක ඩිපෝ එකේ වැඩකළ එක අංකල් කෙනෙක් හිටියා. එයාගේ ගරාජ් ඇඳුම සෝදලම දියවෙලා. වැඩේ කියන්නේ ඒ ඇඳුමේ එක මජං බිඳක් නැහැ. හැබැයි එයා ගොඩක් දක්ෂයි. 'ඇඟ පුරා මජං ගාගන්නවා කියන එකෙන් කෙනෙක් දක්ෂයි කියලා අදහස් වෙන්නේ නැහැ, ඒ නිසා පුළුවන් තරම් පිරිසුදුව ඉන්න, ආරක්ෂාව ගැන හිතන්න' කියලයි එයා අපිටත් කිව්වේ. ඒ කතාව මාත් හොඳට ඔලුවට ගත්තා. සුදු ඇඳුමක් ඇඳගෙන මජං නොගා ටයර් එකක් මාරු කරන්න මටත් දැන් පුළුවන්. මේ වගේ වැඩ කරද්දි නියපොතු සවුත්තු වෙයි, කළුවෙලා කැත වෙයි කියලා ගෑනු ළමයි හිතනවා. අපේ ඇඟ ලස්සනට තියාගන්න එක අපේ වැඩක්. එහෙම නැතිව මේ වගේ දෙවල් කළා කියලා රූපයට හානියක් වෙන්නේ නැහැ කියන එකයි මගේ අත්දැකීම."

සංජනාගේ ඉදිරි බලාපොරොත්තු ගැනත් ඔය අතරෙදි අපි ඇයගෙන් ඇහුවා.

"දැන් ඩිපෝවේ ඩීසල් ට්‍රේනින් එක ඉවරයි. පෙට්‍රල් වාහන පුහුණුවට සහභාගී වෙන්න බලාගෙන ඉන්නවා. කැම්පස් පටන්ගත්තහම කැම්පස් යනවා. මම මේ පැත්ත ඉගෙනගත්තේ සල්ලි හම්බකරන්න බලාගෙනම නෙමෙයි. හැබැයි ගරාජ් යතුරු ටික අරන් එළියට බැස්සොත් මට සල්ලි හම්බකරන්නත් පුළුවන්."

සංජනා කතා කළේ නිහතමානී ආඩම්බරකමකින්. අවසාන වශයෙන් 'ධරණී' කියවන ඔබ වෙනුවෙන් ඇය කිව්වේ මෙහෙම දෙයක්.

"දැන් හිතන්නකෝ ගෑනු කෙනෙක් තනියම වාහනයක් පැදන් යද්දි වාහනේ මගදි කැඩුණොත් පිරිමි කෙනෙක්ගේ උදව් ලැබෙනකල් බලාගෙන ඉන්න වෙනවා. මෙහෙම දෙයක් ඉගෙනගෙන තියෙන එක ඒ වගේ වෙලාවකට කොච්චර හයියක්ද? ගරාජ් වැඩ විතරක් නෙමෙයි මට හොඳට උයන්න, කේක් හදන්න එහෙමත් පුළුවන්. අනිත් ගෑනු ළමයි කඩෙන් ඇඳුම් අරන් අඳිද්දි අවුරුදු පහළොවේ ඉඳලා මම තනියම මගේ ඇඳුම් මහගන්නවා. මම අනිත් අයටත් කියන්නේ ගෑනු-පිරිමි බේදයක් නැතිව හැමදේම ඉගෙනගන්න. ඉගෙනගත්තු දෙයක් කවදාවත් අපතේ යන්නේ නැහැ."

■ **සෙව්වන්දි හෙට්ටිආරච්චි**

ඡායාරූප - මධුසංඛ සිරිවර්ධන

පසුතලය - අම්බලන්තොට ඩිපෝව

අපේ පුංචි නංගිලා මල්ලිලාට දැන් පෙර පාසලේ පටන් ශිෂ්‍යත්වය දක්වාම හරිම පිළිවෙළට ඉගෙන ගන්න

පාඩම් සඳහා මාර්ගෝපදේශ නිර්දේශිත සිංහූර පොත් දරුවන්ගේ නිපුණතා වර්ධනය පෙන්වයි

මාසික අධ්‍යාපනික පුවත්පත් 6 ක්

අවසන් වාර විභාගයට අභ්‍යාස සමඟින්

මාර්තු කලාපයන් දැන් වෙළෙඳපොළේ

විශේෂ ඇණවුම් සඳහා විමසන්න 076 2568348
දැන්වීම් සඳහා විමසන්න ශෙහාන් - 076 1393811

දිවයින පුරා පුවත්පත් නියෝජිතයින්ගෙන් , සරසවි පොත්හල් සහ අනෙකුත් පොත්හල්වලින් මිලදී ගතහැක

මහාචාර්ය අත්තනායක එම් හේරත් කියයි

පසුගිය සතියේ තරමක ආන්දෝලනාත්මක සිදුවීම් දෙකක් වුණා. එකක් ශ්‍රී පාද මළුව ආසන්නයේදී මවක් බිලිඳියක් ප්‍රසූත කිරීම. අනික පත්තිනි දේවාලයේදී දියණියක් වැඩිවියට පත්වීම. සිරිපා මළුවේදී ප්‍රසූත කරපු බිලිඳිය බොහෝ වාසනාවන්තයි කියලයි ගොඩක් අය කිව්වේ. ඒ නිසාම ජනමාධ්‍යවලිනුත් මේ සිද්ධියට විශේෂ අවධානයක් දීලා තිබුණා. ඒ විතරක් නෙවෙයි ශ්‍රී පාදස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ ඇතුළු සංඝයා වහන්සේලාත් මෙම දරු ප්‍රසූතිය ගැන කතාකළේ බොහොම සුබවාදීව. එදා අංගුලිමාල මහරහතන් වහන්සේ විලිරුදුව ඇති මවක් ළඟට ගොස් පිරිත් දේශනා කළා නම්, අපේ සංඝයා වහන්සේලා අද්‍යටත් ගැබ්බර මව්වරු ළඟටම ගොස් පිරිත් දේශනා කරනවා නම්, ශ්‍රී පාද පද්මය පේනමානයේ දරුවෙකු බිහිවීම බුද්ධ දර්ශනයට හෝ බුද්ධාගමට කිසිසේත්ම කැළලක් නොවන බවයි උන්වහන්සේලා අවධාරණය කළේ. ඒ නිසා ගැබිනි මව්වරුන්ට ශ්‍රී පාද වන්දනාව තහනම් වුණේ නැහැ. සිරිපතුල වැදුම් කිල්ලට අනුවුණාය කියලා කහ දියර, පිරිත් පැන් ඉහින්න ගියෙත් නැහැ. කොටින්ම කියනවානම් ඒ දරු ප්‍රසූතිය බුදුන්ට හෝ සමන් දෙවි හාමුදුරුවන්ට සිදුවුණ කැළලක් විදියට සලකලා හෑල්ලුවට ලක්කළෙත් නැහැ.

හැබැයි නවගමුව පත්තිනි දේවාලයේදී දියණියක් වැඩිවියට පත්වීමේ සිද්ධිය නිසා දේවාලේ ඇත්තෝ ඊට හාත්පසින්ම වෙනස් විදියකට හැසිරෙන්න ගත්තා. සිරිපතුල වහලා නොදැම්මට මොකද පත්තිනි දේවාලේ කපු මහත්තුරු දේවාලය සතියකට වහලා දැම්මා. හේතුව විදියට කියලා තිබුණේ පත්තිනි අම්මව මල්වර කිල්ලට අනුවුණාය කියන එක.

පුරුෂ පක්ෂයේ උපන් ගෞතම බුදුන් වහන්සේටවත්, සංඝයා වහන්සේලාටවත්, සමන් දෙවියන්ටවත් කිල්ලක් නොවුණු ගැහැනිය, ගැහැනියක් වුණ පත්තිනි මෑණියන්ට කිල්ලක් වෙන්න පුළුවන්ද?

ඒ ගැන මේ කතාබහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විශ්‍රාමික මහාචාර්ය අත්තනායක එම්.හේරත් මහතා සමඟින්.

ඔය තියෙන්නේ පත්තිනි අම්මාගෙන් වරදට සමාව ගන්න තියෙන පත්තිනි හෑල්ලෙම කවියක්. මම ඒකයි කිව්වේ ඔය කපු මහත්තුරු උදේ හවස කියවන හෑල්ල මොකක්ද කියලවත් දන්නේ නැතුව ඇති කියලා. මොකද නිකමට හරි එහෙම දැනගෙන හිටියානම් අඩුතරමින් ඔය කවියක් කියලා පත්තිනි අම්මාගෙන් සමාව අරගෙන හතරකොණට කහ දියර ටිකක් හරි ඉහලා දේවාලේ අරින්න තිබුණානේ.

ඊළඟට ඔය කපු මහත්තුරු කොහොමද දන්නේ මාස් ශුද්ධිය හැදුනු තරුණ දුවලා සහ කාන්තාවෝ කීදෙනෙක් නම් දවසකට ඔය දේවාලෙට යනවා එනවද කියලා?

හරි දැන දැනමත් එහෙම නාවයි කියමුකෝ. ඒත් දේවාලෙ ඇතුළෙදි වන්දනාමාන කරද්දි දුවලා අම්මලා කී දෙනෙකුට නම් ඔය සිද්ධියට මුහුණදෙන්න වෙනවා ඇද්ද?

ඔය විදියට බලනකොට මළපහ, මුත්‍රා කරන මේ අපි කොයි කවුරුත් පත්තිනි වේවා වෙන දේවාලෙකට වේවා යන එකත් කිලි ඇතිනේ? එතකොට ඔය කපු මහත්තුරු එහෙම මළපහ, මුත්‍රා කරන උදවිය නෙවෙයිද?

පත්තිනි මෑණියනේ නවගමුව දේවාලේ කපුවන්ට පන්තියක් පවත්වනු මැනේ

ඔය වැදුම්ගෙයි කිල්ලයි, මල්වර කිල්ලයි වගේම තවත් එකක් තමයි කාන්තාවන්ගේ මාස් කිල්ල කියන්නෙත්. ඒ නිසා අද මම මේ කතාව එදා කාන්තාවන්ගේ මාස් කිල්ලෙන් පටන්ගන්නම්.

සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධීන් වහන්සේව අපේ රටට වඩම්මවාගෙන ආවේ ඉන්දියාවේ වේතිස්සපුරේ ඉඳලා. ඇයට ශ්‍රී මහා බෝධීන් වහන්සේව වඩම්මන්න මාස තුනක පමණ කාලයක් ගතවුණා. එතකොට ඒ මාස තුනේදිම එතුමියටත් මාසික ඔසප්වීම් තුනකට මුහුණදෙන්න සිද්ධවුණා. එහෙම බලනකොට ජයසිරිමා බෝධීන් වහන්සේත් අතරමඟදිම කිලි තුනකට අහුවෙලා තියෙනවා.

හැබැයි එහෙමයි කියලා අපි ජයසිරිමා බෝධීන් වහන්සේව ප්‍රතික්ෂේප කළේ නෑනේ. අපි උන්වහන්සේව අප්‍රමාණ ගෞරවයකින් පිළිඅරන් අනුරාධපුර උඩමළුවේ රෝපණය කළා. ඔය කියන විදියට ගෑනුන්ගේ මාස් කිල්ලට අහුවෙන ඕනම දෙයක් හෑල්ලුවට අපහාසයට ලක්වෙනවා නම් මේ වෙනකොට ජයසිරිමා බෝධියත් අපිට නිකම්ම නිකන් ගහක් විතරක් වෙලා තියෙන්න ඕන. ඒත් අදටත් උන්වහන්සේට වන්දනාමාන කරන ලක්ෂ සංඛ්‍යාත ජනතාව දැක්කම තේරෙනවා සංඝමිත්තා තෙරණියගේ මාස් කිල්ලෙන් උන්වහන්සේට අබමල් රේණුවකවත් හානියක් වෙලා නෑ කියලා. අනික සංඝමිත්තා තෙරණිය විසින් වඩම්මවපු ජයසිරිමා බෝධීන් වහන්සේව ආරක්ෂා කළෙත් ඔය කිලි තියෙනවායි කියන ගෑනු උදවියම තමයි. ඒ කාලේ අර අනුරාධපුරේ මහ කැලේ අලි ඇත්තු උන්වහන්සේව පෙරළන්න එනකොට අපේ කාන්තාවෝ රෑ එළිවෙනකන් දරසෑයවල් බැඳගෙන බෝධීන් වහන්සේව මුර කරලා තියෙනවා. මං අහන්නේ එතකොට ඒ අතරේ හිටපු කිසිම කාන්තාවකට ඔය මාස් ශුද්ධිය වෙලා නැද්ද? අදටත් නිකිණි පෝයට දරමිටි පෝය කියලා වන්දනාමාන කරන්නේ එදා ගිනිමැල ගහගෙන උන්වහන්සේව රැකගත්තු අර කාන්තාවොන්ට උපහාරයක් විදියට.

ඒ වගේම තමයි දළඳ වහන්සේව වඩම්මවාගෙන එන අතුරතුරේදි හේමමාලා කුමරියටත් ඔය සන්තෑසියම වෙලා තියෙනවා. ඇයටත් ඔය විදියටම එන අතරමඟට මාස තුනක් කල්ගතවෙලා තියෙනවා. ඒ තුන් මාසෙදිම ඇයටත් අර විදියටම මාස් ශුද්ධීන් තුනක් සිද්ධවෙලා තියෙන්න ඕන. ඒ කියන්නේ කිලි තුනක්. නමුත් හේමමාලා කුමරියගේ මාස් කිල්ල නිසා දළඳ වහන්සේට පුංචිවත් කැළලක් වෙලා තියෙනවා කියලා ඔය කවුරුත් අහලා තියෙනවද? ඔය කියන විදියට සංඝමිත්තයි, හේමමාලායි දෙන්නත් එදා අපිට කිලි තියෙනවා, අපි ගෑනුනේ කියලා ඔය දෙක නොගෙනාවානම් අද අපිට වැඳුම් පිදුම් කරන්න ඔය දෙකම නැතිවෙන්නත් ඉඩ තිබුණා.

සංඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේ ජයසිරිමා බෝධිය වඩම්මද්දි උන්වහන්සේටත් තුන්පාරක් මාස් ශුද්ධිය හැදුනා

මේ සිද්ධියේදීත් ශ්‍රී පාදස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ ඇතුළු සංඝයා වහන්සේලා නියම ධර්මාවබෝධයකින් කටයුතු කරපු නිසා ගොඩක් උදවියට ශ්‍රී පාද මළුව පේනමානයේ දරුවෙක් ප්‍රසූත කිරීමේ සිද්ධිය ගැටලුවක් වුණේ නෑ. මොකද භාග්‍යවතුන් වහන්සේගේ ධර්මයේ කිසිම තැනක ඔය කියන විදියට කාන්තාව කිල්ලක් විදියට අඳුන්වලා නෑ.

හැබැයි අද කාලේ දේවාලවල වැඩ කරන සමහරක් කපු මහත්තුරු නම් බුදුන්ටත් ඉහළින් ගිය උදවිය කියලයි මට හිතෙන්නේ. මොකද මම වගකීමෙන් කියනවා එදා නවගමුව දේවාලෙදි වැඩිවියට පත්වුණ දුවව කිල්ලක් වෙලා තියෙන්නේ පත්තිනි මෑණියන්ට නෙවෙයි දේවාලේ හිටපු කපු මහත්තයට කියලා. හේතුව තමයි උන්දැලා උදේ හවස දේවාලෙට වෙලා යටිගිරියෙන් පත්තිනි හෑල්ල කියලා කෑගැහුවට පත්තිනි මෑණියෝ කියන්නේ කවුද කියලාවත් හරියට දන්නේ නැති උදවිය වෙන්න ඕන. මොකද පත්තිනි හෑල්ලේ කියැවෙන විදියට ඇයත් මතු බුදුබව ප්‍රාර්ථනා කරන වීර උත්තමාවියක්. එක්තරා ආත්මභවයක අනන්ත අප්‍රමාණ දුක්ගැහැට්වලට මූණදුන්නු ගැහැනියක්. ඒ නිසා කාන්තාවොන්ගෙන් හෝ දරුවෙකුගෙන් නොදැනුවත්ව වෙන වරදකට ඇය අම්මා කෙනෙක් විදියට සමාව දෙනවා කියලත් ඒ හෑල්ලෙ සඳහන් වෙලා තියෙනවා. එහෙම එකේ මේ අහිංසක දුවෙක් ඇගේ ඉස්සරහා මල්වර වුණා කියලා පත්තිනි අම්මා කීයටවත් කෝප වෙනවද?

'උමාසිරි දෙබසට
කමා කර දුටු වරදට
පමා නොව මෙරගට
දමා දෑතේ වළලු නදකොට'

අවසාන වශයෙන් මගේ තර්කය වෙන්නේ මෙන්න මේකයි. බුදුන් වහන්සේයි, පත්තිනි මෑණියොයි කියන්නේ අපි බොහොම ගරු කරන සංකල්ප දෙකක්. එදා අර අම්මා සිරිපා මළුවට ආසන්නයේ දරුවෙක් ප්‍රසූත කළෙත්, පත්තිනි දේවාලෙදි දුවෙක් මල්වර වුණෙත් ඉතිහාසේ පළවැනි වතාවට. නමුත් ශ්‍රී පාද අඩවියේ නායක හාමුදුරුවොයි, අපේ සංඝයා වහන්සේලායි නුවණ ඇතිව කටයුතු කරපු නිසා තව අවුරුදු ගාණකින් ජනමාධ්‍යවලින් ඇයව හොයාගෙන යයි. ඒ ශ්‍රී පාද මළුවේ ඉපදුණු පළවැනි දුව විදියට. එතකොට ඇයට තමන් ගැනම පුදුමාකාර ආත්මාභිමානයක් දැනෙයි.

ඒත් එදා ඉතිහාසයේ පළවැනි වතාවට පත්තිනි දේවාලෙදි මල්වර වුණ අර අහිංසක දුවගේ මනසට මෝඩ කපුවෝ දැම්මේ ඇය මහා කාලකණ්ණි කිල්ලක් කියන අදහස. එතකොට ඒ දුවගේ හිතේ තමන් ගැනම මහා වරදකාරී හැඟීමක් ඇතිවෙන්නත් ඉඩ තියෙනවා. අන්න ඒ නිසා පත්තිනි දේවාලේ කපු උන්දැලට නම් මට කියන්න තියෙන්නේ තමන් උදේ හවස කියවන හෑල්ල ගැන ඔයිට වඩා ටිකක් වැඩි අවධානෙන් ඉන්න කියන එක.

■ ලිහිණි මධුෂිකා

බොබ්මාලි කියන්නේ සමාජ අසාධාරණවලට එරෙහිව ගීතයෙන් හඬනගපු ගායකයෙක්. 'පුංචි මිනිහා'ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ඔහු තනිපුද්ගල සටනක නියැලුණා. ඒ නිසාම දේශසීමා හේදයක් නැතිව ලෝකයක් ආදරය කරන ගායකයෙක් බවට පත්වෙන්න බොබ්මාලිට පුළුවන් වුණා. හැබැයි එහෙව් බොබ්මාලිවත් අපේ සමහර මිනිස්සු අල්ලගත්තේ වැරදි තැනින්. සමහරුන්ට ඔහුගේ 'හොඳ හිතට' වඩා අතේ තිබුණු ගංජා සුරුට්ටුව පේන්න ගත්තා. ඒ නිසා එවන් පිරිස් ඔහුව විවේචනය කළා. මං හිතන්නේ අපේ රටේ පුංචි එවුන් පවා නම කිවූ සැනින් දන්න පියුමි හංසමාලිටත් වෙලා තියෙන්නේ ඒ ටිකමයි. බොහොම සරාගී විදියට පෙනෙන ඇගේ 'ළැම' ගැන මිසක් අසරණ මිනිසුන්, අසරණ සතුන් වෙනුවෙන් උණුවෙන ඇගේ 'ළය' බොහෝදෙනෙකුට නොපෙනීම කණගාටුවට කරුණක්. ඉතින් පියුමි එක්ක මේ කතාබහ ඇගේ නොපෙනෙන 'ළය' ගැන මිසක් 'ළැම' ගැන නම් නෙවෙයි.

කෙනෙක්ගේ මූණට හිනාවක් ගේන්න පුළුවන් නම් මං දෙපාරක් හිතන්නේ නෑ

ළැම පමණක් පෙනෙන ළය නොපෙනෙන

පියුමි හංසමාලි 'ධරණී'ට කී කතාව

පියුමි හංසමාලි කියන ගැහැනිය හඳුන්වන නිර්වචනය මොකක් වෙන්න ඕන කියලද ඔබ කියන්නේ?

පොළොවේ පයගහලා ඉන්න හිත හයිය ගැහැනියක් කිව්වනම් හරියටම හරි.

හිනාවක් අහලකවත් නැති මිනිස්සුන්ගේ මූණට හිනාවක් ගේන එක දැන් පියුමිගේ ජීවිතේ කොටසක් වෙලාද?

මං හරි ආසයි මං හිනාවෙනවා වගේම මගේ වටේ ඉන්න මිනිස්සුත් හිනාවෙලා ඉන්නවා නම්. ඒ නිසා කෙනෙක්ගේ මූණට හිනාවක් ගේන දෙයක් කරන්න මං දෙපාරක් හිතන්නේ නෑ. මගේ ළඟ ලොකුවට සල්ලි නැති කාලෙත් මං මිනිස්සුන්ට ඇති තරම් උදව් කළා. සල්ලි පොට්ටනි ගහලා බැංකුවේ දාලා පරිස්සම් කළත් අපි මේ ලෝකෙන් යන දවසට ඒවා අරන් යන්න බෑ. මොකද මිනී ඇඳුමට සාක්කුත් නෑ. මිනීපෙට්ටියේ ලාච්චුත් නෑ. ඒ නිසා එදට අරන් යන්න තියෙන්නේ අපි කරපු හොඳ නරක ටික විතරයි. බලන්න කොවිඩ් කාලේ කෝටිපතියෝ පවා පොලිතින් උරේක අවසන් ගමන් ගිය හැටි. ඒ නිසා මං කොච්චර සල්ලි හෙව්වත් මට කන්න බොන්න අඳින්න ටිකක් තියාගෙන ඉතුරු ටික මිනිස්සුන්ගේ හිනාවල් වෙනුවෙන් වියදම් කරනවා.

දැන් ටික දවසකට කලින් ඔබ ඒ විදියට උදව් කරපු දරුවෙක් ගැන සමාජ මාධ්‍යයේ කතාබහක් ඇතිවුණා නේද?

දැන් දවස් කීපයකට කලින් මං පුතාට බෙල්ට් එකක් ගන්න කඩයක් ගාව කාර් එක නැවැත්තුවා. ඒ වෙලාවේ දැක්කා හරි ලස්සන පුංචි දරුවෙක් එතැන හඳුන්කුරු විකුණනවා. පස්සේ මං දරුවා ළඟට ගිහින් විස්තර ඇහුවා. ඒ වෙලාවේ එයා කිව්වා ගෙදර වියදම හොයාගන්න ඉස්කෝලේ ඇරිලා ආපු ගමන් හඳුන්කුරු විකුණන්න ආවා කියලා. පස්සේ මං එයාවත් අතින් අල්ලගෙන කඩේට ගිහින් එයාට කැමති දෙයක් අරගන්න කිව්වා. එයාට ඉතින් ලෝකයක් ලැබුණා වගේ. ඇඳුම් ගන්නවා. සපත්තු ගන්නවා. සෙල්ලම් බඩු ගන්නවා. මට පව් කියලා හිතුණා. මමත් දරුවෙක් ඉන්න අම්මෙක් නිසා වෙන්න ඇති මට ඒ දරුවව එතැනදි ගොඩාක් දැනුණේ. අන්තිමට ඒ දරුවට ගෙදර යන්න කියලා ට්‍රීවිල් එකකටත් ගොඩකරලා තමයි මං එතැනින් ගියේ.

සමහර වෙලාවට ඔබ අහිංසක දරුවන්ගේ හීන පාට කරනවා. මහපාරට වැටුණු අම්මලා තාත්තලාට පිහිටවෙනවා. අසරණ සතෙක් දැක්කොත් ඌ ගැන හොයලා බලනවා. එහෙම උණුවෙන හිතක් ලැබුණෙ කොහොමද?

මට හිතෙන්නෙ ඒක මගේ තාත්තගෙන් ආපු පුරුද්දක්. මං මගේ සීයා මට කියපු කතාවක් කියන්නම්. මගේ තාත්තගේ නම ලක්ෂ්මන්. දවසක් සීයට පාරෙදි තාත්තගේ ඉස්කෝලේ ප්‍රින්සිපල් මුණගැහිලා තියෙනවා. ඒ වෙලාවේ එයා සීයගෙන් ඇහුවලු "මොකද මේ ලකී බෝයි ඉස්කෝලේ එන්නේ නැත්තේ" කියලා. සීයට පුදුම හිතිලා. ඇයි ඉතින් ඉස්කෝලේ එනවා කියලා තාත්තා හැමදම උදේට ගෙදරින් එනවලු. පහුවද සීයා හොරාට තාත්තා පස්සෙන් ඇවිත්. එතකොට තමයි දැකලා තියෙන්නේ ඉස්කෝල වත්තට අල්ලපු වත්තේ බැල්ලක් පැටව් දෙලලු. තාත්තා තමයි එච්චර දවසක් උන්ට කන්න බොන්න දීලා බලාගෙන තියෙන්නේ. ඉතින් ඒ පුරුද්ද මටත් ඇවිත්.

ඉස්සර මමත් ඇන්දේ නැන්දගේ දුවගේ ඇඳුම්

කතාවක් තියෙනවා කදුළුත් එක්ක ජීවිතේ ගනුදෙනු කරපු මිනිස්සුයි හිනාවක වටිනාකම දන්නේ කියලා. පියුමිටත් එහෙම කඳුළු එක්ක ගනුදෙනුවක් තිබිලා තියෙනවද?

මොකද නැත්තේ? මමත් හරි දුප්පත් පවුලක කෙනෙක්. තාත්තා නැතිවුණාට පස්සේ අම්මා තමයි ගොඩක් දුක් මහන්සි වෙලා මාව හදාගත්තේ. ඒ නිසා නැතිබැරිකමයි බඩගින්නයි මං හොඳට අඳුරනවා. අපට තුන්වේලක් කන්න බැරිවුණු දවස් තිබුණා. ඒ වගේමයි ඒ දවස්වල මං ඇන්දේ අපේ නැන්දගේ දුවගේ ඇඳුම්.

හැබැයි මිනිස්සු ඔබව මනින්නේ අඳින පළඳින විදියෙන්. ඇත්තටම එහෙම පුළුවන්ද?

ඇඳුමින් පැළඳුමින් මිනිස්සු මනින්න බෑ. ඒකට හොඳම උදාහරණය මම. පොඩි කාලේ ඉඳන්ම මං ආසයි ලස්සනට අඳින්න. ඉතින් මම පුළුවන් හැම විදියෙන්ම ලස්සනට අඳිනවා. හැබැයි හැමදම මිනිස්සු දැක්කේ මං කොටට අඳින චකයි ඇඟපත පේන්න අඳින චකයි. අඳින පළඳින විදිය කියන්නේ චක ෆැෂන් චකක්. ඒකෙන් මිනිස්සු මනින්න බෑ.

***ඔය කියන කට කැඩිච්ච කතාවලට පියුමිගේ හිත රිදිලා නැද්ද?**

මං හරි ශක්තිමත් ගැහැනියක්. මං මේ ක්ෂේත්‍රයට ආපු දවසේ ඉඳන් මට ඇඟිලි දික්වුණා. හිත රිදෙන කතා අහන්න වුණා. හැබැයි මං ඒ හැමදේම තනියම දරාගෙන අදටත් ගහක් ගලක් වගේ ඉන්නවනේ. ඉතින් තවත් මොනවද? පියුමිගේ හිත හයියයි.

මිනිස්සුන්ට උදව් කරන එක වීඩියෝ කරලා ෆේස්බුක් දැම්මම සමහරු කියනවා ප්‍රසිද්ධිය බලාගෙනයි මේ දේවල් කරන්නේ කියලා. පියුමිත් එහෙමද?

මට තවත් ප්‍රසිද්ධ වෙන්න උවමනාවක් තියෙනවා කියලා හිතනවද? මොකද පියුමි හංසමාලි කිව්වම නොදන්න අයට වඩා දන්න අය වැඩියි. මං එහෙම දෙයක් දැම්මොත් දන්නේ තවත් කෙනෙකුට එහෙම දේවල් කරන්න හිත පහදවන්න මිසක් ප්‍රසිද්ධිය බලාගෙන නෙවෙයි.

මේ වෙනකොට ඔබ යම් යම් ව්‍යාපාරවලටත් අතගහලා ඉන්නේ. ඒ ගැන කිව්වොත්?

ඔව්. ළඟදි සැලෝන් එකකුත් පටන් ගන්නවා. මං ඒකට ඕනකරන දේවල් ඉගෙනගෙන ඉවරයි. ඒකට වෙන්කරලා තියෙන සල්ලිම තමයි පින්දහම් වැඩවලට ගන්නෙත්. ඒකයි ටික ටික ඒක කල් යන්නේ.

ඉස්සර වගේ නෙවෙයි අතළොස්සක් ඇරුණම දැන් බොහෝ පිරිසක් පියුමිට කැමතියි. කොහොමද එහෙම වුණේ?

ඒක මගේ පින. මං හැමදේම කාලයට බාරදුන්නා. කොතැනදිවත් බොරුවට දැඟලුවේ නෑ. හැමදේම කාලයට බාරදුන්නම පියුමි හංසමාලි කියන්නේ කවුද කියලා හැමෝම තේරුම්ගත්තා.

'ධරණී' කියවන කාන්තාවන්ට පණිවිඩයක් දෙන්න කිව්වොත් ඔබට මොනවද කියන්න තියෙන්නේ?

ගැහැනියක් වුණාම මුලින්ම ස්ථාවර වෙන්න. කවදාවත් පිරිමියෙක්ගෙන් යැපෙන්න ඕන කියන තැන ඉන්න එපා. හරි හයිය ගැහැනියක් වෙන්න. දැන් මට වයස තිහක්. මං හිතනවා දැන් මං ස්ථාවර ගැහැනියක් කියලා. ඒ වගේම පුළුවන් හැමවෙලේම පිනක් දහමක් කරන්න. මොකද අපිට යනකොට අරන් යන්න තියෙන්නේ එච්චරයි.

■ රුවන් එස්.සෙනවිරත්න

නහරකාරියන්ට වැඩිය හිටගෙන ඉන්න නරකයි

මේකට සර්ප වංගු කියලත් කියනවා

“එයා නාන්නේ නැහැ, එකම ඇඳුම දවස් ගාණක් අඳිනවා. ඒ මදිවට කකුල්වල නහර ඉලිප්පිලා සර්පයෝ වගේ. බලන්න කැතයි.”

අනූ ගණන්වලදි පොප් ලෝකේ හොල්ලන් හිටපු ඇමරිකාවේ බ්‍රිට්නි ස්පියර්ස්ව නොදන්න අය අඩුයි. කාලයක් බ්‍රිට්නි, ජේසන් ට්‍රැවික් කියලා නළු හාදයෙක් එක්ක සම්බන්ධයක් පැවැත්තුවා. පස්සේ මේ ඇයිහොඳැයිය නතරවුණා. සම්බන්දේ නතර වුණාට පස්සේ ජේසන් මාධ්‍ය ඉස්සරහට ඇවිල්ලා බ්‍රිට්නිගේ සායම හේදුව හැටි තමයි ඔය උඩින් සඳහන් කරලා තියෙන්නේ.

යාළුවෙලා ඉන්දැද්දි කිරිපැණි තාලෙට ඉඳලා සම්බන්දෙ නතර කළාම පෞද්ගලික දේවල් මාධ්‍යට කියාපු ජේසන්ගෙයි පෞද්ගලික විඩියෝ වගේ දේවල් ලීක් කරන බාල ගණයේ පෙම්වතුන්ගෙයි වෙනසක් නෑ කියලයි බ්‍රිට්නිගේ රසිකයො නම් කිව්වේ.

ඒ කොහොම වෙතත් කකුල්වල සර්පයෝ වගේ නහර පේන එක බ්‍රිට්නිට විතරක් නෙමෙයි ගෑනු 70%කට විතර තියෙන ප්‍රශ්නයක්. ඒ නිසා අද මාතෘකාව ඒක.

කකුල්වල නහර ගැටගැහිලා වගේ පේන එකට කියන්නේ වෙරිකොස් වේයින්ස් කියලා. නහර ගැටගැසීම කියලත් කියනවා.

මේ නහර කරදරේ මිනිස්සුන්ට අද ඊයේ ඇතිවුණු එකක් නෙමෙයි. ඊජිප්තු කැණීම්වලින් හම්බවුණු පුරාණ ඊජිප්තුවරුන්ගේ වෙද හෙදකම් ගැන ලියාපු ‘ඊබර්ස් පැපිරස්’ කියලා පැපිරස් පොතකත් මේ ගැන සඳහන් වෙලා තියෙනවා. ඒ කාලේ උදවියටත් මේ නහර ප්‍රශ්නේ තිබුණය එකෙන් තේරුම්ගන්න පුළුවන්. ඒ අය මේකට කියලා තියෙන්නේ ‘සර්ප වංගු’ කියලා.

කාලෙකට කලින් ග්‍රීසියේ ඇක්‍රොපොලිස් නගරෙන් ක්‍රි.පූ. 400ක් පරණ පිළිමයක් හම්බුණා. වෙරිකොස් හැදිච්චි කකුලක් අල්ලගෙන ඉන්න වෛද්‍යවරයෙක්ව තමයි ඒකෙන් නිරූපණය වෙන්නේ. කකුල්වල නහර ගැටගැහෙන එක බොහොම දරුණු ලෙඩක් කියලලු ඒ කාලේ උදවිය හිතුවේ. ඉතින් වෛද්‍යවරු අමු අමුවෙම මිනිස්සුන්ගේ කකුල් පළලා කොකුවලින් නහර දිග අරිනවලු. ඔය සැත්කම් නිසා දැස් ගාණක් මිනිස්සු මැරිලා. පස්සේ වෛද්‍ය විද්‍යාවේ පියා හිපොක්‍රටීස් නහර ගැටගැහෙන එක මාරාන්තික තත්ත්වයක් නෙමෙයි කියලා හොයාගෙන. ඊටපස්සේ අර මාරාන්තික සැත්කම් එහෙමත් නතර වුණාලු.

කකුල්වල මේ වෙරිකොස් වේයින්ස් ඇතිවෙන්නේ කොහොමද?

ඔන්න ඒක පැහැදිලි කරගන්න පුංචි පහේ විද්‍යා පාඩමකට යන්න වෙනවා. අපේ ඇඟේ තියෙන ටිකක් අපිරිසිදු ලේ ටික හෘදයට ගෙනියන්නේ ශිරා කියන නහර. ශිරා ගෙනියන ලේ හෘදයෙන් පිරිසුදු කළාම ධමනි එව්වා එතැනින් එළියට අරන් යනවා.

ස්කන්ධයක් තියෙන හැම වස්තුවක්ම පොළොව දිහාවට ඇදගන්නවා කියලා අයිසෙක් නිව්ටන් මහත්තයාගේ ගුරුත්වාකර්ෂණ නියමයෙන් කියැවෙනවනේ. හැමදෙයක්ම පොළොවට ඇදගන්නවා නම් කකුලේ තියෙන ලේ ටික උඩට අරන් යන්නේ කොහොමද? ඔය ප්‍රශ්නෙටත් සොබාදහමෙන් විසඳුම් දීලා තියෙනවා. අපි ටිකක් අතපය හොලවද්දි මස්පිඬු සංකෝචනය වෙලා කකුලේ තියෙන ලේ ටික උඩට යනවා. ශිරා නහර ඇතුළේ කපාල කියලා පියන් වර්ගයක් තියෙනවා. ලේ ටික උඩට ගියපු ගමන් කපාලවලින් නහර වැහෙනවා. එතකොට ශිරාට පුළුවන් රුධිරය හෘදයට පොම්ප කරන්න.

හැබැයි කපාල දුර්වල වුණහම මේ වැඩේ හරියට වෙන්නේ නැහැ. එතකොට නහරවලට පිරෙන රුධිර ප්‍රමාණය වැඩිවෙලා ඒ පීඩනේට නහර දඟර ගැහිලා ඉලිප්පිලා එළියට පේන්න ගන්නවා. හරියටම වතුර බටේකට දරාගන්න බැරිතරමේ පීඩනයක් ආපුවහම ඇද වෙන්නේ. ආන්න ඒ විදියට.

මේ විදියට කපාල දුර්වල වෙන්න බලපාන හේතු කීපයක්ම තියෙනවා. ප්‍රධානම දේ තමයි වැඩිපුර හිටගෙන ඉන්න එක. ගොඩක් වෙලා හිටන් ඉන්දැද්දි නහරවල රුධිරය පල්ලෙහාට තල්ලු වෙනවා. එතකොට ශිරාට ලේ උඩට අරන් යන්න අමාරුයි. ඔහොම වුණහම කපාලවල ක්‍රියාකාරිත්වයත් අඩුවෙන නිසා එව්වත් හරියට වැඩ කරන්නේ නැතිව යනවා. එකදිගට හිටගෙන රැකියා කරන අයට එහෙම මේ ප්‍රශ්නේ වැඩියි. දැනටමත් වෙරිකොස් තියෙන කෙනෙක් නම් වැඩිවෙලා හිටන් ඉන්න වෙන රස්සා කරන්න හිතන්නවත් එපා. ඒකෙන් ප්‍රශ්නේ වැඩිවෙන්න පුළුවන්.

ඊළඟ දේ බර. ඇඟේ බර වැඩිවුණාම චලනයන් අඩුවෙනවා. අනික මුළු ඇඟේම බර කකුල්වලට දැනෙන නිසා කපාල දුර්වල වෙන්න ඉඩ තියෙනවා. වයස්ගත වෙද්දි වගේම පරම්පරාවේ ජානමය උරුමයක් විදියටත් වෙරිකොස් හැදෙන්න පුළුවන්.

ටිකක් මහතට වැඩිපුර පිටතට පේන්න වෙරිකොස් තියෙනවා නම් කකුලට වේදනාවක් ඇතිවෙන්න පුළුවන්. ඉතින් එහෙම කෙනෙක් වෛද්‍යවරයෙක් ගාවට යන එක තමයි ගොඩක් හොඳ. සැත්කම්, ලේසර් සත්කාර වගේ දේවල්වලින් වෙරිකොස් ඉවත් කරන්න පුළුවන්. නහර ගැටගැසීගෙන එනවා කියලා තේරිච්චි ගමන් ප්‍රතිකාර කරනවා නම් තත්ත්වය පාලනය කරගන්න ලේසියි.

සාමාන්‍ය විදියට වෙරිකොස් තියෙනවා නම් මේ ප්‍රතිකාර කරන්න. ඔලිව් තෙල් බෝතල් කාලකට සුදුලූණු බික් තුනක් තලලා දාන්න. ඒකට විටමින් E කරල් තුනකුත් දාලා පැය හයක් තියලා කකුලේ ගාලා කොට්න් රෙද්දකින් සැහැල්ලුවට කකුල ඔතලා විනාඩි විස්සකින් විතර හෝදන්න.

ගොටුකොළ ඉස්ම ගාන්න. වැඩිපුර ගොටුකොළ කන්න. තක්කාලි ගෙඩි දෙකක් බ්ලෙන්ඩ් කරලා වෙරිකොස්වල ගාලා කොට්න් කෑල්ලකින් සැහැල්ලුවට ඔතලා විනාඩි 20කින් හෝදන්න. කකුල උණුසුම් තුවායකින් තවලා සාමාන්‍ය රස්නේ පොල්තෙල් ටිකක් ගාලා කකුලේ පහල ඉඳලා උඩට සම්බාහනය කරන්න.

දැනටමත් වෙරිකොස් තියෙන කෙනෙක් නම් දිනපතාම ව්‍යායාම කරන්න. කකුල් උඩට හිටින තාලේ ව්‍යායාම, ඇවිදීම, යෝගා, පඩි නැගීම, ඇවිදීම කරන්න. වෙරිකොස් නැති කෙනෙක් වුණත් ඔය ව්‍යායාම කරනවා නම් එව්වා ඇතිවෙන එක වළක්වන්න පුළුවන්. වැඩි වෙලාවක් හිටන් ඉන්න වෙන රැකියාවක් කරනවා නම් ඒ අතර කාලයේ ටිකක් ඉඳගන්න. වැඩ කරන අතරතුරේ කකුලට ව්‍යායාම කරන්න.

මොන දේ වුණත් ශිරාව ෆිට් එකේ තියාගන්න බලන්න. මොකද ශිරා ෆිට් නම් සර්ප වංගුවලට නෝ චාන්ස්. එහෙම නැත්නම් ඉතින් නහරකාරයෙක් කියලා අනුන්ගෙන් කතා අහගන්න තමයි වෙන්නේ. හරියට බ්‍රිට්නිට වුණා වගේ.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

අවසරයි

බියංකා නානායක්කාර ලියයි

110 කොටස

ගෑනු අපි තමයි ආදරේ කරන පිරිමියා මත්තෙම මැරෙන්න හදන්නේ

“දැන් එහෙම නෑනේ. මං ඉන්නවනේ. ඔයාලා කොළඹ ගියාම මං අප්පච්චි වගේම ඔයාලව බලාගන්නම්...”

“මං ආසයි ඉක්මනට කොළඹ එන්න. එතකොට මටත් පුළුවන් අයියගෙ ටෙලිෆෝන් සාප්පුවට එන්න...”

අගස්තිගෙ ආසාව දිළිසෙන ඇස් තේනුක දැක්කේ අංජනා කතා කළ හඬට පිටුපස හැරී බැලූ නිසාය.

“හා මෙයාව කතාවට අහුවෙලානේ. මං ඒත් බැලුවා තනියම මිදුලට වෙලා මොකද කරන්නෙ කියලා. යමු තේ බොන්න.”

අංජනා සොහොයුරාගේ හිසකෙස් ඉහිරී යනසේ හිස අතගාමින් කීවාය.

“මට මොනවද ගෙනාවේ...?”

අගස්ති ඇසුවේ අංජනාගේ උරහිසේ වල්ලී බොනට්ටුවෙන් බිමට පනින ගමන්ය.

“ගෙනාව ඒවා තාම වාහනේ... ඔයා අරගෙනම එන්න...”

අංජනා තේනුක තෙන්නකෝන් හා ගේ තුළට යන්නට හදද්දී බොහෝ වේලාවකින් නාද නොවුණු ඔහුගේ දුරකතනය නාද වුණේය. ඔහු අතට ගත් දුරකතන තිරයේ දිස්වූයේ ‘අපේ අම්මා’ නමයි.

“ඔයා තවම මගද... මාතලේ ආවද?”

ඔහුගේ කටහඬ ඇසුණු සැනින් සෙනෙහෙලතා මැණිකේ ඇසුවාය.

“ආවා අම්මා. දැන් ආවේ...”

“ඔයාට පොඩි දෙයක් කියන්න මේ හදිස්සියේ ගත්තේ...”

කවදාවත් නැතුව අම්මා කතා කරන්නේ වෙනස් විදියකට කියා තේනුකට දැනුණේය. ඒත් ඔහු ඒ බවක් සෙනෙහෙලතා මැණිකේට ඇඟවූයේ නැත.

“මොකද්ද අම්මා..?”

“හෙට මට ඔහෙ එන්න වෙන්නෙ නෑ පොඩිපුතා... ඒ ඇයි කියලා අහන්න එපා. ඔයාට කොළඹ ආවම කියන්නම්. ඔයත් දැනෙ වැඩ ඉවරවුණාම පුළුවන් ඉක්මනට කොළඹ ඇවිත් මට කෝල් එකක් දෙන්න.”

තේනුකට අම්මා ගැන මුල්වරට හිතේ අමනාපයක් සහ අවිශ්වාසයක් ඇති වුණේය. අම්මා “බුදු සරණයි” කියා කීවද ඊට උත්තර නොදීම ඔහු අතින් ඇමතුම විසන්ධි වී ගියේය.

සති ගණනාවක සිට සෙනරත් ඇල්ලේපොලගේ දැනයට සූදානම් වීම තේනුක හිතෙන් සැලසුම් කර තිබුණත් සෙනෙහෙලතා මැණිකේ දුන් දුරකතන ඇමතුම ඒ සියලු සැලසුම් කඩා දැම්මේය. සෙනෙහෙලතා මැණිකේට අංජනා මුණගැස්වීම ගැන නොකීවාට ලොකු සිහිනයක් ඔහුගේ හිතේ තිබුණි. ඇගේ හදිසි වෙනස්වීමට හේතුව චතුමිණී දැයි හිත යට සැකයක් ඔහු සිතේ යාන්තමින් ඉපදී තිබුණි. ඒ ඇමතුමින් පසු වරක් දෙකක්ම අම්මා සමඟ තේනුක තෙන්නකෝන් කතා කළත් ඒ ගැන ඇය නොකියා මගහැරියා සේ විය. ඇය කවදාවත් තමන් මෙසේ නොසලකා හැර නැත. ඒත් දැන් සිදුවන්නේ එයයි.

අම්මා වෙනස්වෙලා කියා මුල්වරට හිතෙද්දී තේනුක තෙන්නකෝන්ගේ හිතට පහදා දිය නොහැකි පරාජිත, පාලු, දුක්බර සිතිවිල්ලක් ඇතිවුණේය.

දැනය සූදානම් කර තිබුණේ පන්සලට ගොස් දෙන්නටයි. තේනුක ඔවුන් සමඟ ඒ කටයුතුවලට සහභාගී වුවත් අම්මාගේ වෙනස්කම වරින් වර හිත පෙළුවේය. ඒ නිසාම ඉක්මනින් කොළඹ විත් ඊට හේතු කාරණාව සොයාගැන්මේ බලවත් උවමනාවක් ඔහු තුළ විය. ඒ අනුව සන්ධ්‍යාවේ නැවත කොළඹ වීම තේනුකගේ අදහස වුණේය. වත්සලා ඇල්ලෙපොලගේ හා අංජනාගේ නංගීත්, මල්ලීත් කොළඹ වීම ආයෙත් කල් ගියේ ඒ කඩිමුඩියේ ඔවුන්ට කොළඹ යන්නට බැරි නිසාය. වත්සලා සහ දරුවන් ගෙතුළ සිටියදී ඔහු කාමරයට විත් ඇඳේ ඇලවුණේ ඇඟට වාගේම හිතටත් වෙහෙසක් දැනුණ නිසාය. නින්දත් නොනින්දත් අතරේ සිටි ඔහුට කාමරයට කවුරුන් හෝ විත් යළි පිටවෙනු දැනුණේය.

“අර දරුවට නින්ද ගිහින්... ඔහොම මහන්සිවෙලා වාහනේ එළවන එක නම් හොඳ නෑ ලොකු දූ. එක්කො ඉඳලා හෙට පාන්දරම යන්න...”

තවත් මොහොතකින් තේනුකගේ කනට හීනෙන් සේ වත්සලා ඇල්ලේපොලගේ කටහඬ ඇසුණේය. නිහඬ ගෙතුළ ඔහුට ඒ හඬ ඇසුනේ කන ළඟින්ම වාගේය. විජේසිංහ ඉස්කෝලේ නෝනා නිවසේ අනෙක් කොටසේ විසූවද ඇයත් සැමියාත් කතා කරනවාවත් වැඩිපුර ඇසුණේ නැත. ඔවුන් දෙදෙනාම බණ භාවනාවටත් පොත්පත් කියවන්නටත් හුරුවූවන් නිසා එවන් නිශ්ශබ්දබවක් පවතින බව කීවේත් පෙරදාක වත්සලා ඇල්ලේපොලමය

“එයාට මහන්සි වුණාට වාහනේ එළවලානම් පුරුදුයි අම්මා. අනික ඉතින් තව දවසක් දෙකක් ඉඳලා යන්න බලාගෙන ඇවිත් ඔය හදිස්සියේ යන්න හදන්නෙ උවමනාවකට වෙන්න ඇති...”

අංජනා ඇල්ලේපොල තේනුක තෙන්නකෝන් වෙනුවෙන් පෙනී සිටින හඬ ඇසෙද්දී ඔහු නින්ද නොවන්නට ඇස් ඇරියේය. ඒ කතාව ඔහු ගැන නිසාය.

“ඇයි ඔයා දන්නෙ නැද්ද ඒ දරුවා මේ හදිස්සියේ යන්න හදන්නෙ ඇයි කියලා...”

තේනුකගේ හිත ගැස්සුණේය. වත්සලා ඇල්ලේපොල එසේ ඇසුවේ සැරෙන් කියා ඔහුට සිතුණි. ඔහු ආයෙත් ඇස් වසාගෙන නිදි සේ උන්නද ඇසට නින්ද නොවන්නට දුන්නේය.

“මං ඇහුවෙ නෑ අම්මා. ඒක මං දැනගන්න ඕනි නම් එයා කියයිනෙ...”

“ලොකු පුතේ... මං මේ ඔයාට කියන්නමයි හිටියෙ...”

තේනුක තෙන්නකෝන්ගේ පියවුණු ඇස් ආයෙත් ඇරුණේ හිතත් ගැස්සීය.

“ඒ දරුවා හුඟක් හොඳ දරුවෙක්... ඒත් ඔයා කියන විදියට එයා ගැන ඔයා දන්නෙ බොහොම ටිකයි. අඩුතරමේ කාගේ කවුද, අපි ඒ දරුවගෙ පවුලට ගැළපෙනවද කියලවත් ඔයා දන්නෙ නෑ. සම්බන්ධයක් ඇති කරගන්නකොට මුලදි ඕවා දැනගන්න ඕන දේවල්...”

තේනුක තෙන්නකෝන්ගේ හිතට තමන් ගැන වත්සලා ඇල්ලේපොල දරණ මතය දැනගන්නට හිතුණේය. ඒ නිසා ඔහු එසේම සිටියේය.

“එයාට ඇහෙයි අම්මා...”

“ඒ දරුවා නිදි. අනික ලොකු පුතේ මං වැරදි දෙයක් නෙවේනෙ කියන්නේ. ඔයාම කිව්වා ඒ දරුවා අම්මට ගොඩක් ආදරෙයි කියලා. ඔයා නිකමට හිතන්න, ඒ අම්මා ඔය සම්බන්ධෙට අකමැති වුණොත්... අඩුතරමෙ ඔයා දන්නෙ නෑනේ ඒ ගොල්ලො අපි වගේ පොඩි පවුලක්ද සල්ලිකාර පවුලක්ද කියලවත්...”

“මං හෙමිහිට අහගන්නම්කෝ. ඔන්න අම්මා නම් අහන්න යන්න එපා. එයාගෙ හිත නරක්වෙයි...”

“නෑ නෑ... ඔයාලගේ කතාවෙ අතරමග මං ප්‍රශ්න කරන්නෙ නෑ. අප්පච්චි ඉස්සර කිව්වෙත් තමන් තෝරගන්න ගමන තමන් කල්පනාවෙන් යන්න කියලනෙ. බලන්න ඒ අම්මා එනවා කියලා ආවෙ නැත්තෙ ඇයි..? අනික ඇයි මේ දරුවා ගෙදර තියෙද්දී තනියම ගෙදරක කුලියට ඉන්නෙ... මටනම් ගොඩක් ප්‍රශ්න තියෙනවා ලොකු පුතේ...”

ඒ ප්‍රශ්න සියල්ලටම ඇඳෙන් නැගිට ගොස් උත්තර දෙන්නට සිතුණත් තේනුක තෙන්නකෝන් තවත් ඉවසුවේය. ඔහුට කතා කරන්නට වෙලාව මෙය නොවන බව ඇතුළු හද තදින් කීවේය. අම්මාගේ වෙනසට හේතුව සොයාගත් පසු නම් වත්සලා ඇල්ලෙපොලගේ සියලු ප්‍රශ්නවලට උත්තර දෙන්නට ඔහු සිතාගත්තේය.

“එයා ඉක්මනට අම්මව මුණගස්වයි. එතකම් අම්මා මේක ප්‍රශ්නයක් කරගන්න එපා. එයා මට වගේම අපේ පවුලටත් ආදරෙයි...”

“එහෙම ආදරයක් නැතිවෙලා යයි කියලා තමයි ඕන කෙනෙක්ට බය තියෙන්නේ. අප්පච්චි හින්ද මං කිසි දෙයක් එපා කියලා එළියට බැහැලා ආවට කොල්ලො එහෙම තීරණ ගන්නවා අඩුයි. ගෑනු අපි තමයි ආදරේ කරන පිරිමියා මත්තෙම මැරෙන්න හදන්නේ...”

“අම්මෙ... ඔය කතාව නවත්තලා අපි තේ ටිකක් හදමු. මට තේරෙන ඇත්ත තමයි එයා කවදාවත් බොරු කරන්නෙ නෑ කියන එක.”

“අප්පච්චි හිටියනම් කියයි අශෝකමාලව සාලිය බැන්ද නම්, දුෂ්මන්ත කුමාරයා සකුන්තලා බැන්දනම්, තේනුකත් අංජනාව බඳියි කියලා. අප්පච්චි හිතන්නෙත් ඔයා වගේ. අප්පච්චිලා දුවලට ආදරේ වුණාට අම්මලාගේ හිතේ තමයි දුවලා ගැන බරයි බයයි තියෙන්නේ...”

එවර තේනුකට ඇසුණේ වත්සලාගේ වෙනස්ම ස්වරයේ කටහඬකි. ඇය බොහෝ සංවේදී වී කතා කරනු ඇතැයි ඔහුට සිතුණේය.

“බර ඇයි, බය ඇයි..?”

අංජනා කතා කළේ සිනාසෙමින් වාගේය.

“ගෑනු දරුවෙක් කසාද බන්දලා දෙනකම් අම්මෙක්ට බරයි, බයයි දෙකම තියෙනවා. කසාද බන්දලා දෙනකම් එයාව පරිස්සම් කරන වගකීම තියෙන්නෙ අම්මට. දෙසක් වුණොත් ඒ නැන්දම්මා බනින්නෙ අම්මට මිසක් අප්පච්චිට නෙවේ...”

එය ඇසෙද්දී තේනුකගේ පපුව අමුතුවෙන් රිදුණේය. ඒ අම්මා අවුරුදු විසි ගාණක් පරෙස්සම් කළ ඇයව තමන්ට පරෙස්සමින් තියාගන්න බැරිවීම ගැන ඔහුට පශ්චාත්තාපී සිතුවිල්ලක් ආවේය.

මේ කතාව නවත්වන්නට අංජනාට උත්සාහ දැරුවත් වත්සලා ඇල්ලේපොල නවත්වන්නේ නැත. එය නවත්වන්නට ඔහුට පුළුවන් බව හැඟුණේය. කාමරයේ ඔහු නින්දෙන් නැගිට්ට බවට සද්දයක් කළෙන් ඒ කතාව සිතුවා සේම නැවතුණි.

තේනුක දුරකතනය අතට ගත්තේ හදිසියේ හිතට ආ සිතිවිල්ලකටය. චතුමිණීගේ අංකයට ඇමතුම සම්බන්ධ වනවිටම අංජනා කාමරයට ආවාය.

ලබන සතියට

පුද්ගලික සම්බන්ධතා ගත්තත්, රාජකාරී මට්ටමේ සබඳතා ගත්තත් බොහෝවිට අපි පුරුදුවී සිටින්නේ අගය කිරීමට හෝ ප්‍රශංසා කිරීමට වඩා චෝදනා කිරීමටයි. එසේත් නැතිනම් මැසිවිලි නැඟීමටයි. එම සබඳතා නිසා සතුටු වෙන්නට කාරණා සියයක් ඇතත්, පසුතැවෙන්නට ඇති එක් කාරණාවක් හෝ මුල් කරගෙන අපි කරන්නේ සියල්ල අවුල් කරගැනීමයි.සැමියා දහම් සහ දරුවෝ තිදෙනා සමඟ ජපානයේ ජීවත්වන හෂිනි මනමේන්ද්‍ර ඇගේ ජීවිත අත්දැකීම් ඇසුරින් අපිට කියාදෙන්නේ විශේෂයෙන්ම 'පවුල' නමැති සම්බන්ධතාවයට මූලිකත්වය දීම සහ එය රැකගැනීමේ ඇති වැදගත්කමයි. එමෙන්ම ඕනෑම හොඳ හෝ නරක සිදුවීමකටම පසු සතුට විය හැකි කාරණා පමණක් ජීවිතයට එක් කරගැනීමෙන්, බලා සිටියදී පවුල් ජීවිතය සතුටින් පිරී ඉතිරී යන අයුරු ඇය කියන්නේ සතුටින් ජීවිතය දරණ ඇගේ ජීවන අත්දැකීම් සමුදාය මුල්කරගෙනය.

කැත්තට පොල්ල වගේ හිටියොත් දීගෙට ආයුෂ අඩුයි

නියපොත්තෙන් කඩන්න තියෙන දේ පොරවෙන් කපන්න වෙන තැනට එනකල් හිටියොත් සමහරවිට ජීවිතේ ගොඩක් වටිනා දේවල් අපිට අහිමිවෙන්න පුළුවන්. ලෙඩක් දුකක් සම්බන්ධයෙන් විතරක් නෙවෙයි පවුල් ජීවිතේටත් ඒ කතාව අදළයි. සමහර පුංචි ප්‍රශ්නවලට කලින්ම විසඳුම් හොයාගත්තේ නැත්නම් පවුලේ සම්බන්ධකම්, ආදරය, විශ්වාසය විතරක් නෙවෙයි එකිනෙකා කෙරෙහි තියෙන ගෞරවය වුණත් නැතිවෙලා යන්න පුළුවන්.

සමහර වෙලාවට නිහඬව ඉන්න ඕන තැන්වල සීමාවක් නැතුව කියවන්න යන එකෙන් විතරක් නෙවෙයි කතා කරන්න අවශ්‍යම තැන්වල නිහඬව ඉන්න එකෙනුත් අපි පවුල් ජීවිත අවුල් කරගන්නවා. පුංචි අනවබෝධයක් දුරදිග ගිහින් ඒක දබරයකට පෙරළිලා, පස්සේ මහා රණ්ඩුවකින් පවුල් ජීවිත දෙකඩවෙන අවස්ථා ඕනතරම් තියෙනවා. සමහරවිට ඒ හැමදේම වෙන්න හේතුවෙලා තියෙන්නේ පුංචිම පුංචි වැරදි වැටහීමක්. ඉතින් මං මේ කියන්නෙත් එහෙම දෙයක් ගැන. හැමදාම වගේ මගේ අත්දැකීමක්මයි මෙතැනදීත් උදාහරණෙකට ගන්නේ.

ඉස්සර ගොඩක් වෙලාවට මගේ තිබුණ ලොකුම වැරැද්දක් තමයි කවුරු මොනවා කිව්වත් මගේ මතයේම ඉන්න එක. මොනම හේතුවක් නිසාවත් මම මගේ මතය වෙනස් කරන්න කැමැති වුණු කෙනෙක් නෙවෙයි. ඒ කාලෙ දහම් එක්ක පොඩි පොඩි බහින්බස්වීම් වැඩිපුරම ඇතිවුණේ මේ හේතුව නිසා. දහම් කොච්චර තේරුම් කරන්න උත්සාහ කළත් මං හැමවෙලේම 'නෑ ඒක එහෙම නෑ, එයා එහෙම නෑ, ඒක මේ විදියයි, ඒක මෙහෙම කරාමයි හරියන්නේ' කියන මගේ මතයේම හිටියා.

සමහර වෙලාවට අපේ නිහතමානිකම හෝ අහිංසකකමෙන් අයුතු ප්‍රයෝජන ගන්න හදන මිනිස්සු ඒ අයගේ ඕනෑ එපාකම් ඉෂ්ට කරගන්න හිතාගෙනත් අපිට හරි වැරදි පෙන්වන්න එනවා වෙන්න පුළුවන්.

ඒ නිසා මට සමහර තැන් වැරදුණා. ඒ වගේම සමහර දේවල් මගහැරුණා. එහෙම මගහැරුණ සමහර තැන් අදටත් මට හඳුනන්න අමාරුවෙලා තියෙනවා. ඒ අත්දැකීම නිසාම මම කියනවා, පවුල් ජීවිතේ ඇතුළේ තනි මතයක ජීවත්වෙනවාට වඩා දෙන්නගේම අදහස්වලට ගරු කරන එක ඉතාම වැදගත් කියලා. ඒ විදියට තමන්ගේ මතය වෙනස් කරන්න අකමැති කෙනෙක්ගේ චරිතය දිහා හොඳට බැලුවොත් තේරුම්ගන්න පුළුවන් ඒ අය නිහතමානී නෑ. තව කෙනෙක් පෙන්වලා දෙන හොඳ හෝ නරකක් දකින්න බැරි ඒකයි. ඉතින් මගේ ගාවත් ඔය වගේ දේවල් අඩු වැඩි වශයෙන් තිබුණා. හැබැයි කාලයත් එක්ක ලැබුණු විවිධ අත්දැකීම්වලින් මම තේරුම්ගත්තා මං දකින, මට පේන හැමදේම නිවැරදි නැති වග.

එහෙම කතාවකට එක උදාහරණයක් කියන්නම්. මං ඕනම කෙනෙක්ව ඉක්මනින් විශ්වාස කරනවා. ඒ විශ්වාස කිරීම නිසා තව කෙනෙකුට බොහොම පහසුවෙන් මාව පාවිච්චි කරන්න පුළුවන්. ඉතින් දහම් මට හැමවෙලේම ඕක ගැන කියනවා. එයා අලුතෙන් අඳුරගන්න මනුස්සයෙක්ව විශ්වාස කරන්නේ අඩුම ගානේ අවුරුදු දහයක්වත් ආශ්‍රය කරලා. එහෙම කරලත් මිනිස්සු අඳුනගන්න අමාරුයිනම් මං කොහොමද එකපාර පිටස්තර මිනිස්සු විශ්වාස කරන්නේ කියලා එයා මගෙන් අහනවා. හැබැයි ඒ කියපු විදියට කිසිම කෙනෙක්ව ඕනෑවට වඩා විශ්වාස කරන්න නරකයි කියන එක පිළිගන්න මුලදී මම කැමැති වුණේ නෑ. ඒත් එහෙම අනවශ්‍ය විදියට විශ්වාස කරපු මිනිස්සු නිසා ලැබුණු අමිහිරි අත්දැකීම්වලින් පස්සේ මම තේරුම්ගත්තා, මට නොපෙනෙන පැත්තක් තවත් කෙනෙකුට පේන්න පුළුවන් බව.

ඒ වගේම තවත් දෙයක් කියන්න ඕන. සමහර වෙලාවට අපේ නිහතමානීකම හෝ අහිංසකකමෙන් අයුතු ප්‍රයෝජන ගන්න හදන මිනිස්සු ඒ අයගේ ඕනෑ එපාකම් ඉෂ්ට කරගන්න හිතාගෙනත් අපිට හරි වැරදි පෙන්වන්න එනවා වෙන්න පුළුවන්. එහෙම අය හරි දේ වැරදි විදියට පෙන්වලා, වැරදි දේ හරි විදියට පෙන්වලා අපිව නොමඟ යවන්නත් පුළුවන්. ඒ වගේ තැන්වලත් ප්‍රවේසම් වෙන්න ඕන.

ඇත්තටම බාහිර පුද්ගලයෝ එක්ක ගනුදෙනු කරන අවස්ථාවලට වඩා වැඩියෙන් මේ ගැන හිතන්න ඕන ස්වාමියා හා බිරිඳ සම්බන්ධ කාරණාවලදී. පවුල් ජීවිතේ ඇතුළේ දෙන්නම කැත්තට පොල්ල වගේ තනි මතයක ඉඳගෙන වැඩ කරන්න ගියොත් එහෙම දීගෙකට ආයුෂ අඩුයි. හොඳ රස්සාවක්, ගෙයක් දොරක්, යානවාහන මේ මොනවා තිබුණත් එකිනෙකාට ඇහුම්කන් දෙන්නේ නැති ගෙදරක, අනෙකාගේ මතයට ගරු කරන්නේ නැති ගෙදරක, යටහත්පහත් බව කියන එක දුර්වලකමක් විදියට දකින ගෙදරක සතුට රැඳෙන්නේ නෑ කියන එකයි මගේ විශ්වාසය.

මම පවුල් ජීවිතයක් ගතකරන්න අරගෙන තාම අවුරුදු 10යි. මට හිතෙන්නේ තාමත් මං පවුල් ජීවිතේට ආධුනිකයි කියලා. ඒ නිසා පවුල් ජීවිතය සාර්ථක කරගන්න උපදෙස් දෙන්න මට පුළුවන්කමක් නෑ. හැබැයි මට මගේ අත්දැකීම් බෙදාගන්න පුළුවන්. ඒ අත්දැකීම් තමන්ගේ ජීවිත කතාවලට ආදේශ කරගෙන තවත් කෙනෙකුට ඒ වගේ වැරදුණු තැන හදාගන්න පුළුවන්. බිරිඳක්, මවක් විදියට මේ ලිපියෙන් මා බලාපොරොත්තු වෙන එකම දේත් ඒකයි.

■ හෂිනී මනමේන්ද්‍ර

හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදිම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.

අත්කම් නිර්මාණ ශිල්පිනී
නිරූපා අම්බලන්ගොඩගේ

වළං බිඳින නරක ළමයි හෙම නොවෙයි අපී

සත්පුරුෂයෝ ඔවුනොවුන් බිඳුණාහුද වහා සමඟියට පැමිණෙති, අඥූණයෝ මැටි බඳුන් බිඳෙන්නාක් මෙන් ඔවුනොවුන් බිඳෙති, නැවත සමඟියට නොපැමිණෙති.

ඔය ත්‍රිපිටකයේ බුද්ධ දේශනාවක්. මැටි බඳුනක් බිඳුණයින් පස්සේ ආයේ හා කරන්න බැහැ වගේ නුවණ අඩු මිනිස්සු අතර ඇතිවෙන නොහොඳ නෝක්කාඩු ආයේ පාහින්ට බැහැ කියන එක නොවැ ඔය කියන්නේ. නුවණ අඩු මිනිස්සු නම් අමනාප වුණත් කමක් නැතයි කියමුකෝ. ඒත් ඉතින් වළං බිඳෙන එක?

ඉස්සර ගෙවල්වල දැන් වගේ නොන්ස්ටික් භාජන තිබුණේ නැහැනේ. හැම ගෙදරකම තිබ්බේ මැටි ඇතිලි. මැටි හට්ටියේ ඉදෙන හොද්දට ගහන්න ෆයිව්ස්ටාර් හොටෙල්වලටත් බැහැ නොවෑ.

රස්නෙට තියෙන මැටි හට්ටි බිඳින්නේ නැතිව රෙදි කෑල්ලකින් අල්ලලා දරඬුවෙන් තියන සාස්තරේ අම්මලා, ආත්තම්මලා දන්නවා. හැබැයි උන්දැලාගෙත් අත් එහෙ මෙහෙ නොවුණු වෙලාවල් නැතිව නෙමේ කියලයි ආත්තම්මා කියන්නේ.

හැබැයි රස්නෙ හට්ටි, මුට්ටි, භාජන අල්ලන්න දැන් උන්දැලා නම් බය නැහැ. මොකද දැන් කාලේ කොයි ගෙදරත් ඒ වැඩේට හදපු පොට් හෝල්ඩර්ස් තියෙනවානේ.

ඒ විතරක් නෙමෙයි මුළුතැන්ගෙයි අලංකාරෙටත් සමහරු මෙව්වා එල්ලනවා. ඉතින් ස්වයං රැකියාවක් විදියට පොට් හෝල්ඩර්ස් හදන හැටි අද බලමු.

ඊජිප්තුව, මෙසපොතේමියාව, චීනය, ඇනටොලියාව වගේ රටවලින් තමයි මුලින්ම ආහාර උයන භාජන හදලා තියෙන්නේ. ඒ මීට අවුරුදු 20000කටත් කලින්ලු. සරලව කියනවා නම් මිනිහා ශිලාචාර වෙච්චි දවස්වල ඉඳලා බඳුන් හදන වැඩේ කරලා තියෙනවා. මිනිස්සු මුල්ම භාජනේ හැදුවේ අලි අඩියකින් කියලත් කියනවා.

ඔන්න මැටි පොළවක අලි පාද සටහනක් තියෙනවා දැකපු වෛතිහාසික මානවයා ඒක සියුම්වට ගලවලා වතුර පුරවලා අලයක් දලා ගින්දරට ඇල්ලුවලු. ගින්න නිසා ටික වෙලාවකට පස්සේ මැටි අලි කකුල අමුතු පැහැයකට හැරුණලු. පිච්චුවයින් පස්සේ හොඳ හයියකුත් ලැබුණු නිසා මිනිස්සු ඒක කල් තියාගෙන පාවිච්චි කළාලු. ඔය විදියට භාජන පාවිච්චි කරන්න ගත්තු කාලේ ඉඳලාම පොට් හෝල්ඩර්සුත් පාවිච්චි කළාලු. ඒ කාලේ අය පොට් හෝල්ඩර්ස් විදියට පාවිච්චි කරලා තියෙන්නේ කෝටු කෑලි. පස්සේ ලී කොකු පාවිච්චි කරලා. ග්‍රීසියේ කැණීම්වලින් උණුසුම් භාජන අල්ලන්න පාවිච්චි කරපු කොකු හම්බවෙලා තියෙනවා.

අපි දැන් පාවිච්චි කරන රෙදිවලින් හදන පොට් හෝල්ඩර්ස් හදලා තියෙන්නේ 18 වැනි සියවසේදි. ඊටපස්සේ යුරෝපයේ හැම ගෙදරකම මේ පොට් හෝල්ඩර්ස් පාවිච්චි කරන්න අරන්. නත්තල් උත්සවයේ සැරසිල්ලක් විදියටත් ඒ අය මේ අයිතමය පාවිච්චි කරනවා.

ලංකාවේ අපේ ගෙවල්වලත් ගොඩක් අය රෙදිවලින් හදපු පොට් හෝල්ඩර්ස් පාවිච්චි කරනවා. ඒ නිසා ලස්සනට නිර්මාශීලීව හැදුවොත් ඉල්ලුමක් හදාගන්න අමාරු නැහැ.

අනික මුදලක් ආයෝජන නොකර පටන්ගන්න පුළුවන් ස්වයං රැකියා ගැනත් කීපදෙනෙක්ම අහලා තිබුණා. මේ වැඩේ පටන්ගන්නත් එහෙම ලොකු මුදලක් අවශ්‍ය නැහැ. ගෙදර පාවිච්චි කරලා අයින් කරපු ඇඳුම් මේකට පාවිච්චි කරන්න පුළුවන්. වෙළඳ කලාපවලින් නැත්තම් ඇඳුම් නිර්මාණය කරන තැන්වල අහක දැන රෙදි, පැඩින් කෑලි නොමිලේම ගන්න පුළුවන්.

වර්ණ කිහිපයක රෙදි කෑලිවලට අමතරව කතුරක්, මහන මැෂිමක් නැත්තම් ඉඳිකටු, නූල්, පැඩින් කෑලි කිහිපයක් හොයාගන්න.

පියවර 1

රෙදි කෑලි ටික කැමති විදියට මූට්ටු කරන්න.



පියවර 2

මූට්ටු කරන රෙද්ද දිග අඟල් 10 පළල අඟල් 10 වෙන්න කපාගන්න. ඒ වගේ රෙදි කොටස් දෙකක් හදාගන්න. කපාගන්නකොට හාර්ට්, චතුරස්‍ර, කොළ, මල් ඔය ඕන හැඩයකට කපාගන්න පුළුවන්.

මූට්ටු කරපු රෙදි දෙක මැදට පැඩින් කෑල්ලක් තියලා වටේට පයිපින් කරගන්න. එල්ලන්න ලූප් එකක් දාගන්න .

පොට් හෝල්ඩර් එකක් ප්‍රමිතිය සහ නිර්මාණශීලීත්වය අනුව රුපියල් 250 ඉඳලා අලෙවි කරන්න පුළුවන්. මේ ගැන තවත් විස්තර දැගන්න අවශ්‍ය නම් 0777760400 අංකයට කතා කරන්න.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

‘නංගි ඔයාගෙ ඇඟනම් මාරයි’ කියලා පිරිමි ළමයි කියනවා

කෞශල්‍යා වොෂානි

කොණ්ඩය කොටට කපා, පුම්බාගත් මස්පිඬු සහිත අත්ගොබ ප්‍රදර්ශනය කරන පාසල් සිසුවියකගේ ඡායාරූප කීපයක් පසුගියද, සමාජ මාධ්‍යයේ සංසරණය විය. සුදු ඇඳුමින් සැරි මුව හසරැල්ල නිසාම මේ දියණිය සමඟ ටිකක් කතාබහ කරන්නට අපටද සිත් විය.

“මං ඉස්කෝලෙදි ක්‍රීඩාවක් විදියට පිහිනුම් කළා. ඒකට හොඳ ශරීර යෝග්‍යතාවයක් තියෙන්න ඕනේ. ඒ ගැන හිතලයි ජිම් එකකට ගියේ. එතැනදි මං දැක්කා ජිම් එකට එන අයගේ ඇඟවල්. ඉතින් ගෑනු ළමයෙක් වුණත් මටත් ඒ වගේ ෆිට් ඇඟක් හදාගන්න ආස හිතුණා.”

ඒ ඉහත කී දියණියයි. ඇය මෙවර ගාල්ල ගිංතොට මහා විද්‍යාලයෙන් උසස් පෙළ විභාගයට මුහුණ දුන් 19 හැවිරිදි කෞශල්‍යා වොෂානි ය.

“මුලින් ආසාවට ඇඟ හදාගත්තට පස්සේ මට හිතුණා කායවර්ධන ක්‍රීඩාවට යොමුවෙන්න. මං ඒක ජිම් එකේ කෝච්ට කිව්වා. පස්සේ එයා කිව්වා ආධුනිකයින්ට ‘Mr.Novise Women Physique’ කියලා තරඟයක් තියෙනවා අපි එහෙනම් ඒකට ඉදිරිපත්වෙලා බලමු කියලා. 2021 අවුරුද්දේ තමයි ඒක තිබුණේ.”

එම තරඟයෙන් ඇය දෙවැනි තැනට පත්වූවාය. තමා මුහුණදුන් මුල්ම තරඟයෙන්ම එවන් ජයග්‍රහණයක් හිමිවීමත් සමඟ කායවර්ධන ක්‍රීඩාව වෙනුවෙන් ඇයට තිබූ ආසාව වැඩි වූ බවයි ඇය පැවසුවේ.

“ඊටපස්සේ මං පහුගිය අවුරුද්දේ තිබුණු විවෘත ‘Mr.Sri Lanka 2022’ තරඟයට ඉදිරිපත් වුණා. ඒ තරඟය නියෝජනය කරපු ළාබාලම ක්‍රීඩිකාව වුණේ මං. හැබැයි මට ජුළුවන් වුණා ඒ තරඟයෙන් ලංකාවෙන්ම හයවැනි තැනට එන්න. ඒක මං ලබපු ලොකු ජයග්‍රහණයක්”

ගාල්ල, ගිංතොට ප්‍රදේශයේ පදිංචි කෞශල්‍යාට මව සහ පියා හැරුණුකොට සිටින්නේ අක්කලා දෙදෙනෙකි. සුකුමාල ගැහැනු ළමුන් අතරේ වඩා ශක්තිමත් ශරීරයකට හිමිකම් කියන කෞශල්‍යා නිසැකවම පාසල තුළ කැපී පෙනෙන චරිතයක් වන්නට ඇත. අන්‍යන්ගේ අවධානයද වැඩිපුර ලැබුණු බවට සැක නැත. ඉතින් අපි ඒ ගැනද ඇගෙන් ඇසුවෙමු.

“ඉස්කෝලේ ගෑනු ළමයි නම් මං දැක්කම කියනවා මරු ඇඟක් ඔයාට තියෙන්නේ, අපිත් ජිම් එක්කන් යන්නකෝ කියලා. පිරිමි ළමයිනුත් කියනවා මාර ඇඟක් ඔයාට තියෙන්නේ කියලා. සුදු ගවුම ඇඳලා පාරේ යද්දි වුණත් ගොඩාක් අය මගේ දිහා අවධානෙන් බලනවා. ගොඩාක් වෙලාවට පිරිමි ළමයි තමයි. ඒ වෙලාවට ඉතින් ආඩම්බර හිතෙනවා.”

නමුත් ඒ පැසසුම් ලබන්නට ඇයට බොහෝ දේ කැපකරන්නට සිදුවිය.

“කායවර්ධන ක්‍රීඩාව කරද්දි ගොඩාක් කැපකිරීම් කරන්න වෙනවා. විශේෂයෙන්ම තරඟයකට සූදානම් වෙද්දි ඒ කැපකිරීම් ඉහළයි. කොච්චර ආස වුණත් දකින දකින කෑම කන්න බෑ. පිටි කෑම කන්න බෑ. බීම බොන්න බෑ. තරඟය හෙට කියලා අඩුතරමින් වතුරවත් බොන්න බෑ. සෝඩා ටිකකින් තොල තෙමාගන්න විතරයි දෙන්නේ. තරඟයකට කලින් දවසේ ඇඟ හෝදන්නවත් බෑ. ඒ කැපකිරීම් නිසාම මට මේ ක්‍රීඩාව එපාවුණු වෙලාවලුත් තිබුණා. ඒ වෙලාවට මං කළේ මගේ ඇඟ දිහා බලලා ආයෙත් ආසාව වැඩිකරගත්ත එක.”

තරඟයකට කලින් දවසේ ඇඟ හෝදන්නවත් බෑ. ඒ දේවල් නිසාම මට මේ ක්‍රීඩාව එපාවුණු වෙලාවලුත් තිබුණා

පිහිනුම් ක්‍රීඩාව නිසා කායවර්ධන ක්‍රීඩාවට පැමිණි කෞශල්‍යා මේ වනවිට පිහිනුම් ක්‍රීඩාවට සමු දී ඇත. නමුත් ඒ තුළින් ඇය ලබාගෙන ඇති ජයග්‍රහණ දෙස බලද්දී අනාගතයේදී අපේ රටට ජයග්‍රහණ රැසක්ම උරුමකර දෙන්නට සිටි දක්ෂ පිහිනුම් ක්‍රීඩිකාවක් අහිමි වූවාදෝ යන සැකයද අපිට නොතිබුණාම නොවේ.

“මං පිටපිටම 2018 සහ 2019 කියන අවුරුදු දෙකේම සැතපුම් දෙකේ ගල්කිස්ස මුහුදු පිහිනුම් තරඟයේ පළවැනියා වුණා. එතකොට 2018 අවුරුද්දේ කිංග්‌රෝඩ්ස් ජල ක්‍රීඩා සමාජය විසින් සංවිධානය කරපු කිලෝමීටර් 10 විවෘත මුහුදු පිහිනුම් තරඟයෙන් ලංකාවෙන්ම දෙවැනි ස්ථානය දිනාගත්තා. එතකොට මට වයස අවුරුදු 14යි. එදා නැවතෙන්නේ නැතුව පැය දෙකයි විනාඩි 53කින් වැල්ලවත්ත, දෙහිවල, ගල්කිස්ස මුහුදේ කිලෝමීටර් 10ක් එකදිගට පීනුවා. ඊට අමතරව පහුගිය අවුරුදුවල ජාතික මහා ක්‍රීඩා උළෙලේ පිහිනුම් අංශයෙන් සමස්ත ලංකා ජයග්‍රහණ පවා අරන් තියෙනවා.”

මේ අතර පසුගිය වසරේදී ඇය පිහිනුම් ක්‍රීඩාවට සමුදී ඇත්තේද සුවිශේෂී ජයග්‍රහණකින් අනතුරුවය.

“පාසල් මට්ටමින් පවත්වපු ‘Sri Lanka School Swimming Championship 2022’ තරඟාවලියේ 20න් පහළ බාලිකා මීටර් 100 නිදහස් ආර ඉසව්වෙන් පළවැනි තැන ගත්තා. මීටර් 50 නිදහස් ආර ඉසව්වෙනුත් පළවැනියා වුණා. ඒ එක්කම මීටර් 50 සමනල ආර ඉසව්වෙන් තුන්වැනි තැන දිනාගන්න මට ජුළුවන් වුණා.”

මෙකී සියලු ජයග්‍රහණවලට මුල කෞශල්‍යාගේ ආදරණීය පියාය. ඇය පැවසූ ආකාරයට වයස අවුරුදු දෙකේ සිටම ඇයට පිහිනන්නට උගන්වා ඇත්තේ ඔහුය. ඒ නිවස සමීපයේ ඇති ගිං ගඟේය.

“ඉස්සර අපි ගිං ගඟට නාන්න ගියාම මමයි අක්කලා දෙන්නයි අම්මා රෙදි හෝදනකල් පීනනවා. ඒත් මට හරියට පීනන්න බෑ. පස්සේ තාත්තා තමයි මට පීනන්න ඉගැන්නුවේ. ඒ මං ගිලෙනවට පුහු පොල් ගෙඩි දෙකක් ලණුවක ගැට ගහලා මගේ බඩ යටින් දලා එයාගේ අත උඩ තියාගෙන. ටික දවසකින් මං වැඩේ අල්ලගත්තා. ඊටපස්සේ සුසන්ත සර්, ජයන්ත සර් සහ රොශාන් පීරිස් කියන සර්ලා යටතේ මං ඒක ක්‍රීඩාවක් විදියට කළා. දැන් නම් කිසිම බයක් නැතුව ගඟේ මුහුදේ පවා ඕනම ගැඹුරක් තියෙන තැනක පීනන්න පුළුවන්.”

කායවර්ධන ක්‍රීඩාවෙන් ගමනක් යන්නට සිතා පිහිනීමට සමුදුන් කෞශල්‍යා දැන් තමාටම කියා ඉලක්කයක් තනාගෙන තිබේ. ඒ ලෝකයේ හොඳම කායවර්ධන ශූරිය බවට පත්වීමටයි. ඒ වෙනුවෙන් ඇය පුහුණු කරන්නේ කායවර්ධන ක්‍රීඩාව තුළින්ම ලංකාවට අභිමානයක් ගෙන ආ කායවර්ධන ක්‍රීඩක හර්ෂ ඩී පීරිස් විසිනි.

කැපවීම ඇත්නම් වයස යනු ඉලක්කමක් පමණි. කෞශල්‍යා දියණියද ඊට හොඳ උදාහරණයකි. ඉතින් ඈ පතන පරිදිම ලංකාවේ නම ජාත්‍යන්තරයට ගෙනයන්නට ඇයට සුබ පතමින් අපි ඇයට සමුදුන්නෙමු.

■ රුවන් එස්.සෙනවිරත්න

කවි යාය

ධරණී

විහාරමහා දේවියන් ගැන
සෝමා දේවියන් ගැන
ලියූ සටහන් ඇතත් ඉතිහාසය පුරා

අන්තඃපුරයේ දුක්විඳ
තිඹිරිගෙයිම මියගිය ගැහැනුන් ගැන
දිග්ගෙයි නැටුමින් හෙම්බත් වූ
සොඳුරු යෞවනියන් ගැන

රජ බොජුන්හලේ
දහදිය කඳුළින් ජීවිතයම දියකළ
අසරණයන් ගැන
ලියවී ඇද්ද කොතැනකවත්
නැත...
ධරණී ඔබට ඉටු කිරීමට
වගකීමක්, යුතුකමක් ඇත
ඒ ඉතිහාසය පුරාම දුක්විඳි
අහුමුළුවල සැඟවී ගිය
කාන්තාවන් ගැන ලියන්නට

ධරණී, ඔබ ආදීනය
ඒ මෙහෙවර ඉටු කරමින්
යන්න ඉදිරියටම
ධරණී, ඔබට අපගේ ප්‍රණාමය

විශ්‍රාමික ආචාර්නී එම්.ගල්කොටුව
ගෙලිඔය

වෙන්න ඔයා මගේ

නාරිලතා මලින් මෙපිට මලක් නොමැති ලොවේ
උඩවැඩියා මලින් ලදිමි මෙමා අමා සුවේ

ගින්න නැතුව ගිනි අරගෙන ගින්නෙ දැවෙන ලොවේ
ප්‍රේම ගින්න සංසිඳ වූ ගඟුල ඔබයි මගේ

දිය මතුපිට තරඟ නැගී දිය කැළඹෙන ලොවේ
පිපාසයට බොන්න තියෙන දිය බිඳුවයි මගේ

මදනල මහ මේඝය වී බිම වනසන ලොවේ
ගත සනහන සිනිල් සුළඟ වෙන්න ඔයා මගේ

දහස් ගණන් යෞවනියන් ඇඟේ හැපෙන ලොවේ
මට හරියන ප්‍රේම කැකුළ වෙන්න ඔයා මගේ

බී.ඩී.අනුර විජේසෝම
දූනගහ

අමනුස්සයෝ

ආදරය
කරුණාව අයදිමින්
හඬනවා මවක්
බස් නැවතුමේ
මියැදෙන්නට පෙර
කිසිවෙකුත් දක්වන්නෙ
නැහැ
හරසර
සැන්දෑ සමේ
තනිවෙලා පබාවතියක්
බස් නැවතුමේ
ආදරය පෙන්වන්න
මිනිස්සු පොර...

දයානන්ද
පොන්නම්පෙරුම

අහම් සෙනෙහස

ජීවිතයේ මිහිරි සුව නුඹගෙන් ලැබුව
කෙලෙසක සිටින්නද නුඹ මා ළඟ නැතුව
කිසිදු දෙදෙන වෙන්වන්නට නොම පැතුව
නුඹගේ සුවඳ ඇත තාමත් මා සතුව

තනිවූ හදට නුඹෙ ආදර වදන් පෙළ
නිම් හිම් සතුට මා ලැබූ කළ නොහැක මිල
සුදු සඳ කිරණ සිපගත් ඒ කුමුදු විල
මිලින ගියේ නම් ඒ ගැන කිමද පල

මගතොට යනෙන විට මගෙ සෙනෙහස බැන්ද
මියැසින් විලස රස මුව බී මක රන්ද
නුඹගේ රුවට මා හද විය මන නන්ද
අමතක කරන්නේ එය මම කෙලෙ සින්ද

දෙවැටේ විසු නාමල් පෙති පලස දිගේ
කලයක් රැගෙන මදහස පා ගියපු අගේ
පියදසුනක් වුණා සුදු එය නෙතට මගේ
ආයෙත් එය දකින්නේ කෙලෙසකද නගේ

හද ගිනි නැගෙයි මගෙ සෙනෙහස වැඩිකමට
දුදනන් හරස් වූ හැටි සුදු අපෙ පෙමට
වන්නිය උණුහුමයි සැඩ හිරු රැස් අවට
සිසිලක් අවැසි හදකට ගිනි රැස් කුමට

සුමණ එස්. කළුගම
මයිලගස්හන්දිය

දැන්වත් යන්න හිතපන් හරි මග සොයලා

මවක් උනෙමි නුඹ යහමගටම ගන්න
ගසක් උනෙමි නුඹටම එතිලා ඉන්න
කරුවක් උනෙමි නුඹ හට වාරුව වෙන්න
සැමදු අත දිගු කළෙමි පුතු හට නැගිටින්න

අත දිගු කළත් එය අහකට විසි කරලා
මා දෙන හැම ඔවදනම වහ කදුරුයි කියලා
මිතුරන් ළඟයි නුඹෙ හැම සතුටම සිතලා
හතුරන් ළං කරගත්තේ ඇයි නුඹ රැවටිලා

අත ළඟ විභාගය පෙනි පෙනි ඉවත බලා
දුරකතනයට පමණක් මුල් තැන දීලා
මවකගෙ පැතුම් සේරම සුනු විසුනු කළා
මේ මව කොහොම ඉන්නද නුඹ ගැන හිතලා

දිනකදි නොදුරුවේ යයි මගෙ හදවත පැලිලා
නුඹෙ නෙතට ආවත් උණු කඳුළු ගලා
දෙන්නට සමාවක් නැහැ මව ළඟ ඉතිරි වෙලා
දැන්වත් යන්න හිතපං හරි මග සොයලා

සඳකාන්ති කල්දේරා
මිරිහාන කෝට්ටේ



විඳීම

සතුට විතරක්ම
සොයන මිනිසුනේ
එයම විතරක් නම්
ජීවිතේ...
කිමද නුඹලා විරහ ගී අහන්නේ
දුකද හැඟුමක්ය
මනසේ...
විඳිය හැකි නම්
රිසි සේ...

ශල්‍ය වෛද්‍ය
දහම් කීර්ති ජයකොඩි
කුරුණෑගල ශික්ෂණ රෝහල

සුදු දෝණියේ

ඇත පෙනෙනා පහන්ටැඹ නුඹ
වියළි කතරට පිනිබිඳුව නුඹ
අපේ ජීවිත තක්සලාවට
පැයු එකම රන්තරුව ඔබ
දියණියේ ඔබෙ සෙනෙහසින්
ජීවිතයේ විඩාව සංසිඳී යයි
අපගේ ජීවිත එළිය කරනා
එකම පුන්සඳ නුඹ තමා

බර්නි වසන්තා ගුණතිලක
වාද්දුව

කිරි අම්මාවරු

සුදු සේල ගත ලන්න
සුදු පබලු පළඳින්න
කාක් හඬ
නොඇසෙන්න
පෙරින් නිවසින් යන්න
ඉදෙන කිරි, කිරිබතට
පිදෙන ඒ දංපතට
හිත පිනා යන ලෙසට
සෙත් පැතුම් ගෙන
දෙන්ට
ආශාව හිත තිබෙන
පතිනි මව් දැනගන්න
නෙත කඳුළු පිසිමින්න
අනේ සෙත සලසන්න
පෙල ගැසී සුදු වතින්
මුවඟ පිරි මදහසින්
කිරි දනට වඩින්නත්
ළය කිරෙන්
පිරුණොතින්

දීපිකා ප්‍රියදර්ශනී
ප්‍රනාන්දු
මොරටුව විල්ලෝරාවත්ත

සොයුරු ඇසින්

මහ සෙනඟකට මැද තදබදේ
බස් රියක විඳ විඳ දසවදේ
පිපි මලක් මෙන් වූ යව්වනේ
නුඹ කොහෙද බැහැරකටද නගේ

අමනයින් දෙන්නෙක්
දෙපැත්තෙන් උරෙනුර උලා
පමණටත් වැඩියෙන්
නුඹට තෙරපෙන හැටි බලා
ඒ ළඟම නිහඬව
සිටින අසුනක බරවෙලා
මගෙ හිතම මට වරදකදි මෙන්
තරවටු කළා

මේ හිතත් වාගෙම පයත් ඇත
සවිබල ගැනී
මහදුරක් හිටගෙන
වුණත් යන්නට පුළුවනී
මට නගෙක් ඉන්නව
ඇයත් හරියට නුඹ වගේ
මෙහෙ වරෙන් මං නැගිටිනව
මගෙ අසුනට නගේ

පොඩිරත්න අඟමගේ
මහව

කවි යාය

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.

''කවි යාය'' 'ධරණී' කර්තෘ මණ්ඩලය,
අංක 91,විජේරාම මාවත,කොළඹ 07 නැතිනම්
dharanee.editor@liberty.lk ලිපිනයට
ඊමේල් කරන්න

තනිකම

පැහෙන්නට බැරිවුණු ලොව උඹට මට
උඹ වෙනුවෙන් වැටෙනා කඳුළු කැට
පැහෙන්නට පෙම නොදවා මිනිසුන්ට
පුදන්නට ඉසිනෙමි මල් ගස් මුලට

සෙනේ විඳි නමුත් කුස තුළ උණුසුමට
දිනේ අදයි වෙන් වී යන්නට අපට
දැනේ වෙනස උඹ ගැහෙනා හදවත
අනේ කඳුළු එනවද නොවැඩුණු ඇසට

නදීෂා අබේකෝන්
කඹුරුපිටිය, මාතර

ධරණී ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්

අංක 91, විජේරාම මාවත, කොළඹ 07. දුරකථන 0115 200 900
බෙදාහැරීමේ අංශය 0112 127204
දැන්වීම් අංශය
0112672601, 0112672603, 0761393811
ෆැක්ස් 0112 673 451

උගස් තැබූ රත්තරං
ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 22 සඳහා ඉහල මිලක්
076 101 88 53

රු. 35000/- කට වැඩි ආදායමක්
විලාසිතා අත්පලඳනා, කරාබු සැකසීම.
- නිවසේ සිටම කරගෙන යා හැකිය
- නිෂ්පාදන භාර ගැනේ
- මුදල් එවලේම
- අමුද්‍රව්‍ය නිවසටම සැපයේ

වැඩි විස්තර සඳහා ඔබගේ Whatsapp අංකය SMS කරන්න.
070-6128955

හොරණ - ඉළිඹ
සහ හංවැල්ලේ ස්වර්ණපාලි වැඩිහිටි නිවාසයන්ට සහ පාදුක්කේ නිමලා වික්‍රමසිංහ වැඩිහිටි නිවාසයට මන්ද මානසික, මානසික අඳ, ගොළු, බිහිරි සහ එක්තැන් වූ කාන්තා පිරිමි අයවළුන් බඳවා ගැනේ.
076- 965 6827
011- 219 7652

ධරණී
පුවත් පත නිවසටම ගෙන්වාගන්න අමතන්න
076 1367 623

කොළඹ දිස්ත්‍රික්කයේ ගැහැණු ලමුන් දෙතුන් දෙනෙකු පමණක් සිටින සියලුම පහසුකම් සපිරි වෙනම කාමර නාන කාමර සහිතව ඉහලම තත්වයේ ගැහැණු ළමා නිවාසයකට වයස අවු. 58 අඩු විවාහක වූ දරුවන්ගෙන් දැනට පූර්ණව නිදහස්ව සිටින (තනිකඩ අනවශ්‍යයි) චරිතවත් දරුවන්ට සලකන කරුණාවන්ත නීරෝගී බෞද්ධ සේවිකාවන් වහාම බඳවා ගැනේ. සේවා පලපුරුද්ද අවශ්‍ය නොවේ. වැඩ එතරම් නොමැති අතර නිදහසේ සේවය කල හැකිය.
වැටුප මාසිකව රු. තිස් දහසයි. (30,000/-)
අනුශාසක හිමිපාණන් විමසන්න.
071-866 0508 / 076-523 1641

සංවර්ධිත බැංකු ඇබෑර්තු
★ සියලුම ප්‍රාදේශීය ශාඛා ආවරණය කරමින් බැංකු ක්ෂේත්‍රයේ පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.
වැටුප 40,000/-
18/40 ගැ/පි
(මෑන් පවර් නොවේ)
0716 434 278 | 0703 346 072
0774 024 155 | 0716 434 288
0702 231 694 | 0761 125 624

ආයෝජකයෙකු වී සැහැල්ලුවෙන් දියුණු වන්න...
දිවයිනේ ප්‍රමුඛතම ආයතනයක නිවාස ව්‍යාපෘති සඳහා ආයෝජනය කරන්න... 42% දක්වා වාර්ශික ලාභාංශ.
මාසිකව ලබාගත හැක

ආයෝජන මුදල	මසකට ලාභය
රු.ලක්ෂ 10	රු.30,000
රු.ලක්ෂ 50	රු.175,000
රු.ලක්ෂ 100	රු.420,000

මුදලට නියමිත වටිනාකමක් සමඟින් විශ්වාසනීය හා සුහදශීලී සේවය
අපගේ නිවාස ව්‍යාපෘතියේ මුදල් ආයෝජනය කර මෙම මහඟු අවස්ථාව ලබාගන්න.
GPH පුද්ගලික සමාගම
අමතන්න : 0777954763 / 0112921386
නො.123, නුවර පාර, කිරිබත්ගොඩ.

දිවයින පුරා නිවෙස් වල නැවතී වැඩ කිරීමට කැමති ගෘහසේවිකාවන් අවශ්‍යයි.
ඉවුම් පිහුම්, පිරිසිදු කිරීම්, දරුවන් බලාගැනීමට හා මහළු හෝ රෝගී වූ අය බලාගැනීමට කැමති අය අමතන්න.

වැටුප රුපියල් 35,000 - 40,000
ආහාර ඇතුළු සියලු පහසුකම් නොමිලේ
072 945 9247

මෙවර සාමාන්‍ය පෙළ / උසස් පෙළ / ශිෂ්‍යත්වය ඇතුළු සියලුම විභාගවලින්
විශිෂ්ට ජයග්‍රහණ ලබා ගැනීම සඳහා පැමිණ හමුවන්න.
නැතහොත් ලිපියක් මගින් විමසන්න.
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුයි.)

ප්‍රේම සබඳතා බිඳවැටෙන්නේ ඇයි?
ව්‍යාපාර/ගේ දොර පාළු වී යන්නේ ඇයි?
අයුතු සම්බන්ධතා නිසා පවුල් අවුල් වන්නේ ඇයි?
මෙන්න!
එයින් මිදෙන්න නිසි මඟක්...

අයුතු සම්බන්ධතා නැවතීම
* නිවාස ආරක්ෂා
* නඩුහබ දිනීමට
* දරුඵල ලබීමට
මත්කුඩු සහ සුරාව
* රැකියා ලබා ගැනීමට
* සියලු විභාය සඳහා
* නොවිකිනෙන ඉඩම් විකිණීමට
*විවාහ පමා අයට
*හැරගිය අය ගෙන්වීම
*අසාර්ථක ව්‍යාපාර දියුණුවට

මාතර වෙද හාමුදුරුවෝ
ඔබ කුමන හෝ මත්ද්‍රව්‍යකට
ඇබ්බැහි වූ අයෙක් ද?
එසේ නම් ඉන් මිදීමට අමතන්න.
වරු තුනෙන් ප්‍රතිඵල පැමිණ හමුවන්න
අමතන්න 077 362 77 14

හමුවීම
බදාදා, සෙනසුරාදා
පෙ.ව. 8.00 සිට
ප.ව. 3.00 දක්වා

කුරුණෑගල, පොතුහැර
චන්ද්‍රසේල පිරිවෙන්
පුරාණ විහාරයේදී

ශාස්ත්‍රවේදී පණ්ඩිත **මාතර වෙද හාමුදුරුවෝ**
භාරකාරතුමා, ජනසෙත වෙද මැදුර, චන්ද්‍රසේල පිරිවෙන් විහාරය, කොළඹ පාර, පොතුහැර, කුරුණෑගල, පොතුහැර චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී

දැන්වීමකි



ලබා දී ඇති මෙම සුවිශේෂී ප්‍රතිකාර මධ්‍යස්ථානය ලෝකයේ අති නවීනතම පහසුකම් සහ විශේෂඥ සේවාවන් රැසක් සමගින් නිර්මාණය කර තිබීමද සුවිශේෂ කරුණකි. විශේෂයෙන් මානසික උපකාර සහ උපදේශන, ප්‍රතිකාර සම්බන්ධයෙන් දැනුවත් කිරීම වගේම මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් පවතින නීති ක්‍රමවේද සම්බන්ධයෙන් ඔබව දැනුවත් කිරීම සඳහා සුවිශේෂ නිලධාරීන් රැසක්ම මෙම ප්‍රතිකාර මධ්‍යස්ථානය තුළ පූර්ණකාලීන සේවාවේ නිරතව ඇත. මෙහිදී උපදේශන සේවා, ස්කෑන් පරීක්ෂණ, IUI/IUTPI/IPI පරීක්ෂණ, කලල තැන්පත් කිරීම ඇතුලු සියලුම සැත්කම් කාර්යයන් වෛද්‍ය හෙළරුවන් පහන් කුමාර මහතාගේ මූලිකත්වයෙන් සිදුකිරීමද සුවිශේෂ වේ.

දරුවන් අපේක්ෂාවෙන් සිටින ඔබට තමාගේම දරුවෙකු සිය කුස තුළ හෝ



පැමිණෙන්නේ කියන හැඟීමත් ඉවත් කරනවා. මීට අමතරව මේ මධ්‍යස්ථානයේ බුදුරජාණන් වහන්සේගේ සහ අංගුලිමාල මහ රහතන් වහන්සේගේ ධාතු තැන්පත් කර අපි දිනපතා පූජාවන් පවා පවත්වනවා. ඒ ආශිර්වාදයත් එක්කම තමයි මේ



ස්ථානයට සියලු දෙනාම පැමිණෙන්නේ. මේ නිසා ආධ්‍යාත්මික පරිසරයක් සැකසීම තුළින් අපි ඒ අයගේ මානසික තත්වය නිරවුල් කරනවා වගේම ඒයට ශක්තියක් ලබාදීමටත් කටයුතු කරනවා.

ඒ වගේම මෙම අවකාශය තුළ තමන්ගේ කැමැත්ත අනුව චිත්‍රපට, කියවීමට පොත්පත් වගේම බිලියඩ් වැනි ක්‍රීඩා පවා කිරීමේ අවකාශය සකසා තිබෙනවා. මීට අමතරව සෑම සති අන්තයේ දිනකම චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම වගේම චෙලෝ සහ පියානෝ සංගීත සංධ්‍යාවන් සංවිධානය කරනවා. එයින් වෙනස්ම අත්දැකීමක් ලබාදෙමින් සෑම දෙනාටම අලුත් අත්දැකීමක් ලබාදෙනවා.''

VIP පහසුකම්

සමාජයේ සුවිශේෂී අය වෙනුවෙන් මෙම ප්‍රතිකාර මධ්‍යස්ථානය තුළින් ලබා දී ඇති සුවිශේෂ පැකේජයක් ලෙස මෙය හඳුන්වා දිය හැකිය. මෙහිදී රහස්‍යභාවය උපරිම අයුරින් සුරකිමින් වාහනය නැවැතුම් ස්ථානයේ සිට වෙනම විදුලි සෝපාන ඔස්සේ විශේෂ



VIP ප්‍රතිකාර කාමර වෙත පිවිසීමේ හැකියාව ඇත. අති නවීන පහසුකම් සහිතව නිර්මාණය කර ඇති මෙම කාමර, සියලුම ප්‍රතිකාර සහ පරීක්ෂණ පහසුකම් සහිතව නිර්මාණය කර තිබීමත් විශේෂත්වයකි. තවද ඔබේ වටිනා කාලයට සුරුකෙමින් විනාඩි 15ක් වැනි කෙටි කාලයක් තුළ සියලුම ප්‍රතිකාර කාර්යයන් සිදුකර ගැනීමේ පසුබිම ද මෙහි සකසා තිබීම සුවිශේෂ කරුණකි.

විශේෂඥ සේවාවන්

මදසරුබව යනු රෝගයක් නොවන බව ඔබට මෙම ස්ථානය වෙත පිවිසීමෙන් පසක් කර ගත හැකි වන්නේ එම ස්ථානයෙන් ලැබූ සාර්ථක ප්‍රතිඵලය දෑසින් දැක ගැනීමෙනි. අද වන විට 8500කට වැඩි දෙමව්පියන්ගේ දරු දුක නිවාලමින් දරුවන් එම ප්‍රමාණයටත් වැඩියෙන් මෙලොවට ඒමට අවස්ථාව

වෙනත් අයෙකුගේ ගැබක හෝ අති නවීන තාක්ෂණය ඔස්සේ කලල තැන්පත් කිරීම වැනි ඔබට ගැළපෙන ක්‍රමවේදයක් ඔස්සේ බිහිකළ හැකි අතර, ඒ සඳහා වන සාර්ථක දායක ශුක්‍රාණු සහ ඩිම්බ මෙන්ම කලල බැංකු ද ස්ථාපනය කර ඇත. විනිවිද බවින් යුතුව නීත්‍යානුකූල අයුරින් ඔබට ඔබේ දරු සිහිනය යථාර්ථකයක් කිරීමට අවශ්‍ය පසුබිම් මෙම ආයතනය මගින් සලසා දී ඇති අතර, ඒ සඳහා වන පූර්ණ මගපෙන්වීමට මෙම ආයතනය මගින් සපයනු ලබයි.

ජාත්‍යන්තර වශයෙන්ද ඉමහත් කීර්තියක් අත්පත් කරගෙන ඇති මෙම Wish Fertility ප්‍රතිකාර මධ්‍යස්ථානය ලංකාවට කීර්තියක් අත්කර දෙමින්

ලාංකීය ඉතිහාසයේ පළමු වරට ලෝක මඳසරුභාවය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර සම්මේලනය මෙම ප්‍රතිකාර මධ්‍යස්ථානයේ පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙහි ඇති අති නවීන සම්මන්ත්‍රණශාලා පහසුකම් සහ ශල්‍යාගාර පහසුකම් මෙවැනි සම්මේලනයක් පැවැත්වීමට මනා පරිසරයක් නිර්මාණය කර දී ඇති අතර, එවැනි ජාත්‍යන්තර මට්ටමේ ප්‍රතිකාර මධ්‍යස්ථානයක ඉතා ආකර්ෂණීය මිල ගණන් යටතේ ප්‍රතිකාර ලබා ගැනීමට ඔබටද අවස්ථාව හිමිව තිබීමද සැනසුම්දායක තත්ත්වයකි.

වෛද්‍ය හෙළරුවන් පහන් කුමාර මහතා
M.B.B.S. Sri Lanka
M.D. Gyne & Obs Infertility China
PG. Dip Andrology (Monash-OUSL)
Master of Clinical Embryology (Monash Australia)
Infertility Physician & Clinical Embryologist
SLMC Reg (20800
Chairmen in Wish Fertility (Pvt) Ltd
ක්ෂණික ඇමතුම් සඳහා :
0777 91 09 10 / 0771 86 21 17

HOME
App 7ක් එක්ක දවස් 7ක්ම
ගෙදර WiFi එකටම ඇල්ලා ඉන්න
හඳුන්වාදෙන
7xFun
Add-on
රු.195 කට
GB 20 ක්ම
ගෙදර හැමෝටම Fun එකේ ඉන්න
www.sltmobitel.lk
MySLT App/PORTAL ◂DATA ADD ON▸
SLTMOBITEL

කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.